ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**(MMWD)**

යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

රාජගිරිය, ඔබේසේකරපුර, අරුණෝදය මාවතේ පවුල් **38** ක් නාගරික සංවර්ධන අධිකාරියට අයත් තට්ටු ගොඩනැගිල්ලක නැවත පදිංචි කරවීම

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව **(AIIB)**

වෙත

නාගරික සංවර්ධන අධිකාරිය

**2019** ඔක්තෝබර්

## *යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම සඳහා වන සටහන:*

ඔබේසේකර පුර අරුණෝදය මාවතේ පවුල් 38 ක් නැවත පදිංචි කිරීමේ ක්‍රියා සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකසා 2018 ඔක්තෝබර් මස (එහි අනුවාදය මෙහි ඇත) පළ කරන ලදි. යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම පහත දක්වා ඇති අතර, එහි වර්ෂ 2019 දී එක්රැස් කරගත් අතිරේක සමාජ-ආර්ථික තොරතුරු පිළිබඳ සැලකිල්ලට ගැනීම සහ පවුල් 38 ක් දැනටමත් පදිංචි කර ඇති නාගරික සංවර්ධන අධිකාරියේ හිමිකාරීත්වය සහිත මහල් නිවාස සංකීර්ණවල වර්තමාන තත්ත්වය පිළිබලදව කරුණු දක්වා ඇත. ව්‍යාපෘතියේ බලපෑමට තතුවූ ගෘහ ඒකක මත අතිරේක බලපෑම් හඳුනාගෙන, එම බලපෑම් අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග යෝජනා කර තිබේ.

2019 ඔක්තෝබර් මස අවසානය දක්වා වන දත්ත යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත්ව තිබේ. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ගතික වන හෙයින් සහ එහි තත්වය නිරන්තරයෙන් කෙටි කාලයක් තුළ වෙනස්වීමට භාජනය වන හෙයින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැසුම සඳහා යෝජිත වෙනස් කිරීම්, නැවත පදිංචි කිරීමේ සැලසුම් රාමුව සමඟ අනුගත වන ලෙස සකසා ඇත. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ පාරිසරික සහ සමාජීය රාමුව අනුගතව ව්‍යාපෘතියේ බලපෑමට තතු වූ පවුල්වල දියුණුව හෝ අවම වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීම කරලීම මෙම අතිරේක ක්‍රියාමාර්ග මගින් සිදු වේ. යෝජිත වැදගත් වෙනස් කිරීම් සහ එකී ප්‍රතිශෝධනය සඳහා වන තාර්කිකත්වය සහත වගුවේ දක්වා ඇත.

| නැවත පදිංචි කිරීමේ මුල් ක්‍රියාකාරි සැලැස්ම (2018 ඔක්තෝබර්) | යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ මුල් ක්‍රියාකාරි සැලැස්ම (2019 නොවැම්බර්) | යාවත්කාලීන කිරීම සඳහා තුඩු දුන් තාර්කිකත්වය |
|---|---|---|
| හිමිකම් න්‍යාසය සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මේ අයවැය, අතිරේක සමාජ - ආර්ථික දත්තවලට අනුගතව යාවත්කාලීන කරන ලදි. | | |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන, කාන්තාවන් සඳහා කාමර සහ ප්‍රාථමික පාසල් ලබාදීම | යෝජිත ක්‍රියාකාරකම් සිදුකිරීමට ප්‍රජා ශාලා යොදාගත හැක | සියපත් සෙවනේ දැනටමත් ඉදිකර ඇති මහල් නිවාසවලට වෙනස්කම් සිදු කිරීම ප්‍රායෝගික නොවේ. |
| අතිරේක නිවාස ඒකකයක පිරිවැය රුපියල් මිලියන 7 ක් වේ. | නිවාස සංවර්ධන අධිකාරියේ දැනට පවත්නා ගෙවීම් ක්‍රමවේදය අනුව අතිරේක මහල් නිවාස ඒකකයක පිරිවැය තීරණය කෙරෙනු ඇත. | පැහැදිලි කිරීම RPF සමඟ අනුගත වේ. |
| නැවත පදිංචි කිරීමේ | ගාස්තුව අතහැර දමා | ව්‍යාපෘතියේ බලපෑමට |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතියේ බලපෑමට තතු වූ ගෘහ ඒකක, සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව වෙත ඉහළ නඩත්තු ගාස්තුවක් ගෙවීම | ඇත. | තතු වූ ගෘහ ඒකකයන්ගේ ගෙවීමට ඇති ධාරිතාවට අනුගතව වෙනස්කම් සිදු කර ඇත. |

සංශෝධවල විනිවිදභාවය තහවුරු වන ලෙස සිදු කළ වෙනස්කම් දක්වමින්, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මේ යාවත්කාලීන කරන ලද අනුවාදය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිවල පළවූ අනුවාදය වෙනුවට පළ කර ඇති අතර, ඉදිරියේ දී එය වර්තමාන සැලැස්ම බවට පත් වේ. ව්‍යාපෘතියේ බලපෑමට තතු වූ ගෘහ ඒකක වෙත යෝජිත වෙනස්කම් සුදුසු මාර්ගයකින් දැනුම් දීමට සහ යාවත්කාලීන කරන ලද අනුවාදයේ දෘඩ පිටපත් සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදය කෙරෙනු ඇත. දැනට පවතින දුක්ගැනවිලි සඳහා පිළියම් යෙදීමේ ක්‍රමවේදය එලෙසම පවතිනු ඇති අතර, නැවත පදිංචි කිරීමේ නව ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පැමිණිලි සහ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සඳහා භාවිතා කළ හැක.

# පටුන


වගු ලැයිස්තුව ....... ix

රූප සටහන් ලැයිස්තුව ....... ix

කෙටි යෙදුම් මාලාව ....... x

විධායක සාරාංශය ....... xi

පළමුවන පරිච්ඡේදය ....... 18

හැඳින්වීම ....... 18

1.1. ....... පිහිටීම ....... **19**

1.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුමක (RAP)අවශ්‍යතාවය....... **20**

1.3 ....... භාවිතා කෙරෙන ක්‍රමවේදය ....... **22**

දෙවන පරිච්ඡේදය ....... 25

සමාජ ආර්ථික පැතිකඩ ....... 25

තුන්වන පරිච්ඡේදය ....... 45

අදහස් විමසීම සහ තොරතුරු ප්‍රචාරණය....... 45

3.1: ඔබේසේකරපුර අරුණෝදය මාවතේ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම .................45
3.2: බලපෑම් ලත් පුද්ගලයන් සමහරකගේ දැක්ම ....................................................51
3.3: නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනාවරණය කිරීම ..........................55
හතරවන පරිච්ඡේදය ........................................................................................ 56
නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුව ....................................................................... 56
4.1: ඉඩම් අත්පත් කරගැනීමේ පනත (LAA) ............................................................56
4.2: රාජ්‍ය දේපල ......................................................................................................56
4.3: වන්දි ලබාදීමේ ප්‍රතිපත්තිය...................................................................................56
4.4: ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය *(NIRP)*..............57
4.5: අවසන් දිනය ......................................................................................................57
පස්වන පරිච්ඡේදය........................................................................................... 58
යෝග්‍යතාව, හිමිකම් හා සහාය........................................................................... 58
5.1: සහාධිපත්‍ය පරිශ්‍රයන්හි ඇති පොදු පහසුකම් ...................................................59
5.2: පවුල් කිහිපයක් ජීවත් වන නිවාස සඳහා අමතර ඒකකයක් වෙන් කිරීම ......63
5.3: වෙනත් ස්ථානයකට ගෙන යාමට පෙර ලබා දෙන සහාය...............................64
වෙනත් ස්ථානයකට ගෙන යාමට පෙර තෝරාගත් සහාධිපත්‍යයන්හි බද්ධ නිවාසවල පදිංචි කිරීම සඳහා හඳුනා ගත් පවුල්වලට සහාය ලබා දීම පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පහත කාර්යයන් සිදු කරනු ලැබේ:........64
සමාජ සේවා නිලධාරී/ ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය ..........................65
අවතැන් වූ ජනතාව ඔවුන්ගේ නව නිවාස ඒකක වෙත ගෙන යාමෙන් පසුව ඔවුන් නව පරිසරයට අනුගත වීම හා ඔවුන්ට මුහුණ පෑමට සිදු වන ගැටළු පිළිබඳ මාස කිහිපයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අධීක්ෂණය කරනු ලැබේ. මන්ද යත් ඔවුන්ගෙන් බොහෝමයකට උස් වූ ගොඩනැගිලිවල විදුලි සෝපාන හා ප්‍රජා ශාලාවන් වැනි පොදු සම්පත් බෙදාහදා ගනිමින් ජීවත් වීම හුරු පුරුදු දෙයක් නොවන බැවිණි. .......................................................................................................67
නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂගේ මග පෙන්වීම යටතේ සමාජීය නිලධාරී, ප්‍රජා සංවර්ධන නිලධාරී, ක්ෂේත්‍ර කළමනාකරු..........................................................67
සහාධිපත්‍යය ජීවත් වීමට හිතකර පරිසරයක් බවට පත් කිරීම සඳහා වෙනත් ස්ථානයකට ගෙන යන ලද ජනතාව අතර සාමූහිකත්වය ඇති කිරීම පිණිස පහත කමිටු ස්ථාපිත කරනු ලැබේ. ..................................................................................67
i. කාන්තා සංවර්ධන කමිටුව ..............................................................................67
ii. පාරිසරික කමිටුව.............................................................................................67
iii. ප්‍රජා සුබසාධන කමිටුව ..................................................................................67

iv. සකසුරුවම් හා සමූපකාර කමිටුව**........................................................................67**

v. සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව (CMC)**........................................................67**

නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂගේ මග පෙන්වීම යටතේ සමාජීය නිලධාරී, ප්‍රජා සංවර්ධන නිලධාරී, ක්ෂේත්‍ර කළමනාකරු නීතිමය ගැටළු විසඳුණු පසුව . සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව පහිටුවනු ලැබේ.**............................................67**

සමාජ සේවා නිලධාරී හා සැලසුම් නිලධාරී නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය **.......................67**

තම දරුවන් නව පදිංචි ස්ථානවල පාසල්වලට ඇතුළත් කිරීම සඳහා බලපෑමට ලක් වූ ජනතාවට සහාය වීම**..............................................................................................68**

සමාජ සේවා නිලධාරී - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය **.........................................................68**

මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම **..**Error! Bookmark not defined.

ප්‍රජා සංවර්ධන නිලධාරී/ උපදේශක හා ඔහුගේ කාර්ය මණ්ඩලය විසින් පවුල් පදිංචි කළ සහාධිපත්‍යවල දැනට මෙම වැඩසටහන් පැවැත්වෙන අතර නව පවුල් පදිංචි කරන ස්ථාන වෙත ද ව්‍යාප්ත කළ හැකිය. **......................................................68**

ක්ෂේත්‍රය තුළ කාර්යාල ස්ථාපිත කරන ලද අතර දිවා සුරැකුම් මධ්‍යස්ථා ක්‍රියාත්මක වේ, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීමය වශයෙන් පුහුණු කරවූ ගුරුවරුන් 50ක් සේවයේ යොදවා ඇත.**..................................................68**

දැනට මෙම මෙහෙයුමෙහි පිරිවැය ජන හිතකාමීන් විසින් මූල්‍යනය කෙරෙන බැවින් හා විනිවිදභාවය පවත්වා ගැනීම සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වීම පිණිස වියදම් හා රිසිට්පත් විගණනයට යටත් වන බැවින් ආසියානු යටිතළ පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් ලබා දෙන ණයෙහි 3 වන සංරචකය යටතේ ප්‍රමාණවත් කාල සීමාවක් පුරා මෙම ක්‍රියාකාරකම් සිදු කළ හැකිය.**.........68**

තරුණයන් හා කාන්තාවන් සඳහා ස්වයං රැකියා පුහුණුව **....................................69**

නැවත පදිංචි කළ පුද්ගලයන්, විශේෂයෙන් ළමුන් හා මව්වරුන්ගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම සඳහා පෝෂණ වැඩසටහන් **.............................................69**

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**......69**

විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා සෞන්දර්ය විෂයන් සඳහා අමතර පංති පැවැත්වීම**.69**

පාසල් යාම නවත්වා ඇති ළමුන් සඳහා සහාය ලබා දීම**...........................................69**

vii.**..............** ඇස් කණ්ණාඩි අවශ්‍ය පුද්ගලයන් සඳහා ඒවා නොමිලේ ලබා දීම පිණිස සෞඛ්‍ය සායන පැවැත්වීම **.............................................** Error! Bookmark not defined.

5.5. සත්කාරක ජනගහනය **..........................................................................70**

5.6: නිවාස ඒකක ලාභීන්ගේ බැඳීම් (බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ තොරතුරු සඳහා හා ඔවුන්ගේ සහයෝගය ඉල්ලා සිටීම සඳහා)**...............................................71**

හයවන පරිච්ඡේදය ........ 72
ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ........ 72
6.1: ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පැතිකඩ ........ **72**
6.2: ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළව සිදු වන බලපෑම් ........ **72**
6.3: නෛතික ආරක්ෂාව ........ **74**
6.4: ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යභාරය ........ **74**
6.5 දැනුවත් කිරීමේ වැඩසටහන් ........ **77**
6.1 වගුව: දැනුවත් කිරීමේ වැඩසටහන් ........ **77**
බලපෑමට ලක් වූ ඇතැම් පුද්ගලයන්ට බද්ධ නිවාස ඒකක සඳහා සැපයෙන පහසුකම් හුරු පුරුදු නොවන බැවින් බද්ධ නිවාසවල දී සැපයෙන පහසුකම් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ........ **77**
සමාජ සේවා නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ........ **77**
සැවොම එක්ව භාවිතා කරන පරිසරයක් තුළ පොදු පහසුකම් හා පවිත්‍රතාවය පවත්ගෙන යාම පිළිබඳ පාඩම් ........ **77**
සමාජ සේවා නිලධාරී හා ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ........ **77**
සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුවත්භාවය ........ **77**
ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සහාය ඇතිව සැලසුම් නිලධාරී - ක්ෂේත්‍ර කළමනාකරු ........ **77**
සත්කාරක ප්‍රජාව සමග සුහදශීලී සබඳතාවන් පවත්වා ගැනීම කෙරෙහි දිරිමත් කිරීම පිළිබඳ පුහුණුව ........ **77**
සමාජ සේවා නිලධාරී හා ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ........ **77**
සහාධිපත්‍ය ආසන්නයේ ගැවසෙන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා අනිසි පුද්ගලයන් පිළිබඳ අවධියෙන් සිටීම සඳහා ආරක්ෂාව ........ **77**
එවැනි කරුණු පිළිබඳ තොරතුර ලද විට පොලිසියේ සහාය ඇතිව ක්ෂේත්‍ර කළමනාකරු ........ **77**
හත්වන පරිච්ඡේදය ........ 78
දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය (GRM) ........ 78
අටවන පරිච්ඡේදය ........ 92
ආදායම් යළි යථා තත්වයට පත් කිරීමේ උපායමාර්ග ........ 92
8.1 අපේක්ෂිත හානි ........ **92**
8.2 අවදානමට ලක් විය හැකි පවුල් ........ **92**
8.3 ආදායම යථා තත්වයට පත් කිරීමේ වැඩසටහන් සඳහා වන උපායමාර්ග ........ **93**

8.4: ආදායම් ප්‍රතිසාධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම ....................................................................................................**93**

8.5 ආදායම ප්‍රතිසාධන වැඩසටහනට සම්බන්ධ විය හැකි ආයතන ......................**93**

නව වන පරිච්ඡේදය........................................................................................................ 95

ආයතනික රාමුව................................................................................................................ 95

9.1: නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනික කටයුතු ........................................................................................**96**

ක්‍රියාකාරකම...........................................................................................................**96**

ක්‍රියාව.......................................................................................................................**96**

නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියෙහි දක්වා ඇති නිර්ණායක මත පදනම්ව වෙනත් ස්ථානයකට ගෙන යා යුතු පවුල් හඳුනා ගැනීම ........................................................**96**

තොරතුරු බෙදාහැරීම හා යාවත්කාලීන කිරීම සහ පාර්ශවකරුවන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම. .......................................................................................................................**96**

සමාජ සේවා නිලධාරී, ඉඩම් නිලධාරී හා උපදේශකන්..............................................**96**

- නාගරික සංවර්ධන අධිකාරිය.............................................................................**96**

මහජන තොරතුරු මධ්‍යස්ථානය (PIC) ස්ථාපිත කිරීම හා තොරතුරු සපයන ලේඛන ඇතුළු දේ සකස් කිරීම..............................................................................**96**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අංශ ස්ථාපිත කිරීම ..................................................**97**

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................**97**

හිමිකම් නොමැති බලපෑමට ලක් වූ අවතැන් වූ ජනතාව වෙත විකල්ප වාසස්ථාන වෙන් කර දීම .............................................................................................................**97**

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................**97**

බලපෑමට ලක් වූ ජනතාවහට බලපෑමට ලක් වූ පරිශ්‍රයන්ගෙන් සම්පූර්ණයෙන් ඉවත් වීම සඳහා ප්‍රමාණවත් කාලයක් (අවම වශයෙන් සති 2ක්) ලබා දීම.............**97**

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................**97**

නව නිවාස වෙත යාම සඳහා බලපෑමට ලක් වූ ජනතාවහට උපකාර කිරීම. ........**97**

පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සමාජ සේවා කාර්ය මණ්ඩලයෙහි සහාය ඇතිව ව්‍යාපෘති අධ්‍යක්ෂ .......................................................................................................................**97**

සත්කාරක ප්‍රජාව සමග අනුකලනය වීම සඳහා බලපෑමට ලක් වූ ජනතාවහට සහාය ලබා දීම. හුරු කරවීමේ ක්‍රියාකාරකමක් ලෙස සංවාද සඳහා නැවත පදිංචි

කිරීමට නියමිත පවුල්වල නියෝජිතයන් සත්කාරක ප්‍රජාව සමග මුණ ගැසීමට සැලැස්වීම.......................................................................................................98

සමාජ සේවා කාර්ය මණ්ඩලය – ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය ........................................98

ආදායම් ප්‍රතිසාධනය පිළිබඳ කටයුතු කිරීම ..........................................................98

සැලසුම් නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................98

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි විස්තර කර ඇති පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ගැටළු පිළිබඳ කටයුතු කිරීම...................................................98

සැලසුම් නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................98

බලපෑමට ලක් වූ ජනතාවහට ඔවුනේග් දරුවන් ඔවුන් රැගෙන යාමට නියමිත ස්ථානවල පිහිටි පාසල්වලට ඇතුළත් කිරීමේ දී ගැටළුවලට මුහුණ පෑමට සිදු වුවහොත් ඒ සඳහා උපකාර කිරීම. ..............................................................................98

දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ කමිටු ස්ථාපිත කිරීම හා කටයුතු අධීක්ෂණය කිරීම ...........................................................................................................98

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................98

කාන්තාවන් හා දිළිඳු පුද්ගලයන ඇතුළු අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සඳහා සහාය ලබා දීම ...........................................................................................99

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................99

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය...............................................................99

තොරතුරු තාක්ෂණ නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය ........................................100

අනාගත නැවත පදිංචි කිරීමේ වැඩසටහන් සඳහා පාඩම් ඉගෙන ගැනීම. එසේම තවදුරටත් වැඩි දියුණු කළ හැකි කරුණු හා දෝෂ නැවත සිදු වීම වැළැක්වීම සඳහා අවධානය යොමු කළ යුතු අවභාවිතාවන්. ...............................................................100

අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය ........................................100

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය.............................................................100

ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය.............................................................100

දස වන පරිච්ඡේදය ...........................................................................................104

ක්‍රියාත්මක කිරීමේ සැලසුම ..... 104
එකොළොස් වන පරිච්ඡේදය ..... 115
නැවත පදිංචි කිරීමේ අයවැය ..... 115
දොළොස්වන පරිච්ඡේදය ..... 117
අධීක්ෂණය, ඇගයීම හා වාර්තාකරණය ..... 117
12.1 අභ්‍යන්තර අධීක්ෂණය **..... 117**
12.2: අභ්‍යන්තර අධීක්ෂණය සඳහා අවශ්‍ය මෙවලම් පහත පරිදි වේ: **..... 119**
12.3: බාහිර අධීක්ෂණය **..... 119**
12.4: බාහිර අධීක්ෂණය මගින් පහත දේ අපේක්ෂා කෙරේ: **..... 120**
12.5: අධීක්ෂණ දර්ශක **..... 121**
12.6 ඇගයුම් සැලැස්ම **..... 121**
12.7 වාර්තාකරණයේ අවශ්‍යතා **..... 125**
12.8 වාර්තාකරණයේ වගකීම් **..... 126**
12.9 වාර්තා කරනු ලබන කරුණු: **..... 127**

# වගු ලැයිස්තුව

**.**වගුව 3. 1: අදහස් විමසීමේ රැස්වීමේදී මතු කරන ලද ගැටළු ..... 45
වගුව 12.1: අධීක්ෂණ දර්ශක
68
**12. 1 වගුව:** අධීක්ෂණ දර්ශක ..... 121

# රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1: ඔබේසේකරපුර, අරුණෝදය මාවත සිතියම සහ ගෙනයාමට යෝජිත ස්ථානය ..... 20
රූප සටහන 2: වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල් ජීවත් වන ..... 49
රූප සටහන 3: 2018 10.11 දින ඔබේසේකරපුර පැවැත්වූ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම ..... 50

# කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| AIIB - | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| AP | බලපෑම් ලත් පුද්ගලයා |
| APD | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| CMC | සහාධිපත්‍ය කළමනාකරණ කමිටුව |
| DP &CS | පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| GCE | අධ්‍යයන පොදු සහතික පත්‍ර |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GRM | දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය |
| GRC | දුක්ගැනවිලි විසඳීමේ කමිටුව |
| HH | ගෘහ ඒකක |
| HHH | ගෘහමූලිකයා |
| IRP | ආදායම් ප්‍රතිසාධන වැඩසටහන |
| LARS | ඉඩම් අත්පත්කරගැනීමේ හා නැවතපදිංචි කරවීමේ සමීක්ෂණය (වත්කම් ඉන්වෙන්ට්‍රි සමීක්ෂණය) |
| LFPR | ශ්‍රම බල සහභාගිත්වතා අනුපාතය |
| MCUDP | කොළඹ අග නාගරික සංවර්ධන ව්‍යාපෘතිය |
| MMWD | - මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| MOH | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි |
| NCPA | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය |
| NIRP | ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය |
| PAP | ව්‍යාපෘතියෙන් බලපෑම් ලත් පුද්ගලයන් |
| PAH | ව්‍යාපෘතියෙන් බලපෑම් ලත් නිවාස ඒකක |
| PD | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PIC | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය |
| PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| RAP | නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම |
| RFP | නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව |

| | |
|---|---|
| SES | සමාජ ආර්ථික සමීක්ෂණය |
| SSD | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය. |
| UN | එක්සත් ජාතීන් |
| URP | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය |
| US$ | එක්සත් ජනපද ඩොලර් |
| WDC | කාන්තා සංවර්ධන කමිටුව |

# විධායක සාරාංශය

## හැඳින්වීම

කොළඹ යනු ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය සහ අගනගරය වෙයි. සංඛ්‍යාලේඛන අනුව, රජයට හිමි ඉඩම්වල තැනූ අවම පහසුකම් පවතින ජනාවාසවල පවුල් 50,000 කට අධික ප්‍රමාණයක් ජීවත් වෙයි. කොළඹ, 800,000 ක පමණ ජනතාවකට නිවහන් වෙන අතර විවිධ අරමුණු සඳහා මිලියනයක පමණ ජනතාවක් දෛනිකව කොළඹට පැමිණෙයි. නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ රජය විසින් පවුල් 5,500 ක් පමණ තට්ටු ගොඩනැගිලිවල නැවත පදිංචි කිරීම පිණිස ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් මූල්‍ය සහය අපේක්ෂා කර ඇත. මෙම පවුල් නැවත පදිංචි කිරීමෙන් පසු හිස්වෙන ඉඩම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සඳහා භාවිතා කෙරෙනු ඇත. ව්‍යාපෘතියේ පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 280 ක් වනු ඇති අතර ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් ඉල්ලා ඇත.

ඔබේසේකරපුර අරුණෝදය මාවතේ පවුල් 38 ක් ජීවත් වන ඉඩම, ව්‍යාපෘතියේ 1 වන සංරචකය යටතේ ඉදිකිරීමට අපේක්ෂා කරන තට්ටු නිවාස සංකීර්ණය ඉදිකිරීම සඳහා අවශ්‍ය වේ.

## පිහිටීම

ඔබේසේකරපුර පිහිටා ඇත්තේ කෝට්ටේ- ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභාව සහ කෝට්ටේ මැතිවරණ කොට්ඨාසයේ කොටසක පරිපාලන සීමාවන් ඇතුළතය. මෙහි ජනවාර්ගික සංයුතිය ප්‍රධාන වශයෙන් සිංහල ජනයාගෙන් සමන්විත වන අතර ගෘහ මූලිකයන් 38 දෙනාගෙන් 21 ක් ඔබේසේකරපුර ප්‍රදේශයෙන් පිටත ඉපදී පසුව වර්තමාන ස්ථානයට සංක්‍රමණය වූවෝ වෙති.

## නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මේ (RAP) අරමුණු

ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව, නැවත පදිංචි කිරීම මගින් පවුල් *20* කට වඩා වැඩි ප්‍රමාණයකට බලපෑම් ඇති වන්නේ නම් හෝ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ ආරක්ෂණයන් අනුව පුද්ගලයන් *200* කට අධික ප්‍රමාණයකට බලපෑම් ඇතිවන්නේ නම් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් අවශ්‍ය කෙරේ. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් යනු බලපෑම් ලත් සහ අවතැන්වූ ජනතාව නැවත පදිංචි වීමෙන් පසු තම ජීවන තත්වය පවත්වා ගැනීමේදී හෝ වැඩි දියුණු කරගැනීමේදී මතුවන ගැටළු නිරාකරණය කිරීම සඳහා වන මෙවලමයි.

## භාවිතා කෙරෙන ක්‍රමවේදය

නැවත පදිංචි කිරීමේ විශේෂඥයින් සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ සාධාරණීකරණය විස්තර කිරීමට සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමට බලපෑම් ලබන පුද්ගලයන් සඳහා මූලික රැස්වීමක් පවත්වන ලදී. මෙමගින් ඔවුන්ට ලැබෙන වාසි සහ ප්‍රතිලාභ මෙහිදී අවධාරණය කෙරිණි. නැවත පදිංචි කිරීමේ විශේෂඥයින්ගේ මගපෙන්වීම මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ ඒකක කාර්ය මණ්ඩලය විසින් සකසන ලද ප්‍රශ්නාවලියක් හරහා සමාජ ආර්ථික සහ ජනවිකාසමය දත්ත එක් රැස් කරගන්නා ලදී.

## සමාජ ආර්ථික පැතිකඩ

බලපෑම් ලබන පවුල් 38 මුළු ජනගහනය 140 ක් වන අතර එහි පුරුෂයන් 67 ක් ද කාන්තාවන් 73 ක් ද වෙයි. ගෘහ මූලික පුරුෂයින් 18 ක්ද ගෘහ මූලික කාන්තාවන්

ගණන 20 ක්ද වේ. මෙහි ජනවාර්ගික සංයුතිය, සිංහල ජනතාව 114 කින්, දෙමළ ජනතාව 18 කින් සහ මුස්ලිම් ජනතාව 8 කින් සමන්විත වෙයි. ආගම අනුව ගත් විට, බෞද්ධයන් 103 ක්, ඉස්ලාම් භක්තිකයින් 8 ක් , හින්දු භක්තිකයින් 11 ක් සහ ක්‍රිස්තු භක්තිකයන් 16 දැකිය හැකිය. මින් දෙදෙනෙක් ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කළහ.

වයස 5 ට අඩු දරුවන් 7 ක් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 8 (60 ට වැඩි) ක් මෙහි සිටී. විවාහක අය 76 ක් ද අවිවාහක අය 21 ක් ද (සියයට 15 ක්) වේ. බලපෑම් ලබන පුද්ගලයන්ගේ අධ්‍යාපන මට්ටම සාමාන්‍යය. වැඩිහිටියන් 4 දෙනෙකු පාසල් ගොස් නැත (සියයට 2).

පුරුෂයින් 21 ක සහ කාන්තාවන් 10 ක ගේ ආදායමේ සාමාන්‍යය රු. 25,0001-50,000 අතර වන අතර මධ්‍යන්‍යය රු. 37,500 ක් වේ. ශ්‍රම සහභාගිත්වතා අනුපාතය සියයට 65 ක් වන අතර සියයට 53.8 ක් වන ජාතික ශ්‍රම සහභගීත්වතා අනුපාතයට වඩා වැඩිය )ජාතික සංගණනය 2012).

අවදානමට ලක්ව ඇති ලෙස සලකන ගෘහ ඒකකයන් ගණන 4 කි. බලපෑම් ලබන පුද්ගලයන් ව්‍යාපෘතිය කෙරෙහි පොදුවේ සාධනීය මතයක් ප්‍රකාශ කළ අතර වැඩි සමාජමය පීඩනයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි වෙනු ඇති බව ඉන් පෙනී යයි.

## ව්‍යාපෘතියේ බලපෑම්

ඉවත් කිරීමට ඇති නිවාස ගණන 38 කි. බලපෑම් ලබන නිවාසවල මුළු බිම් ප්‍රමාණය වර්ග අඩි 8.862 කි. මෙම නිවාස 38 න් 31කම බිම් ප්‍රමාණය වර්ග අඩි 300 ට අඩු වෙන අතර වර්ග අඩි 300-500 අතර වන නිවාස ගණන 6 කි. වර්ග අඩි 600 කට වඩා වැඩි නිවාස ගණන එකකි. නිවසක සාමාන්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 233 කි.

## නෛතික රාමුව සහ ප්‍රතිපත්තිය

ඉඩම් අත්පත් කරගැනීම සිදු කෙරෙන්නේ 1950 ඉඩම් අත්පත් කරගැනීමේ පනත අනුවයි. 1979 අංක 7 දරන රජයේ ඉඩම්. (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන අනුව රාජ්‍ය දේපළ අයත් කරගැනීම සිදු කෙරේ.

## ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය

බලපෑම් ලබන පුද්ගලයින්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා 2001 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත 2001 දී ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සකසන ලදී.

## හිමිකම්

මාසික බදු මුදලක්, සහාධිපත්‍ය කළමනාකරණ අරමුදලට දායකත්වයක් සහ උපයෝගිතා වෙනුවෙන් මාසික නඩත්තු මුදලක් ගෙවීමට යටත්ව, බලපෑමට ලක් වූ පවුල්වලට වර්ග අඩි 550 ක මහල් නිවාස ඒකකයකට හිමිකම ලැබේ. සත්‍ය ලෙස ආදායම අහිමිවීම මත පදනම්ව නැවත පදිංචිවීම හේතුවෙන් ආදායම් මාර්ග අහිමි වීම මත රු. 5000 ක ප්‍රවාහන දීමනාවක්, 50,000ක ආදායම් ප්‍රතිස්ථාපන වන්දියකට, තාවකාලිකව පදිංචිවීම සඳහා සහය ඉල්ලා සිටින අයට මාසයකට රු. 15,000 ක කුලී දීමනාවක් සහ ඇස්බැස්ටොස් සෙවිලි තහඩු වැනි ද්‍රව්‍ය ලබාගැනීමට හිමිකම් ඇත.

### හිමිකම් අනුකෘතිය

දේපළ අත්පත් කරගැනීම සහ ඔවුන්ට ඇතිවූ බාධාවන් හේතුවෙන් බලපෑම් ලැබූ පුද්ගලයන්ට හිමිකම ඇති සියලු ආකාරයේ වන්දි ආකාරයන් හිමිකම් අනුකෘතිය මගින් ආවරණය කෙරේ. සංවර්ධන අමාත්‍යවරයා විසින් 2013 වසරේදී පාර්ලිමේන්තුවේදී ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ සම්මත කරගත් වන්දි ලබාදීමේ විධිවිධාන මත හිමිකම් අනුකෘතිය පදනම් වේ.

## අදහස් විමසීම, මහජන සහභාගීත්වය සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

බලපෑම් ලත් පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් අදහස් විමසීම, තොරතුරු බෙදාහැරීම සහ අනාවරණ අවශ්‍යතා සිදු කරනු ලැබිණි. බලපෑම් ලැබූ පුද්ගලයන්ට නව අත්දැකීමක් වන තිරස් ඉදිකිරීමක් තුළ ජීවත් වීම සම්බන්ධව ඔවුන්ගේ දැක්ම සම්බන්ධව සමහර ගෘහ ඒකකයන් සමග සාකච්ඡා කරන ලදී.

## අවසන් දිනය

2018 ඔක්තෝබර් මස 13 වන දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද මූලික සංගණන සමීක්ෂණය පැවැත්වීමට පෙර ඉඩමේ පදිංචිව සිටි පුද්ගලයන් වන්දි සඳහා සුදුසුකම් ලබයි.

## දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය

හොඳම පරිචයන් අනුගමනය කරමින්, නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව තුළ දක්වා ඇති මාර්ගෝපදේශයන් අනුව ව්‍යාපෘතිය විසින් ස්වාධීන දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ඇත. බලපෑම් ලබන පුද්ගලයන්ට, දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය හරහා තම පැමිණිලි සහ දුක්ගැනවිලි සාර්ථකව විසඳා ගැනීමට අවස්ථාවක් සපයනු ඇත. නව ක්‍රියාපටිපාටීන් සකස් කර ඇත්තේ දීර්ඝ පරිපාලනමය සහ නෛතික ක්‍රියාපටිපාටීන් මග හරිමිනි.

## වෙනත් ස්ථානයකට ගෙන යාම

වර්තමානයේදී රජයේ ඉඩම්වල ජීවත් වන, වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල් සංඛ්‍යාව 38 කි. ඔවුන් පහත කොන්දේසිවලට යටත්ව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කරන ලද වර්ග අඩි **550** කින් යුත් බද්ධ නිවාස ඒකකයක් වෙත ගෙන යනු ඇත**:** (I) නාගරික සංවර්ධන අධිකාරියෙන් නියමකරන පරිදී සහාධිපත්‍ය කළමනාකරණ අරමුදලට එක්වර සිදු කරන ගෙවීමක් (වර්තමානයේදී රු.50,000). මෙය වාරික හතරකින් ගෙවිය හැකිය; (ii) විදුලි සෝපාන ක්‍රියාකිරීම, ප්‍රජා ස්ථාන ආලෝකකරණය සහ සනීපාරක්ෂක සේවාවන් වැනි පොදු සේවාවන් සඳහා මාසික සේවා ගාස්තුවක් ගෙවීම. මෙම සේවාවන්ගේ පවතින ගාස්තු අනුව මෙය වෙනස් විය හැකිය; (iii) මාස 400 ක කාලයක් මාසිකව රු.3,000 බැගින් බද්දක් ගෙවීම. බලපෑම් ලබන පුද්ගලයන්ට නැවත පදිංචි වීමට පසු සහ ඊට පෙර අවශ්‍ය වන සහයන් සපයනු ඇත. ජලය, විදුලි බලය සහ දුරකථන බිල්පත් සඳහා මාසිකව ගෙවීම පදිංචිකරුවන්ගේ වගකීම වෙනු ඇත.

සංගත ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා ඔවුන්ව සත්කාරක ප්‍රජාව සමග අනුකලනය කිරීමට ව්‍යාපෘතිය නිසි ක්‍රියාමාර්ග ගනු ඇත. බද්ධ නිවාසයකට යාමට

කැමැත්තක් නොදක්වන බලපෑම් ලත් පුද්ගලයන්ට වන්දි ලබාගෙන තමන් කැමති ස්ථානයක පදිංචි වීමේ විකල්පය තෝරාගත හැකිය.

### ආදායම් ප්‍රතිසාධනය කිරීමේ උපාය මාර්ගය

මෙ මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර සංඛ්‍යාව 7කි. ඇස්තමේන්තුගත ආදායම ආදායම අහිමිවීම මත ඔවුන්ට මුදල් දීමනාවක් සහ ආදායම් ප්‍රතිසාධනය කිරීමේ වැඩසටහන යටතේ සහය ලබාදෙනු ඇත. අවදානමට ලක් වන පවුල්වලට ආදායම් ප්‍රතිස්ථාපන වැඩසටහනට අමතරව, අඛණ්ඩවම රජයෙන් ලැබෙන සුබසාධන දීමනාවන් ලැබෙනු ඇත.

## නැවත පදිංචි කිරීම සඳහා වන ආයතනික රාමුව

ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම පැවරී ඇත්තේ මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයටයි. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම, සහායක කාර්ය මණ්ඩලයේ සහය සමග අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්) හට පැවරී ඇත. නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය විසින්, බලපෑම් ලත් පුද්ගලයන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ අරමුණින්, වෙනත් ස්ථානයකට ගෙන යාමේ පශ්චාත් සහය ලබාදීමේ වගකීම භාරගනු ඇත.

### නැවත පදිංචි කිරීමේ අයවැය සහ මූල්‍යයනය

ජනතාව ඉවත් කිරීමෙන් මුදාගැනෙන ඉඩම, නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය වෙත සැලකිය යුතු ආදායමක් ගෙන දෙන බැවින් මෙය ආයෝජනයක් ලෙස සැලකූ නිසා, නැවත පදිංචි කිරිමේ අයවැය සැකසීමේදී බද්ධ නිවාස සඳහා වන පිරිවැය ඇතුළත් නොකෙරිණි. ඔබේසේකරපුර අවතැන් ජනතාව සඳහා වන නැවත පදිංචි කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා වන මුළු අයවැය රු 13,225,200 ක් හෙවත් ඇමෙරිකානු ඩොලර් 73,640 ක් වේ (බද්ධ නිවාස ඒකක සඳහා වන පිරිවැය ගණනය නොකෙරිණි).

## ක්‍රියාත්මක කිරීමේ සැලසුම

නැවත පදිංචි කිරීමේ කටයුතු 2018 අගෝස්තු මාසයේදී ආරම්භ වූ අතර 2019 මැයි-ජූනි වෙන විට සම්පූර්ණ කෙරෙනු ඇත. 2018 දෙසැම්බර් අග වීමට පෙර ඉඩමේ

අයිතිය ලබාගනු ඇත. කරුණාකර විස්තර සඳහා වගුව 10.1 හි ක්‍රියාත්මක කිරීමේ සැලසුම බලන්න.

## අධීක්ෂණය සහ ඇගයීම

අභ්‍යන්තර අධීක්ෂණය දැනට සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරෙනු ඇති අතර බාහිර අධීක්ෂණය සඳහා ස්වාධීන උපදේශකයින් සම්බන්ධ වෙනු ඇත. අධීක්ෂණය මගින් ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක වන්නෙදැයි ඇගයීමට නාගරික පුනර්ජනන ව්‍යාපෘතියට හැකියාව ලබාදෙනු ඇත. එමගින් ව්‍යාපෘති කළමනාකාරීත්වයට ගැටළු කළින්ම හඳුනාගැනීමටත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පවත්වාගැනීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයන් ගැනීමටත් හැකියාව ලබා දෙනු ඇත.

මෙම ඇගයීමට පුළුල් විෂය පථයක් ඇතුළත් වෙනු ඇති අතර නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව, ඵලදායිත්වය, බලපෑම සහ තිරසර බව ඇගයීමට ලක් කරමින් අනාගත නැවත පදිංචි කිරීමේ සැලසුම් සඳහා මාර්ගෝපදේශය සැපයීමට පාඩම් උගන්වනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම

කොළඹ නගරය තුළ සහ අවට පහසුකම් අඩු ජනාවාසවල ජීවත් වන පවුල්, රජයට අයත් සභාධිපත්‍යයන් තුළ නැවත පදිංචි කරවීම, මෑතකාලීන අතීතය තුළ රජයේ ප්‍රමුඛතා වැඩසටහන් අතුරින් එකක් විය. කොළඹ නගරය තුළ පමණක්, ඉතා අඩු පහසුකම් යටතේ රජයේ දේපළවල අනවසර පදිංචිකරුවන් ලෙස ජීවත් වන පවුල් ගණන 50,000 ඉක්මවයි. මෙම අරමුණ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් රජයට හිමි ඉඩම්වල සහ නැවත පදිංචි කළ පවුල් ඉවත් කරනු ලැබූ ඉඩම්වල තට්ටු ගොඩනැගිලි ඉදි කෙරේ. නැවත පදිංචි කරනු ලැබූ පවුල් වෙත පිරිනමන ලද නිවාස ඒකකවල, විදුලිය සහ නල ජලය ඇතුළුව වඩා වැඩි පහසුකම් ලබා දී ඇත. ඔවුන්ගේ පෙර ජනාවාසයන්ට වඩා මෙහි පරිසරය බෙහෙවින් පිරිසිදුය. රජයේ ඉඩම්වල ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා තට්ටු ගොඩනැගිලි ඉදිකිරීමට අමතරව, ජනතාව ඉවත් කරන ලද ඉඩම් නව රැකියා මූලාශ්‍රයන් සපයන ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා යොදා ගැනීමද සිදු කෙරේ.

කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියේ දෙවන අදියර, මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කෙරෙමින් තිබේ. ඔබේසේකරපුර, අරුණෝදය මාවතේ අනවසර පදිංචිකරුවන් 38 ක් පදිංචිව සිටි ඉඩම තට්ටු නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා යොදා ගැනෙනු ඇත.

නාගරික පුනර්ජනන ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා වන මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 280 ක් බවට තක්සේරු කර ඇත. නිවාස ඒකක ඉදිකිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ක ණය මුදලක් ලබාදීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව කටයුතු කරමින් සිටී. ඉතිරි ඇමෙරිකානු ඩොලර් මිලියන 80 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිරූප අරමුදල් ලෙස සපයනු ඇත.

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන මෙම ව්‍යාපෘතියේ සංරචකයන් තුනකි.

**1 වන සංරචකය**: හඳුනාගත් පහසුකම් අඩු අනවසර ජනාවාස වෙතින් දළ වශයෙන් පවුල් 5,500 ක් සඳහා නිවාස ඉදිකිරීමට මූල්‍යයනය කිරීම (ඇමෙරිකානු ඩොලර් මිලියන 220). යෝජිත ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ණය මුදලේ 1 වන සංරචකය යටතේ ඉදිකිරීමට නියමිත නිවාස යෝජනා ක්‍රම අතුරින් එකක් සඳහා අවශ්‍ය ඉඩම ලබාගැනීමට, ඔබේසේකරපුර අරුණෝදය මාවතේ පවුල් 38 ක් වෙනත් ස්ථානයකට ගෙන යා යුතුව ඇත.

**2 වන සංරචකය**: වර්තමාන පදිංචිකරුවන් වෙනත් ස්ථානයකට ගෙනයාමෙන් මුදාගැනෙන ඉඩම මත මහජන උපයෝගිතා සැපයීම ඇතුළු කටයුතු සඳහා නැවත සංවර්ධනය කිරීමට සහය ලබාදීම (ඇමෙරිකානු ඩොලර් මිලියන 50).

**3 වන සංරචකය:** බද්ධ නිවාස ගොඩනැගිලිවල තත්වය නඩත්තුව, එහි තිරසර බව වැඩි දියුණු කිරීම, පාරිසරික ගැටළු කළමනාකරණය කිරීම සහ අඩු සහ මධ්‍ය ආදායම්ලාභී නිවාස සැපයීමට අදාළ වර්තමාන ප්‍රතිපත්ති සමාලෝචනය සහ වැඩි දියුණු කිරීම සඳහා සහයෝගය ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරියේ හැකියාව වර්ධනය කිරීම සඳහා මූල්‍යයනය කිරීමට (ඇමෙරිකානු ඩොලර් මිලියන 10) යොදාගැනීම.

ඔබේසේකරපුර අදාළ ඉඩමෙන් වෙනත් ස්ථානයකට රැගෙන යායුතු පවුල් සංඛ්‍යාව 38 ක් වන අතර හඳුනාගත් නැවත පදිංචි කිරීමේ ස්ථානය වන්නේ දෙමටගොඩ සියපත්සෙවනයි. මෙම ස්ථානය ඔවුන් වර්තමානයේ ජීවත්වන ස්ථානයේ සිට කිමී 3 ක් ඇතුළත පිහිටා ඇත.

## 1.1. පිහිටීම


ඔබේසේකරපුර යනු, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාවේ පිහිටා ඇති පහත් බිම් ප්‍රදේශයක් වන අතර කෝට්ටේ ඡන්ද කොට්ඨාශයේ කොටසකි මෙහි විශාල ප්‍රදේශයක් රජයට අයත් වන අතර හිස් බිම් බොහෝ ප්‍රමාණයක් අවිධිමත් ලෙස පදිංචි වූවන්ගෙන් පිරී ඇත. ඔබේසේකරපුර නේවාසිකයින්ට සෞඛ්‍ය, අධ්‍යාපන සහ වාණිජමය පහසුකම් වෙත ඉක්මන් හා පහසු පිවිසුමක් ඇත.

වෙනත් ස්ථානයකට ගෙන යනු ලබන පවුල් 38 පහත් බිම් ප්‍රදේශයක ජීවත් වන අතර ඉතා අඩු වර්ෂාපතනයකදී පවා ගංවතුර තර්ජනයට ලක් වෙයි. ඔබේසේකරපුර ජනතාව සර්වජාතික ජන කොටසක් වන අතර ඔවුන්ගේ ආදායම පොහොසත් මට්ටමේ සිට අන්ත

දිළිඳු මට්ටම දක්වා පරාසයක ඇත; කෙසේ වෙතත්, අරුණෝදය මාවතේ ජීවත් වන පවුල් 38 න් සියයට 85 ක්ම උපයනුයේ රු. 50,000 කට අඩු මාසික ආදායමකි. මෙම මුදල වර්තමාන විනිමය අනුපාතය වන ඇමෙරිකානු ඩොලරයක් රු.180 ක් වන තත්වයක් යටතේදී මසකට ඇමෙරිකානු ඩොලර් 278 ක් හෝ වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් 3,333 ක් ලෙස ගණනය කර ඇත. එමෙන්ම 2017 ඒක පුද්ගල ආදායම වන ඇමෙරිකානු ඩොලර් 3,842 ක සාමාන්‍යයට වඩා අඩු අගයකි.

සංගණන සමීක්ෂණය අනුව වැඩි වශයෙන් සිංහල පවුල් ගණනකින් සමන්විත් වෙයි. ගෘහ මූලිකයින් 38 න් 21 ක්ම ඔබේසේකරපුර ප්‍රදේශයට පිටස්තරව උපත ලබා රටේ වෙනත් ප්‍රදේශවලින් එහි පදිංචියට ආ අය වෙති.

**රූප සටහන 1: ඔබේසේකරපුර, අරුණෝදය මාවත සිතියම සහ ගෙනයාමට යෝජිත ස්ථානය**




### 1.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුමක (RAP)අවශ්‍යතාවය

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුමක් යනු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශය සපයන මෙවලමකි. ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව, නැවත පදිංචි කිරීම මගින් පවුල් *20* කට වඩා වැඩි ප්‍රමාණයකට බලපෑම් ඇති වන්නේ නම් විස්තීර්ණ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සැකසිය යුතු අතර පවුල් *20* කට අඩු ප්‍රමාණයක් බලපෑම් ලබන්නේ නම් මූලික නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී

සැලැස්මක් සැකසිය යුතුය. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ සමාජ ආරක්ෂණයන් අනුව පුද්ගලයන් *200* කට අධික ප්‍රමාණයකට බලපෑම් ඇතිවන්නේ නම් සම්පූර්ණ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් අවශ්‍ය කෙරේ. ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියේ සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අවශ්‍යතා සපුරමින් බැංකුවේ අනුමැතිය සඳහා විස්තීර්ණ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරනු ලැබේ.

## 1.3 අරමුණු

නැවත පදිංචි කිරීමේ සැලසුමේ මූලික අරමුණ වන්නේ බලපෑම්ලත් සහ අවතැන් වූ ජනතාව මුහුණ දෙන ගැටළු විසඳීම සහ නැවත පදිංචි කිරීමෙන් පසු ඔවුන්ගේ ජීවිත වැඩි දියුණු වූ බව තහවුරු කිරීම හෝ අවම වශයෙන් නැවත පදිංචි කිරීමට පෙර ඔවුන් අත්දැක තිබූ තත්වයට සමාන ජීවන තත්වයක් හෝ ළඟා කරගැනීමට ඉඩ ලබාදීමයි. අවම අවශ්‍යතාවය වන්නේ මෙයයි; කෙසේ වෙතත්, ව්‍යාපෘති අරමුණ වන්නේ බලපෑම් ලත් අයගේ ජීවිතය ඔවුන්ගේ පෙර ජීවන මට්ටම්වලට වඩා ඉහළ තලයකට ගෙන ඒමයි.

මෙම ප්‍රධාන අරමුණ ළඟා කරගැනිම සඳහා පහත ක්‍රියාමාර්ගයන් ( එනම් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුමේ කොටසක්) ඵලදායීව සහ නියමිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය:

- ස්වේච්ඡාවෙන් සිදු නොවන නැවත පදිංචි කිරීම් වැලැක්වීමට හැකි සියලුම ආකාරයන් ගවේෂණය කළ යුතුය. නැවත පදිංචි කිරීම කළ යුතුම වන්නේ නම්, නැවත පදිංචි කිරීම අවම කිරීමට ක්‍රියාමාර්ගයන් ගත යුතුය. මෙම ව්‍යාපෘතිය මගින්, පහසුකම් අඩු ජනාවාස තුළ ජීවත්වන යෝග්‍ය පවුල් සඳහා නිවාස සැපයීම පිණිස තට්ටු ගොඩනැගිලි ඉදිකිරීමට නිවාස ඉවත් කිරීමට සිදුවේ. බලපෑම් ලත් පවුල් යම් මට්ටමක අපහසුතාවයන්ට සහ බලපෑම්වලට ලක්වනු ඇති බැවින්, සිදුවිය හැකි පාඩුවක් හා/හෝ තාවකාලික කඩාවැටීමක් සඳහා වන්දි ලබාදීම පිණිස ප්‍රමාණවත් මුදලක් යොදවනු ඇත.
- වන්දි ලබාදීම සහ හිමිකම් පිළිබඳව තොරතුරු ප්‍රචාරණය

- මහජනයා වෙත ව්‍යාපෘතියේ සාධාරණීකරණය, ක්‍රියාත්මක කරන ආයතනය, මූල්‍ය මූලාශ්‍ර, වෙනත් ස්ථානයකට යාමට පෙර සහ පසු ලබාදෙන සහය පිළිබඳව අනාවරණය කිරීම සහ සත්කාරක ප්‍රජාව සමග අනුකලනය කිරීම.
- බලපෑම් ලත් පුද්ගලයන් සමග නිරන්තර සංවාදයක් පවත්වා ගැනීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම සකසන අතර සහ එය ක්‍රියාත්මක කරන අතරතුර ඔවුන්ගේ අදහස් ලබාගැනීම.
- භෞතික, ආර්ථික සහ සමාජමය ලෙස සිදුවන විවිධාකාරයේ බලපෑම් හඳුනාගෙන නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කිරීම.
- දුක්ගැනවිලි විසඳීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.
- නැවත පදිංචි කිරීමේ සැලසුම සඳහා වන වියදම් ආවරණය කෙරෙන විස්තීර්ණ අයවැයක් සංවර්ධනය කිරීම.
- බලපෑම් ලත් පුද්ගලයන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට හිමිකම් අනුකෘතිය අනාවරණය කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ සැලසුම නිසි ලෙස සිදුවන්නේද යන්න තහවුරු කිරීම පිණිස එය අධීක්ෂණය කිරීම.
- බරපතල ලෙස බලපෑමට ලක් වන හෝ අවදානමට ලක් වූ අය හඳුනාගෙන ඔවුන්ට සහය ලබාදීමට වැඩසටහනක් සැකසීම.
- ව්‍යාපෘතිය, බලපෑම් ලත් පුද්ගලයන් සඳහා වන සංවර්ධන අවස්ථාවක් ලෙස සැලකීම.

## 1.3 භාවිතා කෙරෙන ක්‍රමවේදය

ව්‍යාපෘති උපදේශකයින් විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ අංශයේ සාමාජිකයින් සමග 2018 ඔක්තෝබර් 10 වනදා මූලික පරීක්ෂාවක් සඳහා ක්ෂේත්‍රය වෙත සංචාරය කළ අතර එහිදී පාර්ශ්වකරුවන්ගේ හමුවීම් සහ ගණන් ගැනීම්වලට පෙර ව්‍යාපෘති ප්‍රදේශයේ භූගෝලය, ජන විකාසය, සමාජ ආර්ථික සහ පාරිසරික තත්වය පිළිබඳ තොරතුරු රැස් කිරීමට අදහස් කෙරිණි. නාගරික පුනර්ජනන වැඩසටහනේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේදී ගණන් දෙන්නන් ලෙස කටයුතු කරන සමාජ අංශයේ කාර්ය

මණ්ඩලය සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා ක්‍රමවේද, තොරතුරු බෙදාහැරීම යනාදිය පිළිබඳව පුහුණු පංතියක් පවත්වන ලදී.

ව්‍යාපෘතියේ සාධරණීකරණය සහ වෙනත් ස්ථානයකට රැගෙන යාමට පෙර සහ පසු ඔවුන්ට ලැබෙන සහය, යෝජිත පදිංචි කිරීමේ ස්ථානය යනාදිය පිළිබඳව පැහැදිලි කිරීම සඳහා 2018 ඔක්තෝබර් 11 වනදා පෙ.ව. 10 ට ඔබේසේකරපුරදී අදහස් විමසිමේ රැස්වීමක් පැවැත්විණි. බලපෑම් ලබන පුද්ගලයන් ගෙන යාමට නියමිත ස්ථානය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පෙන්වන ලදී. ඔවුන් ඉවත් කිරීමෙන් පසුව එම භූමියේ ඉදි කරනු ලබන සහාධිපත්‍ය ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමෙන් පසුව එම ස්ථානයටම නැවත පැමිණීමට කැමති නම් තාවකාලික නැවත පදිංචියක් සඳහා ඉල්ලීමක් කළ හැකි බවද ඔවුන්ට දන්වන ලදී. එවන් තත්වයකදී, වර්තමාන ස්ථානයේ නිවාස ඒකකයන් තුළ පදිංචි වීමට හැකියාව ලැබෙන තෙක් තාවකාලික ස්ථානවල නිවාස සොයාගැනීම සඳහා කුලී දීමනාවක් ඔවුන් වෙත ලබාදෙනු ඇත. මෙම සාකච්ඡාවෙන් පසුව, තම ගැටළු සාකච්ඡා කිරීමට සඳහා දෙපාර්ශ්වයටම අදහස් දැක්විය හැකි සැසියක් පවත්වන ලදී. තමන් ඉවත් වීමෙන් පසුව ඉදි කෙරෙනු ඇති සහාධිපත්‍ය ගොඩනැගිල්ලට නැවත පැමිණීමට කැමැත්ත පල කරනු ලැබූයේ බලපෑම් ලබන පවුල් අතුරින් පවුල් හතරක් පමණි.

ප්‍රශ්නාවලිය භාවිතා කර දත්ත එක් රැස් කිරීමට පෙර, ගණන් දෙන්නන් විසින් බලපෑම් ලත් පුද්ගලයන්ගෙන් තනි තනිව අදහස් විමසීමක් සිදු කරන ලද අතර එහිදී සමාජ ආර්ථික දත්ත එක් රැස් කිරීමේ අරමුණ වන්නේ ඔවුන්ට සිදුවන භෞතික බලපෑම නිශ්චය කිරීම, අවදානමට ලක්වන්නන් හඳුනාගැනීම, ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ ගැටළු හඳුනාගැනීම, ආදායම අහිමි වීම, පවුල් විස්තර යනාදිය දැනගැනීමට මෙන්ම ඔවුන්ට ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට බව පැහැදිලි කරන ලදී.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම පිණිස, ව්‍යාපෘති කළමනාකරන ඒකකය විසින් ඉවත් කළ යුතු ඉදිකිරීම් (නිවාස), ඉඩම් හිමිකාරීත්වය පිළිබඳ තොරතුරු, බලපෑම් ලබන ඉදිකිරීම්, හිමි වත්කම්, ව්‍යාපාරවල විස්තර, ආදායම සහ වියදම, ජනවිකාසය, අධ්‍යාපන ප්‍රමිතීන්, සමාජ ජාල, සෞඛ්‍ය පහසුකම් වෙත වන ප්‍රවේශය, ප්‍රජා කටයුතුවලට

කාන්තා සහභාගීත්වය සහ අවදානමට ලක් වන කණ්ඩායම් සඳහා රාජ්‍ය සභය යනාදීය පිළිබඳව විස්තර එක් රැස් කරන ලදී.

ගණන් දෙන්නන් විසින් දත්ත එක් රැස් කිරීමෙන් පසුව, උපදේශකයන් විසින් ප්‍රශ්නාවලීන් වැඩි දියුණු කරන ලද අතර සමීක්ෂණ කණ්ඩායමේ සම්බන්ධිකාරක වෙතින් පැහැදිලිකිරීම් ලබාගන්නා ලදී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට එක්සෙල් පැතිරුම්පත්වලට දත්ත ඇතුළු කරන ලදී. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සහ ඉඩම් අත්පත්කරගැනීමේ කාර්ය මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 13 සහ 14 දිනවල දත්ත එක්රැස් කිරීම සිදු කෙරිණි.

# දෙවන පරිච්ඡේදය

# සමාජ ආර්ථික පැතිකඩ

වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල් 38 න් 21 ක ගෘහ මූලිකයින් රැකියා සොයාගෙන පිට ප්‍රදේශවලින් ඔබේසේකරපුරට පැමිණි අය වෙති.

**වගුව 2 1: පවුලේ ප්‍රමාණය අනුව ගෘහ ඒකකවල ව්‍යාප්තිය**

| පවුලේ ප්‍රමාණය අනුව මුළු අවතැන් වූ ජනගහනයේ ව්‍යාප්තිය | | | |
|---|---|---|---|
| අනු අංකය | ගෘහයේ සාමාජිකයින් ගණන | ගෘහ ඒකක ගණන | ප්‍රතිශතය |
| 1 | 1-2 | 7 | 18 |
| 2 | 3-4 | 17 | 45 |
| 3 | 5-7 | 13 | 34 |
| 4 | 7 ට වැඩි | 1 | 3 |
| | එකතුව | **38** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

එක් ගෘහයක සාමාජිකයින් සංඛ්‍යාවේ සාමාන්‍යය 3.8 කි. සාමාජිකයින් 3-4 ක් සිටින ගෘහ ඒකක සංඛ්‍යාව 17 ක් වන අතර මුළු පවුල් ගණනින් සියයට 45 ක් නියෝජනය වේ. පවුල් 13 ක සාමාජිකයින් සංඛ්‍යාව 5-7 දක්වා වන අතර එය සියයට 34 කි. පවුල් 7 ක සිටින්නේ සාමාජිකයින් 1-2 දක්වා ප්‍රමාණයකි. සාමාජිකයින් 7 ට වඩා සිටින්නේ එක් පවුලක පමණි. එක් ගෘහයක සාමාජිකයින් සංඛ්‍යාවේ සාමාන්‍යය 3.68 කි.

**වගුව 2. 2: ජනවාර්ගික සංයුතිය**

| ජනවාර්ගික සංයුතිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජන වර්ගය | පිරිමි | | කාන්තා | | එකතුව | එකතුව |
| | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | | ප්‍රතිශතය |
| සිංහල | 54 | 81 | 60 | 82 | 114 | 81 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දෙමළ | 8 | 12 | 10 | 14 | 18 | 13 |
| මුස්ලිම් | 5 | 7 | 3 | 4 | 8 | 6 |
| එකතුව | **67** | **100** | **73** | **100** | **140** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

පවුල් 38 සමස්ත ජනගහනය 140 ක් වන අතර ඉන් 114 ක් සිංහල වන අතර එහි පුරුෂයින් 54 ක් සහ කාන්තාවන් 60 ක් වෙයි. මෙය සමස්ත ජනගහනයෙන් සියයට 81 කි. මෙය ජාතික ප්‍රතිශතය වන සියයට 75 ට වඩා ඉහළ අගයකි. දෙමළ පුද්ගලයන් 18 ක් සහ මුස්ලිම් පුද්ගලයන් 13 ක් ඇති අතර එය වෙනත් ස්ථානයකට ගෙන යනු ලබන පවුල්වල මුළු ජනගහනයෙන් සියයට 13 ක් සහ සියයට 6 කි. කාන්තාවන් ගණන 73 ක් වන අතර පිරිමින් ගණන 67 කි. දෙමළ ජනගහනයේ ප්‍රතිශතය කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිශතයට වඩා වැඩි වන අතර මුස්ලිම් ජනගහනය කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිශතයට වඩා අඩුය. කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ මුස්ලිම් සහ දෙමළ ජනතාවගේ ඒකාබද්ධ එකතුව එහි සිංහල ජනගහනයට වඩා වැඩි වෙන අතර මුස්ලිම් සහ දෙමළ ජනයාට පිටකොටුව ප්‍රදේශයේ වැඩි ව්‍යාපාර සංඛ්‍යාවක් හිමිය. වතු අංශයේ දෙමළ තරුණයෝ, කොළඹ සහ අවට කම්හල් සහ ව්‍යාපාරික ආයතනවල රැකියා සඳහා කොළඹට සංක්‍රමණය වෙති. ශ්‍රී ලංකාවේ ජනගහනය වෙනත් බොහෝ ආසියාතික රටවලට වඩා අඩු වේගයකින් වර්ධනය වන අතර අග්නිදිග ආසියාවේ අඩුම ජනගහන වර්ධනයක් ඇති රට වේ. (ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

**වගුව 2. 3: ආගමික සංයුතිය**

| ආගමික සංයුතිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආගම | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
| | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | | ප්‍රතිශතය |
| බෞද්ධ | 50 | 75 | 53 | 73 | 103 | 74 |
| ක්‍රිස්තියානි (සියලු නිකායන්) | 6 | 9 | 10 | 14 | 16 | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හින්දු | 5 | 7 | 6 | 8 | 11 | 8 |
| ඉස්ලාම් | 5 | 7 | 3 | 4 | 8 | 6 |
| ප්‍රතිචාර නොදැක්වූ | 1 | 1 | 1 | 1 | 2 | 1 |
| එකතුව | **67** | **100** | **73** | **100** | **140** | 100 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

පුරුෂයින් 50 ක් හා කාන්තාවන් 53 කගෙන් සමන්විත බෞද්ධයින් 103 දෙනෙකු සිටින අතර එය මෙයට අදාළ සමස්ත ජනගහනයෙන් සියයට 74 කි. මෙය ජාතික ප්‍රතිශතය වන සියයට 70.2 ට වඩා මදක් ඉහළ අගයකි. මුළු ජනගහනයෙන් සියයට 11 ක් වන ක්‍රිස්තියානි භක්තිකයින් 16 ක් සිටින අතර එය ජාතික ප්‍රතිශතය වන 7.4 ට වඩා ඉහළ අගයකි. හින්දු භක්තිකයින් ගණන 11 ක් වන අතර ඉස්ලාම් භක්තිකයින් ගණන 8 කි. පුද්ගලයන් දෙදෙනෙකු තම ආගම සම්බන්ධ තොරතුරු ලබා දී නැත.

**වගුව 2.4: වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑම් ලැබූ ගෘහ මූලිකයින්**

| වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑම් ලැබූ ගෘහ මූලිකයින් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | වයස- අවුරුදු | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | 18-30 | 1 | 6 | 1 | 5 | 2 | 5 |
| 2 | 31-40 | 6 | 33 | 7 | 35 | 13 | 34 |
| 3 | 41-60 | 11 | 61 | 7 | 35 | 18 | 48 |
| 4 | 61 ට වැඩි | 0 | 0 | 5 | 25 | 5 | 13 |
| | එකතුව | **18** | **100** | **20** | **100** | **38** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

ඉහළම වයස් පරාසය වන්නේ 41-60 වන අතර එයට මුළු ගෘහ මූලිකයින් ගණනින් සියයට 48 ක් අයත් වේ (පිරිමි 11 හා කාන්තාවන් 7) දෙවන විශාලතම වයස් පරාසය වන්නේ ගෘහ

මූලිකයින් සියයට 34 ක් අයත්වන 31-40 යි (පිරිමි 6 කාන්තා 7) කුඩාම කණ්ඩායම වන්නේ 18-30 යි එයට 1 පුරුෂයෙක් සහ 1 කාන්තාවක් අයත් වේ. ගෘහ මූලිකයා වන්නේ නිවාසය හිමි කලත්‍රයාය. වයස අවුරුදු 61 ට වැඩි ගෘහ මූලික කාන්තාවන් 5 දෙනෙකු සිටී. ඔබේසේකරපුර ප්‍රදේශයේ සමහර පුරුෂයින්, ඔබේසේකරපුර නිවාස තනන ලද හෝ තමන්ට උරුමයෙන් නිවාස ලැබුණු කාන්තාවන් හා විවාහ වී මෙහි පදිංචි වූ පුද්ගලයන් වේ. ආර්ථික හේතු නිසා තරුණ යුවල්වලට තමන්ගේම නිවාස තනාගැනීමට වසර කිහිපයක් ගත වේ. බැංකුවකින් ණය මුදලක් ගැනීමට පවා අයදුම් කළ හැක්කේ ඔවුන් තම රැකියාවල ස්ථිර කරනු ලැබීමෙන් පසුවය. තනතුරේ ස්ථිර කරනු ලැබීමට යමෙක් දෝෂ රහිතව අවම වශයෙන් වසර 3 ක් සේවය කළ යුතුය. සාපේක්ෂව ගත් විට වයස අවුරුදු 60 ට වැඩි කාලයක් ජීවත් වන්නේ කිහිප දෙනෙකි. මෙයට පෝෂණය මඳකම, ආතතිය, දුෂ්කර රැකියා සහ සෞඛ්‍යදායී නොවන පැවැත්ම හේතු විය හැකිය.

**වගුව 2.5: වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑම් ලැබූ ජනතාව**

| වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑම් ලැබූ ජනතාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | වයස | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
| | වර්ගය | | | | | සංඛ්‍යාව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | අවු < 5 | 4 | 6 | 3 | 4 | 7 | 5 |
| 2 | 6-10 | 4 | 6 | 4 | 5 | 8 | 6 |
| 3 | 11-17 | 8 | 12 | 10 | 14 | 18 | 13 |
| 4 | 18-30 | 19 | 28 | 20 | 28 | 39 | 28 |
| 5 | 31-40 | 11 | 16 | 12 | 16 | 23 | 16 |
| 6 | 41-60 | 20 | 30 | 17 | 23 | 37 | 26 |
| 7 | >61 | 1 | 2 | 7 | 10 | 8 | 6 |
| | එකතුව | **67** | **100** | **73** | **100** | **140** | 100 |
| | | | | | | | |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලැබූ පුද්ගලයන් 140 අතුරින් සියයට 71 ක් වයස අවුරුදු 18 සහ 60 අතරේ අය වෙයි. විශාලතම වයස් පරාසය 18-30 වන අතර එයට පුද්ගලයන් 39 ක් ඇතුළත් වන අතර සාපේක්ෂව සම කාන්තා හා පුරුෂ සංඛ්‍යාවක් සිටී. මුළු ජනගහනයෙන් තවත් සියයට 16 ක

ප්‍රමාණයක් 31-40 වයස් කාණ්ඩයේ සිටී. මෙම කාණ්ඩය තුළද සම කාන්තා හා පුරුෂ සංඛ්‍යාවක් සිටී. වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 8 ක් පමණක් සිටින අතර ඉන් සියල්ලම පාහේ කාන්තාවන් ය. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ප්‍රතිශතය ජාතික ප්‍රතිශතය වන සියයට 12.4 ට වඩා බෙහෙවින් අඩුය. ශ්‍රී ලංකාවේ පුරුෂයින්ගේ ආයු අපේක්ෂාව වයස අවුරුදු 72 ට වැඩි අතර විවේකයක් නොමැති වීම, ආතතිය, පෝෂණ ඌනතා සහ අධික වැඩ යනාදිය මෙම ප්‍රදේශයේ වැඩිහිටි අකල් මරණවලට හේතු විය හැකිය. පසුගිය දශක කිහිපය තුළ ඔබේසේකරපුර පදිංචි වීමට සංක්‍රමණය වූ තරුණ ජනතාවද ජන සංයුතියේ සංඛ්‍යාව වෙනස් කිරීමට බලපෑ හැකිය. වයස අවුරුදු 10 ට අඩු ළමුන්, මෙම ජනයාගෙන් සියයට 11 ක් පමණ වේ.

**වගුව 2. 6: ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද පාසල් යන වයසේ සහ ඊට අඩු වයසේ බලපෑම් ලැබූවන්ගේ අධ්‍යාපන තත්වය**

| ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද පාසල් යන වයසේ බලපෑම් ලැබූවන්ගේ අධ්‍යාපන තත්වය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අධ්‍යාපන තත්වය | පිරිමි | | කාන්තා | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | පාසල් යාමට අපේක්ෂාවෙන් සිටින | 4 | 22 | 3 | 15 | 7 | 18 |
| 2 | 1-V පංතිය දක්වා | 4 | 22 | 5 | 30 | 10 | 26 |
| 3 | V1 - IX පංතිය දක්වා | 6 | 8 | 7 | 15 | 8 | 21 |
| 4 | අ.පො.ස. සා/පෙළ සමත් | 2 | 11 | 3 | 15 | 5 | 13 |
| 5 | අ.පො.ස. උ/පෙළ සමත් | 2 | 11 | 2 | 10 | 4 | 11 |
| එකතුව | | **18** | **100** | **20** | **100** | **38** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

වයස අවුරුදු 18 ට අඩු දරුවන් 33 අතුරින් 16 ක් පිරිමි දරුවන්ද 17 ක් ගැහැණු දරුවන්ද වෙයි. ඔවුන් අතුරින් දරුවන් 7 දෙනෙකු පාසල් යන වයසට වඩා අඩු වයසකින් යුක්ත වන අතර

පාසල්වලට ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටී. තවත් 22 දෙනෙක් 1-9 ශ්‍රේණිය දක්වා පංතිවල ඉගෙන ගන්නා අතර 4 දෙනෙකු අ.පො.ස උ/පෙ සඳහා ඉගෙනුම ලබයි. එහි කාන්තා සහ පිරිමි සංයුතිය සමාන වේ. අ.පො.ස සා/පෙ සමත් වූ දරුවන් සංඛ්‍යාව 5 ක් වන අතර අ.පො.ස උ/පෙ සමත් දරුවන් සංඛ්‍යාව 4 කි.

**වගුව 2.7: ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද පාසල් යන වයසට වඩා වැඩි වයසක සිටින බලපෑම් ලැබූවන්ගේ අධ්‍යාපන තත්වය**

| ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද පාසල් යන වයසට වඩා වැඩි වයසක සිටින බලපෑම් ලැබූවන්ගේ අධ්‍යාපන තත්වය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අධ්‍යාපන තත්වය | පිරිමි | | කාන්තා | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | පාසල් නොගිය | 1 | 2 | 1 | 2 | 2 | 2 |
| 2 | අත්සන් කළ හැකි එහෙත් පාසල් නොගිය | 0 | 0 | 2 | 4 | 2 | 2 |
| 4 | 1-V පංතිය දක්වා | 9 | 19 | 10 | 19 | 19 | 19 |
| 5 | V1 - IX පංතිය දක්වා | 24 | 49 | 24 | 45 | 48 | 47 |
| 6 | අ.පො.ස. සා/පෙළ සමත් | 10 | 20 | 9 | 17 | 19 | 19 |
| 7 | අ.පො.ස. උ/පෙළ සමත් | 4 | 8 | 3 | 6 | 7 | 7 |
| 8 | උපාධි අපේක්ෂක/ උපාධිධාරී | 0 | 0 | 1 | 2 | 1 | 1 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 1 | 2 | 3 | 5 | 4 | 4 |
| එකතුව | | **49** | **100** | **53** | **100** | **102** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලැබූ ජනගහනය තුළ අධ්‍යාපනය සම්පූර්ණ කරනු ලැබූවන් අතුරින් 48 ක් V1 ශ්‍රේණියේ සිට IX ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර කාන්තා හා පිරිමි සංඛ්‍යාව සමාන වේ. අ.පො.ස සා/පෙ සමත් වූ දරුවන් සංඛ්‍යාව 19 ක් වන අතර අ.පො.ස උ/පෙ සමත් දරුවන් සංඛ්‍යාව 7 කි. මේ අවස්ථා දෙකෙහිදීම කාන්තා හා පිරිමි සංඛ්‍යාව සමාන වේ. මෙහි එක් උපාධිධාරිනියක් සිටී. පාසල් නොගිය වැඩිහිටියන් සංඛ්‍යාව 4 ක් පමණක් වන අතර එය මුළු වැඩිහිටි සංඛ්‍යාවෙන් සියයට 4 ක් වන අතර ජාතික ප්‍රතිශතය වන සියයට 2.4 ට වඩා බෙහෙවින් වැඩි අගයකි. (ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපා. 2012)

බලපෑම් ලැබූවන් සමග 2018 ඔක්තෝබර් 10 වනදා ඔබේසේකරපුර පැවැත්වුණු පාර්ශ්වකරුවන්ගේ රැස්වීමේදී සඳහන් වූ පරිදි වයස අවුරුදු 10 ට අඩු දරුවන් 2 දෙනෙකුගේ පාසල් ගමන අවිධිමත් ය. පාසල් ගමන නොනවත්වා කරගෙන යාමට උනන්දු කරවීම පිණිස පාසලේ විදුහල්පතිවරයා නිවසට පැමිණ ඇත.

**වගුව 2.8: ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑමට ලක් වූ ගෘහ මූලිකයින්ගේ විවාහ අවිවාහක බව**

| ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑමට ලක් වූ ගෘහ මූලිකයින්ගේ විවාහ අවිවාහක බව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනුඅංකය | විවාහ අවිවාහක බව | පිරිමි | | කාන්තා | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | විවාහක | 17 | 94 | 17 | 85 | 34 | 89 |
| 2 | අවිවාහක | 0 | 0 | 1 | 5 | 1 | 3 |
| 3 | වැන්දඹු | 0 | 0 | 1 | 5 | 1 | 3 |
| 4 | දික්කසාද | 1 | 6 | 0 | 0 | 1 | 3 |
| 6 | ප්‍රතිචාරයක් නොදැක්වූ | 0 | 0 | 1 | 5 | 1 | 3 |
| | එකතුව | **18** | **100** | **20** | **100** | **38** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

ගෘහ මූලිකයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය සාපේක්ෂව සමාන ලෙස බෙදී ඇති අතර ඉන් බහුතරයක් එනම් 38 න් 34 ක් විවාහකය. එක් වැන්දඹු සහ එක් දික්කසාද වූ පුද්ගලයෙකු සිටී. එක් කාන්තාවක් පමණක් තම විවාහ අවිවාහක බව හෙළිදරවු නොකළාය. එක් නිවසක් බෙදාගෙන ජීවත්වන පවුල් තුනක් ඇති අතර තම දරුවා සහ සැමියා සමග සිටින විවාහක කාන්තාවකගේ සොයුරියද නිවසේ සිටී.

**වගුව 2. 9: ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ විවාහ අවිවාහක බව**

| ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කරන ලද බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ විවාහ අවිවාහක බව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | විවාහ අවිවාහක බව | පිරිමි | | කාන්තා | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | විවාහක | 38 | 57 | 38 | 52 | 76 | 54 |
| 2 | අවිවාහක | 10 | 15 | 11 | 15 | 21 | 15 |
| 3 | වැන්දඹු | 0 | 0 | 1 | 1 | 1 | 1 |
| 4 | දික්කසාද | 1 | 1 | 0 | 0 | 1 | 1 |
| 5 | වෙන් වූ | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 6 | බාල වයස් (අවු. 18 ට අඩු) | 14 | 21 | 18 | 25 | 32 | 23 |
| 7 | බාලවයස් විවාහ | 1 | 1 | 0 | 0 | 1 | 1 |
| 8 | ප්‍රතිචාරයක් නොදැක්වූ | 3 | 4 | 5 | 7 | 8 | 5 |
| | එකතුව | **67** | **100** | **73** | **100** | **140** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලබන අයගෙන් බහුතරයක් විවාහකය. වැඩිහිටියන් 108 න් 76 ක් විවාහක අතර 21 ක් අවිවාහකය. එක් බාලවයස් පිරිමි පුද්ගලයෙකු විවාහ වී ඇති අතර 8 දෙනෙකු තම විවාහ අවිවාහක බව හෙළිදරව් නොකළහ. බලපෑම් ලත් පුද්ගලයන් 140 අතුරින් 32 ක් බාලවයස් කරුවන් වේ (නෛතික විවාහවීමේ වයසට අඩු).

**වගුව 2.10: බලපෑම් ලත් පුද්ගලයන්ගේ ආදායම් මාර්ග**

| අනු අංකය | රැකියාව/ආදායම් වර්ගය | | | | |
|---|---|---|---|---|---|

| | | පිරිමි | කාන්තා | එකතුව | |
|---|---|---|---|---|---|
| | | පුද්ගලයන් ගණන | පුද්ගලයන් ගණන | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | ස්වයං රැකියා | 4 | 2 | 6 | 9 |
| 2 | ව්‍යාපාර | 2 | 2 | 4 | 6 |
| 3 | රාජ්‍ය අංශයේ විධායක රැකියා | 1 | 2 | 3 | 4 |
| 4 | රාජ්‍ය අංශයේ වෙනත් ශ්‍රේණිවල රැකියා | 6 | 0 | 6 | 9 |
| 5 | පුද්ගලික අංශයේ විධායක රැකියා | 0 | 2 | 2 | 4 |
| 6 | පුද්ගලික අංශයේ වෙනත් ශ්‍රේණිවල රැකියා | 13 | 5 | 18 | 27 |
| 7 | විදේශ රැකියා | 1 | 1 | 2 | 3 |
| 8 | කාර්මික රැකියා | 1 | 0 | 1 | 1 |
| 9 | ආරක්ෂක රැකියා | 1 | 0 | 1 | 1 |
| 10 | පුහුණු කම්කරු | 3 | 2 | 5 | 8 |
| 11 | දින වැටුප් ලබන කම්කරු | 11 | 5 | 16 | 24 |
| 12 | විශ්‍රාමික | 0 | 1 | 1 | 1 |
| 14 | ඥාතීන්ගේ/යහපත අපේක්ෂා කරන්නන්ගේ පරිත්‍යාග මත යැපෙන්නන් | 1 | 1 | 2 | 3 |
| | එකතුව | **44** | **23** | **67** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලබන පුද්ගලයන් 140 අතුරින් 109 දෙනෙක් රැකියා කළ හැකි 15-60 අතර වයසේ පසුවන්නන් ය. 64 දෙනෙකුට රැකියාවන් මගින් ආදායම් ලැබේ. ඉන් 43 ක් පුරුෂයින්ද 21 ක් කාන්තාවන්ද වේ. පුණ්‍යාධාර මත ජීවත් වන්නන් රැකියාවක නියැලෙන අය ලෙස ගණනය නොකෙරෙන බැවින් ශ්‍රම සහභාගිත්වතා අනුපාතය ගණනය කිරීමේදී සලකා නොබලන ලදී. ශ්‍රම සහභාගිත්වතා අනුපාතය සියයට 58.7 ක් වන අතර සියයට 53.8 ක් වන ජාතික ශ්‍රම සහභාගීත්වතා අනුපාතයට වඩා වැඩිය (ජන සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපා.2015).

විශාලම සේවා නියුක්තිය දැකිය හැක්කේ පුද්ගලික අංශයේ විධායක නොවන ශ්‍රේණිවල සහ දෛනික වැටුප් ලබන රැකියා තුළයි. මෙය ආදායම් උපයන්නන්ගෙන් සියයට 51 ක් අයත් වේ. බොහෝ අංශවල කාන්තාවන්ට වඩා පිරිමි සංඛ්‍යාව ගුණනින් වැඩිය. එයට රාජ්‍ය සහ පුද්ගලික අංශවල විධායක සේවය අයත් නොවේ. එක් පුද්ගලයෙකු කාර්යාල සහකාරවරයෙකු ලෙස සේවය කරන අතර සන්ධ්‍යා කාලයේදී මගී ප්‍රවාහනය සඳහා ත්‍රී රෝද රථයක් ධාවනය කරයි. පුද්ගලයන් දෙදෙනෙකු මැදපෙරදිග සේවාය කරයි (කුවේට්). ඉන් එක් අයෙක් ඉදිකිරීම් ශ්‍රමිකයෙක් වන අතර එක් කාන්තාවක් ගෘහ සේවයේ යෙදෙයි.

**වගුව 2.11: ආදායම් පරාසයන් සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව බලපෑම් ලැබූ ගෘහ ඒකකවල සාමාන්‍ය මාසික ආදායම**

| ආදායම් පරාසයන් සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව බලපෑම් ලැබූ ගෘහ ඒකකවල සාමාන්‍ය මාසික ආදායම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ආදායම් ලැබීමේ ආකාරය | පිරිමි | | කාන්තා | | එකතුව | |
| | | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය | පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
| 1 | < 5,000 | 1 | 2 | 2 | 9 | 3 | 5 |
| 2 | 5,001 – 10,000 | 1 | 2 | 0 | 0 | 1 | 1 |
| 3 | 10,001 – 15,000 | 1 | 2 | 4 | 17 | 5 | 8 |
| 4 | 15,001 – 25,000 | 12 | 28 | 5 | 22 | 17 | 25 |
| 5 | 25,001 – 50,000 | 21 | 48 | 10 | 44 | 31 | 46 |
| 6 | 50,001 – 75,000 | 5 | 12 | 0 | 0 | 5 | 8 |
| 7 | 75,001 – 100,000 | 1 | 2 | 1 | 4 | 2 | 3 |
| 8 | 100,000 - 150,000 | 1 | 2 | 0 | 0 | 1 | 1 |
| 9 | 150,000 ට වැඩි | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | ආදායම් මට්ටම සම්බන්ධව ප්‍රතිචාර | 1 | 2 | 1 | 4 | 2 | 3 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | නොදැක්වූ | | | | | | |
| | එකතුව | **44** | **100** | **23** | **100** | **67** | **100** |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බොහෝ කාන්තාවන් සහ පුරුෂයින් අතර ආදායම් පරාසයේ ව්‍යාප්තිය සමාන වන නමුත් කාන්තාවන්ගේ යම් වැඩි ප්‍රතිශතයක් අඩු ආදායම් සීමාවන් තුළ සිටිනු දක්නට හැකිය. බොහෝ ගෘහ ඒකක ගණනක් අයත් වනුයේ මසකට රු 25,000 - 50,000 ත් අතර ආදායමක් ලබන කාණ්ඩයටයි. එය බලපෑමට ලක්වන ගෘහයන්ගේ ආදායම් උපයන සාමාජිකයන්ගෙන් සියයට 46 කි. දෙවන පරාසය වන්නේ සියයට 25 ක ජනතාවක් අයත්වන රු 15,001 -25,000 පරාසය යි. මෙම පරාසයන් දෙක එක්ව ගත් විට බලපෑමට ලක් වූ ගෘහ සාමාජිකයින්ගේ සියයට 71 කි. මෙයට වඩා අඩු මට්ටමක ආදායම් ලබන බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව 9 ක් වන අතර මසකට රු.50,001 ට වඩා වැඩි ආදායමක් ගන්නා ගෘහ ඒකක 8 ක් ද තිබේ. 2016 දෙසැම්බර් මස වන විට කොළඹ පුරවැසියන්ගේ දරිද්‍රතා රේඛාව වන්නේ මසකට රු.5,114 කි. (ශ්‍රී ලංකා මහ බැංකුව). ඔබේසේකරපුර එක් ගෘහයක සාමාජිකයින් සංඛ්‍යාවේ සාමාන්‍යය 3.68 කි. ඒ අනුව දරිද්‍රතා රේඛාවෙන් ඉහළට ගමන් කිරීම සඳහා රු.18,820 ක සාමාන්‍ය ගෘහ ආදායමක් තිබිය යුතුය. මෙම නිර්ණායකය අනුව, දරිද්‍රතා රේඛාවෙන් පහළට අයත් වන්නේ පවුල් දෙකක් පමණි. එක ගුෘහයක ආදායම් උපයන පුද්ගලයන් සංඛ්‍යාවේ සාමාන්‍යය 1.76 (67/38) කි. බලපෑම් ලබන පුද්ගලයන්ගෙන් එක් අයෙකුට පමණක් මසකට රු. 100,000-150,000 අතර ආදායමක් ලැබේ. බලපෑම් ලබන පුද්ගලයෙකුට මාසික ආදායමේ බරතැබූ සාමාන්‍යය රු. 32,835 කි. එක් ගෘහයක පුද්ගලයන් 1.76 ක සාමාන්‍යයක් රැස්කියාවේ නියුක්ත වන බැවින් එක් ගෘහයක සාමාන්‍ය මාසික ආදායම රු.57,791 කි. 2016 දෙසැම්බර් මස වන විට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 60 ක පවුලක මාසික ආදායමේ සාමාන්‍යය රු 46.097 ක්ව පැවතිණි (මහ බැංකුව) මේ පදනම මත බලපෑම් ලබන පුද්ගලයන් 39 දෙනෙකු සාමාන්‍ය ආදායමක් ලබන බවට සැලකිය හැකි අතර මධ්‍යම ආදායම් ලබන තත්වය සඳහා සුදුසුකම් ලබයි. මධ්‍යම ආදායම් ලබන පරාසයට අයත්වන පවුල්වලින් සියයට 58 ට මාසිකව ගෙවීමට සිදුවන බදු වාරිකය වන රු.3,000 (දිනකට රු.100) ගෙවීමට අපහසුතාවක් නොමැත.

**වගුව** 2.12: **බලපෑම් ලබන ගෘහයන්ගේ සාමාන්‍ය මාසික වියදම**

| අනු අංකය | වියදම් ආකාරය | ප්‍රතිචාර දැක්වූ පවුල් ගණන | මසකට/රු සාමාන්‍යය |
|---|---|---|---|
| 1 | ආහාර | 37 | 23,524 |
| 2 | ඇඳුම් | 16 | 1,156 |
| 3 | ජලය | 36 | 772 |
| 4 | විදුලිය | 33 | 1,402 |
| 5 | ඉන්ධන | 9 | 4,000 |
| 6 | ගෑස් | 24 | 1,578 |
| 7 | දර | 1 | 1,000 |
| 8 | දුම්කොළ/බුලත් | 11 | 3,091 |
| 9 | මද්‍යසාර | 12 | 1,875 |
| 10 | පුණ්‍ය | 8 | 225 |
| 11 | සන්නිවේදන/දුරකථන | 29 | 1,538 |
| 12 | ප්‍රවාහන | 22 | 2,264 |
| 13 | අධ්‍යාපනය | 22 | 4,200 |
| 14 | සෞඛ්‍යය | 23 | 1,078 |
| 15 | බදු/උකස් ගෙවීම් | 1 | 3,500 |
| 16 | සන්නිවේදනය | 1 | 1,000 |
| 17 | ආගමික කටයුතු | 5 | 500 |
| 18 | වාහන අලුත්වැඩියාව | 3 | 3,667 |
| 19 | ණය වාරික | 6 | 5,950 |
| | එකතුව | | **55,485** |

මූලාශ්‍රය**:** සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

පවුල් විසින් ප්‍රකාශ කළ ඉහළම සාමාන්‍ය මාසික වැය කිරීම කරනු ලබන්නේ ආහාර සඳහාය. එය සියයට 42 කට වඩා වැඩිය. ජලය, විදුලිය, ගෑස් සහ සන්නිවේදනය වැනි උපයෝගිතාවන් සඳහාද සුළු වියදම් දරනු ලබයි. ප්‍රවාහනය, සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා වන වියදම්ද වැඩි වශයෙන් දක්වන ලදී. ගෘහ ඒකකයක මුළු වියදම, බලපෑම් ලබන පුද්ගලයෙකුගේ සාමාන්‍ය මාසික ආදායම ඉක්මවා යයි; කෙසේ වෙතත් ගෘහ ඒකකයක එක් සාමාජිකයෙකුට වැඩි ප්‍රමාණයක් ආදායම ලබන බැවින් බොහෝ ගෘහ ඒකකයන්ට අසීරුවකින් තොරව තම වියදම් සපුරා ගත හැකිය. ගෘහ ඒකක 38 අතුරින් රැකියාවේ

නියුක්ත වන ගණන 67 ක් වන අතර එහි සාමාන්‍යය එක් ගෘහයකට 1.76 ක් වේ. එක් නිවසක සාමාන්‍ය මාසික ආදායම 32,835 x 1.76 = රු. 57,791 ක් වෙයි, එය එක් ගෘහයකට වන මාසික වියදම වන රු.57,791 සාමාන්‍යයට වඩා වැඩිය.

**වගුව 2.13: අවදානමට ලක් වූ බලපෑම් ලබන පුද්ගලයන් සහ අවදානමේ ආකාරය**

| අවදානමට ලක් වූ බලපෑම් ලබන පුද්ගලයන් සහ අවදානමේ ආකාරය | | | |
|---|---|---|---|
| අනු අංකය | අවදානමේ ආකාරය | අවදානමට ලක් වූ පවුල් සංඛ්‍යාව | සියයට (ප්‍රතිශතය) |
| 1 | ආදායම් මාර්ගයක් නොමැතිව ඉතා වයෝවෘද්ධ පුද්ගලයන් (70 ට වැඩි) විසින් ගෘහ මූලිකත්වය දරන පවුල්, ආබාධ සහිත කාන්තාවන් විසින් ගෘහ මූලිකත්වය දරන පවුල්. | 3 | 75 |
| 2 | ඉතා දිළිඳු (රු.5,000 ට අඩු ආදායම් ලබන) | 1 | 25 |
| | එකතුව | 4 | 100 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

පවුල් හතරක් අවදානමට ලක් වූ පවුල් කාණ්ඩයට අයත් වන අතර ඉන් පවුල් දෙකක ආදායමක් නොමැති වයෝවෘධ පුද්ගලයන් සිටින අතර ආබාධිත කාන්තාවන් විසින් ගෘහ මූලිකත්වය දරයි. එක් පවුලක් ඉතා දිළිඳු ලෙස සැලකිය හැකිය, ඔවුන් උපයනුයේ 5,000 කට අඩු මාසික ආදායමකි. එක් අවිවාහක කාන්තාවක් නේවාසික නොවන නිවාස හිමියෙකුගේ නිවසක කුලියට වාසය කරන අතර ඇගේ ආදායම් මාර්ගය සම්බන්ධව තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කළාය. තමන් ඒ සම්බන්ධව තොරතුරු අනාවරණය කළ හොත් නිවාස හිමියා ඇය සමග උරණ වී එමගින් ඇයට විකල්ප නිවාස ඒකකයක් ලැබීමට ඇති යෝග්‍යතාවය අහිමි වනු ඇතැයි යන බිය නිසා ඇය නිහඬව සිටියා වන්නට හැකිය. මෙම නිවාස හිමියා වරක් පිටස්තරයින් සිදු කළ සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වූ හේතුවෙන් එහි කුළියට නැවතී සිටි විවාහක යුවලක් එම නිවසින් ඉවත් කර ඇත. මෙහි නොසිටින ඉඩම් හිමියන්ට ඔවුන්ගේ ගොඩනැගිලි ප්‍රතිස්ථාපන පිරිවැය පමණක් ලබා දෙනු ඇති අතර එහි කුළී පදනමින් පදිංචිව සිටින අය, අවදානමට ලක් වන පවුලක් මෙන්ම ව්‍යාපෘතියේ සෘජු බලපෑමට

ලක්වන පවුලක්ද වන බැවින් නිවාස ඒකකයක් ලබාදීම සලකා බැලීම සඳහා සුදුසුකම් කියනු ලබයි.

සටහන: වයෝවෘද්ධ යනු වයස අවුරුදු 70 ට වැඩි කාන්තාවන් ය.

කාන්තාවන් විසින් ගෘහ මූලිකත්වය දරන යන්නෙන් අදහස් කෙරෙන්නේ නිවසක ප්‍රධාන පදිංචිකරුවා කාන්තාවක් වීමයි.

ආබාධ සහිත කාන්තාවන්ට විවිධාකාරයේ ශාරීරික දුබලතාවන් තිබිය හැකිය

**වගුව 2.14: බලපෑමට ලක් වූ බෝ නොවන රෝගවලින් පීඩා විඳින ජනතාව**

| සෞඛ්‍ය ගැටළු (බෝ නොවන) | |
|---|---|
| අසනීපයේ ස්වභාවය | නැත |
| අධි රුධිර පීඩනය | 9 |
| දියවැඩියාව | 15 |
| හදවත් රෝග | 6 |
| දෘශ්‍යාබාධ | 6 |
| ශ්‍රවණාබාධ | 1 |
| ආතරයිටීස් | 5 |
| ඇවිදීමේ අපහසුතා | 7 |
| හතිය/ඇදුම | 3 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බෝ නොවන රෝග අතුරින් ප්‍රධාන ස්ථානය ගන්නේ දියවැඩියාවයි. දියවැඩියා රෝගීන් 15 ක් මෙහි සිටී. මෙයට හේතු ගණනාවක් පදනම් වෙයි: ජානමයි බලපෑම්, අධික ලෙස සීනි භාවිතය, ස්ථූලතාව, ව්‍යායාම රහිත ජීවන රටාව යනාදිය වේ. ඉන් පසුව පවතින ප්‍රධානs සෞඛ්‍ය ගැටළුව වන්නේ අධි රුධිර පීඩනයයි. එම රෝගය වැලඳි අය සංඛ්‍යාව 9 කි. දියවැඩියාව සහ අධි රුධිර පීඩනය සහිත පුද්ගලයන් සැලකිය යුතු සෞඛ්‍ය අවදානමකට මුහුණ දෙයි. බලපෑම් ලබන පුද්ගලයන්ගෙන් 7 දෙනෙකුට ඇවිදීමේ අපහසුතාව ඇති අතර, හදවත් රෝග සහිත අය 6 දෙනෙකුද, දෘශ්‍යාබාධ සහිත අය 6 දෙනෙකුද ආතරයිටීස් සහිත අය 5 දෙනෙකුද සිටී. බලපෑම් ලබන පුද්ගලයන්ට, ජාතික ජල සැපයුම් සහ ජලාපවහන් මණ්ඩලයෙන් පිරිසිදු කළ ජලය සපයන බැවින් ජලය සම්බන්ධ රෝග කිසිවක් වාර්තා නොවේ. බලපෑම් ලබන පුද්ගලයින්ට ගාස්තු අය නොකෙරෙන වෛද්‍ය පහසුකම් ඇත.

ඔවුන් නැවත පදිංචි කිරීමෙන් පසුවද එවැනි සේවාවන් සපයන ආයතන වෙත පහසු ප්‍රවේශයන් ලබා දෙනු ඇත.

**වගුව 2.15: ගෘහ කටයුතු තුළ කාන්තා සහභාගීත්වය**

| පවුලේ තීරණ ගැනීම් තුළ/ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් තුළ කාන්තා සහභාගීත්වය | | |
|---|---|---|
| අනු අංකය | ක්‍රියාකාරීත්වය | ප්‍රතිචාර දැක් වූ කාන්තාවන් ගණන |
| 1 | දෛනික පවුලේ කටයුතු සම්බන්ධව තීරණ ගැනීම. | 32 |
| 2 | සමාජ/ප්‍රජා කටයුතු සඳහා සහභාගී වීමේ ඉඩකඩ | 34 |
| 3 | ආගමික කටයුතු සඳහා සහභාගී වීමේ ඉඩකඩ | 35 |
| 4 | ප්‍රජා පදනම් සංවිධානවල තනතුරු දැරීමේ ඉඩකඩ | 35 |
| 5 | අවශ්‍යතාවයකදී රාජ්‍ය නිලධාරීන් සමග කටයුතු කිරීමේ ඉඩකඩ | 34 |
| 6 | දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව තීරණ ගැනීම | 35 |
| 7 | ආදායම් ඉපයීමේ මාර්ග ඇතිවිට ඒවාට සම්බන්ධ වීමේ නිදහස | 35 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

දෛනික පවුලේ කටයුතුවලදී කාන්තාවන්ගේ තත්වය සම්බන්ධව කරන ලද සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි නිලධාරීන් සමග කටයුතු කිරීමේ සිට ප්‍රජා පදනම් සංවිධානවල තනතුරු ඉසිලීම දක්වා සියලු කටයුතුවලදී කාන්තාව සක්‍රිය භූමිකාවක් දරන බවයි. එවැනි කටයුතු සඳහා කාන්තාවට වැඩි ඉඩක් ලැබීම පවුලට මෙන්ම ප්‍රජාවටද යහපත් වෙයි.

**වගුව 2.16: බිම් ප්‍රමාණය අනුව වර්ගීකරණය කළ බලපෑම් ලබන නිවාස/ඉදිකිරීම්**

| බිම් ප්රමාණය අනුව වර්ගීකරණය කළ බලපෑම් ලබන |
|---|

| නිවාස/ඉදිකිරීම් | | |
|---|---|---|
| අනු අංකය | බිම් ප්‍රමාණයේ පරාසය (ව.අඩි) | අංකය. |
| 1 | 100 ට අඩු | 2 |
| 2 | 101-200 | 13 |
| 3 | 201-300 | 16 |
| 4 | 301-400 | 3 |
| 5 | 401-500 | 3 |
| 6 | 501-600 | 0 |
| 7 | 600 ට වැඩි (603) | 1 |
| 4 | එකතුව | 38 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලබන නිවාස 38 අතුරින් 31 ක බිම් ප්‍රමාණය වර්ග අඩි 300 ට අඩුය. වර්ග අඩි 300 ට වඩා වැඩි නිවාස ඇත්තේ 7 ක් පමණි. නිවාස සහ කඩ ලෙස වර්ග කර ඇති නිවාස දෙකක බිම් ප්‍රමාණය පිළිවෙලින් වර්ග අඩි 223 සහ 422 වේ. බලපෑම් ලබන නිවාසවල මුළු බිම් ප්‍රමාණය වර්ග අඩි 8.862 කි. බලපෑම් ලබන නිවාසවල සාමාන්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 223 කි. නිවාසවල පදිංචිකරුවන්, රාජ්‍ය ඉඩම්වල අනවසර පදිංචිකරුවන් වන බැවින් ඔවුන් කිසිවෙකුට ඉඩම් සඳහා ඔප්පු නැත.

**වගුව 2.17: වර්තමාන නිවසේ පදිංචිව සිටි කාලය**

| පදිංචි කාලය | |
|---|---|
| වසර ගණන | ගෘහ ඒකක ගණන |
| | |
| වසර 10 ට අඩු | 7 |
| වසර 10-15 | 6 |
| වසර 15-20 | 7 |
| වසර 20 කට වැඩි | 15 |
| ප්‍රතිචාර නොදැක්වූ | 3 |
| එකතුව | 38 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

වසර 10 කට අඩු කාලයක් පදිංචිව සිටින පවුල් ඇත්තේ 7 ක් පමණක් අන අතර පවුල් 28 ක් අවුරුදු 10 කට වැඩි කාලයක් වර්තමාන නිවාසවල පදිංචිව සිටී. වර්තමාන නිවසේ පදිංචිව සිටි කාලය සම්බන්ධව ගෘහ ඒකක 3 ක් ප්‍රතිචාර ලබාදුන්නේ නැත.

**වගුව 2.18: බලපෑම් ලබන නිවාසවල ව්‍යුහය**

| නේවාසික ඉදිකිරීම්වල ගෘහ නිර්මාණය | | |
|---|---|---|
| කාමර වර්ග | ගෘහ ඒකක ගණන | විශේෂ සටහන් |
| සාලය | 37 | |
| එක් නිදන කාමරයක් පමණි | 11 | |
| නිදන කාමර 2 | 6 | |
| නිදන කාමර 3 | 0 | |
| මුළුතැන්ගෙය | 23 | |
| කෑම කාමර | 1 | |
| ගබඩා කාමර | 1 | |
| නාන කාමර | 26 | |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

නිවාස බහුතරයක එනම් නිවාස 37 ක සාලය ලෙස හැඳින්විය හැකි ප්‍රධාන කාමරයක් ඇත. මෙය සාමාන්‍යයෙන් බහු කාර්ය කාමරයක් ලෙස භාවිතා කෙරෙන අතර රාත්‍රී කාලයේදී නිදන කාමරයක් ලෙසද භාවිතා කෙරේ. නිදන කාමර නිදාගැනීම සඳහා පමණක් භාවිතා කෙරෙන අතර තනි නිදන කාමරයක් ඇති නිවාස 11 ක් ද නිදන කාමර 2 ක් ඇති නිවාස 6 ක්ද මෙහි ඇත. කිසිදු නිවසක නිදන කාමර 2 කට වඩා වැඩි ගණනක් නොමැත. නිවාස බහුතරයකට එනම් 38 න් 26 කට නානකාමරයක්ද නිවාස 23 කට මුළුතැන්ගෙයක්ද ඇත.

**වගුව 2.19: බලපෑම් ලබන පවුල්වල වර්තමාන නිවෙස්වල පහසුකම්**

| පහසුකම් | | |
|---|---|---|
| සේවාව | මූලාශ්‍රය | නිවාස සංඛ්‍යාව |
| ජලය | NWSDB | 36 |
| | පොදු මූලාශ්‍රය (වීදි ජල නල) | 1 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 1 |
| විදුලිය/ආලෝකකරණය | ලංවිම සම්බන්ධතාව | 33 |
| | සූර්ය බලශක්තිය | 3 |
| | ලාම්පුතෙල් | 1 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 1 |
| සනීපාරක්ෂක | සෝදා හරින වැසිකිළි (flush toilet) | 0 |

| | | |
|---|---|---|
| පහසුකම් | | |
| | ජල මුද්‍රිත | 23 |
| | වල වැසිකිලි | 8 |
| | පොදු වැසිකිලි | 1 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 6 |
| ආහාර පිසීම | එල් පී ගෑස් | 26 |
| | ලාම්පුතෙල් | 6 |
| | දර | 2 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 4 |
| දුරකථන | ශ්‍රී ලංකා ටෙලිකොම් | 1 |
| | ජංගම | 25 |
| | කිසිත් නැත | 7 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 5 |
| අන්තර්ජාලය | ශ්‍රී ලංකා ටෙලිකොම් | 0 |
| | පුද්ගලික සැපයුම්කරුවන් | 0 |
| | ජංගම | 11 |
| | කිසිත් නැත | 15 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 12 |
| චන්ද්‍රිකා රූපවාහිනී | ශ්‍රී ලංකා ටෙලිකොම් | 1 |
| | ජංගම | 3 |
| | කිසිත් නැත | 21 |
| | ප්‍රතිචාර නොදැක්වූ | 13 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

නිවාස ඒකක 38 අතුරින් බහුතරයකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයන ජලය සහ විදුලිය ඇත. සියයට 60 කට වැඩි ප්‍රමාණයකට ජල මුද්‍රිත සනීපාරක්ෂක පහසුකම් ඇත; කෙසේ වෙතත් කිසිවෙකු සෝදාහරින වැසිකිලි සවි කර නැත. ආහාර පිසීම සඳහා සියයට 68 ක්, සිලින්ඩර්වල බෙදා හරිනු ලබන එල්පී ගෑස් භාවිතා කරන අතර සියයට 16 ක් භූමිතෙල් භාවිතා කරයි. දර භාවිතා කරන්නේ නිවාස 2 කි. ගෘහ ඒකක 25 කට ජංගම දුරකථන ඇති නමුත් ජංගම දුරකථන හරහා අන්තර්ජාල පිවිසුම ඇත්තේ 11 කට පමණි.

**වගුව 2. 20: බලපෑම් ලත් ගෘහ ඒකකවලට හිමි නිවාසවල ස්වභාවය**

| නිවසේ ස්වභාවය | |
|---|---|
| ආකාරය | සංඛ්‍යාව |
| ස්ථිර | 9 |
| අර්ධ ස්ථිර | 24 |
| තාවකාලික | 5 |
| එකතුව | 38 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

බලපෑම් ලත් ජනතාව පදිංචිව සිටින නිවාස 38 අතුරින් සියයට 63 ක් අර්ධ ස්ථාවට නිවාස වන අතර ස්ථිර නිවාස ලෙස සැලකිය හැක්කේ ඉදිකිරීම් 9 ක් පමණි. මෙම නිවාසවල ප්‍රතිස්ථාපන අගය, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඔවුන්ට පිරිනමන ඉහළ තත්වයේ විකල්ප නිවාසවල වටිනාකමට වඩා අඩුය. ස්ථිර නිවාසවල බිත්ති ගඩොල් සහ සිමෙන්ති බ්ලොක් ගල්වලින් තනා සිමෙන්ති දමා ඉදි කර ඇති අතර කපරාරු කර ඇත. බිමට සිමෙන්ති දමා හෝ ටයිල් අල්ලා ඇති අතර වහල උළු හෝ ඇස්බැස්ටෝස්වලින් ආවරණය කර ඇත. දැව දොර ජනෙල් දමා ඇත. අර්ධ ස්ථාවර නිවාස ඉදිකර ඇත්තේ සිමෙන්ති බ්ලොක් ගල් වලින් වන අතර කපරාරු කර නොමැත. දැව හෝ සින්ක් තහඩුවලින් ආවරණය කර ඇත. බිමට සිමෙන්ති දමා ඇති අතර දොර ජනෙල් තත්වයෙන් අඩු දැවයෙන් ඉදිකර ඇත. වහල ඇස්බැස්ටොස් හෝ සින්ක් තහඩුවලින් ආවරණය කර ඇත.

**වගුව 2.21: බලපෑම්ලත් ගෘහ ඒකකවලට හිමි වත්කම්**

| බලපෑම්ලත් ජනතාවගේ වත්කම් | |
|---|---|
| අයිතමය | සංඛ්‍යාව |
| යතුරු පැදි | 5 |
| ත්‍රි රෝද රථ | 11 |
| බයිසිකල් | 2 |
| මෝටර් රථ | 0 |
| විසිත්ත කාමර කට්ටල | 0 |
| කෑම මේස | 11 |
| කෑම මේස පුටු | 99 |

| | |
|---|---|
| ඇඳන් | 40 |
| අල්මාරි-වෝඩ්‍රෝබ් | 28 |
| කබඩ් | 24 |
| රූපවාහිනී | 31 |
| ගුවන් විදුලි යන්ත්‍ර | 30 |
| ශීතකරණ | 21 |
| රෙදි සෝදන යන්ත්‍ර | 9 |
| මහන මැෂින් | 5 |
| විදුලි පංකා (සීලිං) | 14 |
| විදුලි පංකා (මේස/සිටුවන) | 36 |
| පරිගණක | 3 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සමීක්ෂණය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

සාමාන්‍යයක් ලෙස ගත්විට සෑම නිවාස ඒකකයකටම අවම වශයෙන් ඇඳක්, විදුලි පංකාවක් සහ පුටු 2 කට වඩා ඇත. කුඩා සහ සිරවූ නිවාවලව ඇති දැඩි රස්නය නිසා විදුලි පංකාව මූලික අවශ්‍යතාවයක් ලෙස සැලකේ. බොහො නිවාසවල අල්මාරි -වෝඩ්‍රෝබ් ඇත. නිවාස සංඛ්‍යාවෙන් අර්ධයකට වැඩි ප්‍රමාණයකට ශීතකරණ ඇති අතර බහුතරයකට රූපවාහිනී හා/හෝ ගුවන් විදුලි යන්ත්‍ර ඇත.

ඔවුන්ට හිමි වාහන අතරට ත්‍රිරෝද රථ 11 ක්, යතුරු පැදි 5 ක් හා බයිසිකල් දෙකක් අයත් වේ.

# තුන්වන පරිච්ඡේදය

# අදහස් විමසීම සහ තොරතුරු ප්‍රචාරණය

### 3.1: ඔබේසේකරපුර අරුණෝදය මාවතේ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම

2018 ඔක්තෝබර් 11 වනද පෙ.ව 10 ට මූලික අදහස් විමසීමක් පවත්වනු ලැබිණි. බලපෑම් ලත් පුද්ගලයන් සමග සිදු කළ සාකච්ඡාවේ අරමුණ වූයේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් පසුපස ඇති සාධාරණත්වය සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට සහ ප්‍රජාවට අත්වන ප්‍රතිලාභ සම්බන්ධව පැහැදිලි කිරීමයි. සහභාගි වූ පුද්ගලයන් ගණන 31 ක් වූ අතර එහි පිරිමි 14 ක් සහ කාන්තාවන් 17 ක් විය.

නැවත පදිංචි කිරීමේ විශේෂඥ විසින් කළ කෙටි පැහැදිලි කිරීමෙන් පසුව, මතුව ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී. පහත වගුව තුළ නැවත පදිංචි කිරීමේ විශේෂඥ විසින් දක්වන ලද ප්‍රතිචාර සඳහන් වේ:

**වගුව 3. 1: අදහස් විමසීමේ රැස්වීමේදී මතු කරන ලද ගැටළු**

| ගැටළුව මතු කළ බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය | මතු කරන ලද ගැටළුව | නැවත පදිංචි කිරීමේ විශේෂඥ සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරීන්ගේ ප්‍රතිචාර. |
|---|---|---|
| බලපෑම් ලත් කාන්තාවක් | සහාධිපත්‍යය ඉදිකිරීමෙන් පසුව මෙම ස්ථානයටම නැවත පැමිණීමට කැමති බලපෑම් ලත් පුද්ගලයෙකුට, නැවත එසේ පැමිණෙන තෙක් කුලී දීමනාව ලබාගත හැකිද? | තාවකාලික ස්ථානයක පදිංචිව සිට නැවත මෙම ස්ථානයටම පැමිණීමට අපේක්ෂා කරන්නේ නම් කුලී දීමනාව ලබාගත හැකිය. |

| | | |
|---|---|---|
| | මසකට ලබාදෙන කුලී මුදල කොපමණද කෙතරම් කාලයකටද | ඔබගේ වර්තමාන නිවසේ තත්වය මත මසකට ලබාදෙන කුලී මුදල රඳා පවතී.<br><br>කුලී දීමනාව ලබාදෙන කාලය වන්නේ ඔබගේ වර්තමාන නිවසෙන් බැහැර වන දිනයේ සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නව බද්ධ නිවාසයක් වෙන් කරන දිනය දක්වා කාලයයි. |
| | | |
| බලපෑම් ලත් පුරුෂයෙක් | සහාධිපත්‍ය පරිශ්‍රය තුළ වාහන නැවැත්වීමේ ඉඩ ලබාදෙන්නේද | තනි තනි පුද්ගල වාහන අංගන නොමැති නමුත් වාහන නැවැත්වීමේ පොදු ඉඩක් ඇත. |
| | | |
| | නව බද්ධ නිවාසය සඳහා වන බද්ද ලෙස අපට කෙතරම් මුදලක් ගෙවීමට සිදුවේද? | බද්ධ නිවාස වර්ග දෙකකි, වර්ග අඩි 450 සහ වර්ග අඩි 550 වශයෙනි.<br>වර්ග අඩි 450 ඒකකයක් සඳහා මසකට රු.2800 බැගින් මාස 360 ක් ද වර්ග අඩි 550 සඳහා මසකට රු. 3,000 බැගින් මාස 400 ක්ද ගෙවිය යුතුය. ඉඩම් වටිනාකම හැර වර්ග අඩි 450 ඒකකයක් ඉදිකිරීමට නාගරික සංවර්ධන අධිකාරියට රු.මිලියන 4 ක් වැය වේ. විශාල ඒකකයක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියට නැවත ලැබෙන්නේ රු. මිලියන 1 ක් පමණි. ඒ සඳහා රු. මිලියන 7 ක් වැය වන නමුත් නාගරික |

| | | |
|---|---|---|
| | | සංවර්ධන අධිකාරියට ලැබෙන්නේ රු. මිලියන 1.2 ක් පමණි. |
| | අප විසින් ගෙවිය යුතු වෙනත් ගෙවීම් මොනවාද | සහාධිපත්‍යය නඩත්තුව සඳහා (බද්ධ නිවාසය භාර දීමට පෙර) එක්වර කළ යුතු ගෙවීමක් ඇත. එය නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණය කරනු ඇත. මෙම මුදල සහාධිපත්‍ය කළමනාකරණ කමිටුවක් පිහිටුවීමෙන් පසුව එයට මාරු කළ යුතුය.<br>ජල සහ විදුලි බිල්පත් මාසිකව පදිංචිකරුවන් විසින් ගෙවිය යුතුය. |
| | | |
| බලපෑම් ලත් කාන්තාවක් | සමහර නිවාසවල බිම් ප්‍රමාණය වර්ග අඩි 450 ඉක්මවන නමුත් අපට ලැබෙන්නේ අපි දැනට සිටිනා නිවසට වඩා කුඩා නිවහන් ය. | එවන් අවස්ථාවකදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රජයේ තක්සේරුකරුවෙකුගෙන් තක්සේරුවක් ඉල්ලා සිටින අතර එම නිවසේ වටිනාකම රු. මිලියන 4 ට වඩා වැඩි නම් සහ ඔබට ලබාදෙන නිවාස ඒකකය වර්ග අඩි 450 ක එකක් නම් එහි වෙනස ඔබට ගෙවනු ලැබේ. ඔබට වර්ග අඩි 550 ක නිවාස ඒකකයක් ලබාදෙන්නේ නම් හා ඔබගේ නිවසේ ප්‍රතිස්ථාපන පිරිවැය රු. මිලියන 7 ඉක්මවන්නේ නම්, ඔබගේ නිවසේ වටිනාකම සහ නාගරික සංවර්ධන අධිකාරියට ඒකකය සඳහා වන වියදම වන රු මිලියන 7 |

| | | |
|---|---|---|
| | | අතර වෙනස ගෙවනු ලැබේ. |
| | | |
| බලපෑම් ලත් කාන්තාවක් | වෙනත් ස්ථානයකට යාම හේතුවෙන් සමහර පුද්ගලයන්ගේ ආදායම අහිමි වේ. ත්‍රි රෝද රථ රියැදුරෙකුට සහ කම්කරුවෙකුට නව ස්ථානයේදී ආදායම් ලැබීම අසීරු විය හැකිය. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ත්‍රි රෝද රථ සඳහා වෙන් කර ඇති ස්ථානවල මෙම ත්‍රි රෝද රථ සඳහා ඉඩ ලබාගනු පිණිස ප්‍රාදේශීය පාලන අධිකාරිය සමග සාකච්ඡා කරනු ඇත. නව ස්ථානය ඔබ දැන් සිටින ස්ථානයෙන් එතරම් දුරක නොපිහිටන බැවින් ඔවුන්ට පෙර රැකියා ස්ථානවලට පැමිණීම අපහසු නොවේ. ආදායම් අහිමි වූ අය සඳහා ආදායම් ප්‍රතිසාධන වැඩසටහනක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දියත් කෙරෙනු ඇත. |
| | එකම නිවස බෙදා හදා ගන්නා පවුල් තුනක් ඇත. නව ස්ථානයේදී මෙලෙස පදිංචි වීමට නොහැකි වෙනු ඇත. | වර්තමාන නිවාසය වර්ග අඩි 700 ට වඩා වැඩි නම් නිවාස ඒකක දෙකක් එක් කිරීමට සලකා බලනු ලැබේ. එවැනි ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ස්ථාපනය කරන ලද අභියාචනා මණ්ඩලය වෙත ඔබේ ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. අතිරේක ඒකකයක් වෙන් කිරීමේ තීරණය පදනම් වන්නේ අවතැන් වූ පවුල පදිංචිව සිටි භූමි ප්‍රමාණය, පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව සහ ආදායම මතයි. |

| | | |
|---|---|---|
| | | බලපෑම් ලත් පුද්ගලයන්ගේ දුක් ගැනවිලි නිරාකරණය කිරීම සඳහා දුක්ගැනවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය නම් වූ වෙනම වේදිකාවක් තැනෙනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් ඔබ නව නිවසට යාමෙන් පසු දුක්ගැනවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කරනු ඇත. |

එක් ගෘහ මූලිකයෙකු හැර සෙසු සියලු දෙනා නේවාසිකයින් ඉවත් කිරීමෙන් පසුව එම ඉඩමේ ඉදිකරන සහාධිපත්‍ය ගොඩනැගිල්ල සම්පූර්ණ කරන තුරු කුලී නිවසක රැඳී සිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිරිනමන සහාධිපත්‍යයක් වෙත යාමට කැමැත්ත පල කරන ලදී.

සටහන: නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව අනුව, ලියාපදිංචි ලේඛන සමග නිශ්චිත කාල සීමාවක් නෛතිකව කුලී හෝ බදු පදනම මත දේපළ ලබාගත් කුලීකරුවන්ට නීතිය යටතේ අවසර දෙනු ලබන ලෙස ලිඛිත කොන්දේසි හා නියමයන්ට එකඟ වී අන්‍යෝන්‍ය කැමැත්ත මත කුලිය/බද්ද අඛණ්ඩව ඉදිරියට ගෙන යා හැකිය. එහෙත් එවැනි ගිවිසුම් ඉතා දුලබ වන අතර මෙහි කුලී/බදු ගිවිසුම් ඇති කරගනු ලබන්නේ බොහෝ විට වාචිකව හෝ නොතාරිස් හෝ නීතිඥයකු විසින් සහතික නොකරන ලද ලිපි හුවමාරුවෙනි. නාගරික සංවර්ධන අධිකාරියේ වර්තමාන ප්‍රතිපත්තිය වන්නේ ඉදිකිරීම සඳහා වන්දියක් සහ වෙනත් අදාළ දීමනා ගෙවීම පමණි. අවතැන් වූ පවුල් සඳහා ලබාදෙන පුනරුත්ථාපන සහය සඳහා ඔවුන් හිමිකම් නොලබයි. එකී පරිශ්‍රය තුළ කුලීකරුවා විසින් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන්නේ නම්, හිමිකම් අනුකෘතිය අනුව එම පුද්ගලයා ආදායම් අහිමිවීමේ දීමනා සහ වෙනත් සහයන් සඳහා හිමිකම් කියයි.

**රූප සටහන 2: වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල් ජීවත් වන**

අරුණෝදය මාවතේ වර්තමාන පරිසරය




**රූප සටහන 3: 2018 10.11 දින ඔබේසේකරපුර පැවැත්වූ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම**



ඉහත ඡායාරූපවල සිටින පුද්ගලයන් වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල්වල ගෘහ මූලිකයෝ වෙති. ත්‍රි රෝද රථයක් පදවන ගෘහ මූලිකයාද එම රූපයේ සිටී. උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ කාර්ය මණ්ඩලය (5) ද එහි දිස්වේ.

බලපෑම් ලත් ජනතාව සමග තනිව සිදු කළ සාකච්ඡාවලදී ගණන් දෙන්නන් විසින් ගණන් ගැනීමේ අරමුණ පහදා දෙන ලදී (කර්ණාකර 1.4 හි 3 වන ඡේදය බලන්න). බලපෑම් ලත් පුද්ගලයන් විසින් මතු කළ ප්‍රධාන ගැටළු පහත දක්වා ඇත:

- වර්තමාන ස්ථානයෙන් ඉවත්වීම සඳහා ඔවුන්ට දෙනු ලබන කාලය.
- උප පවුල් සඳහා අතිරේක නිවාස ඒකක.
- ත්‍රි රෝද රථ හිමි අයට තම වාහන නවතා තැබීමේ ඉඩ.
- දරුවන්ට ක්‍රීඩා කිරීමට ඇති ඉඩ.
- බද්ධ නිවාස ඒකක සඳහා ඔප්පු.
- සහාධිපත්‍යය තුළ පවුල් 38 ම, එකිනෙකාට ළං ළංව පදිංචි කරවීම
- හිඟ බදු මුදල් වාරික ඇති වුවහොත් මතු විය හැකි තත්වය.
- බොහෝ පිරිසක් සිටින ස්ථානයක දරුවන්ගේ ආරක්ෂාව.
- මත්කුඩු වෙළෙඳාම මැඩලීමේ ක්‍රියාමාර්ග.
- පාසල්වලට ළමුන් ඇතුළත් කරගැනීම සඳහා සහය.
- නව නිවාස ආශ්‍රිතව කාය ශ්‍රම අවස්ථා සොයා ගැනීම.
- නව නිවාස වෙත ගෘහභාණ්ඩ රැගෙන යාම.

### 3.2: බලපෑම් ලත් පුද්ගලයන් සමහරකගේ දැක්ම

මීතොටමුල්ල කසල ප්‍රදේශයේ සිට කොළොන්නාවේ සුදුනෙළුම්පුර නිවාස සංකීර්ණයේ රජයට හිමි තට්ටු සහාධිපත්‍යය වෙත ගෙන ගිය නේවාසිකයන් හමුවීම පිණිස උපදේශකවරු ගමන් කළහ. සම්මුඛ පරීක්ෂණයට බඳුන් කළ සියලු දෙනාම නිවාස සංකීර්ණයේ කාන්තා සමිතියේ සාමාජිකයෝ වූහ. පිරිසිදු නිවසක සහ සනීපාරක්ෂාව ඇති

පරිසරයක ජීවත් වීමට ලැබීම පිළිබඳව ඔවුහු තෘප්තිමත්ව සිටින අතර ඔවුන්ගේ පදිංචිය විමසන ඕනෑම කෙනෙකුට තමන් තට්ටු නිවාසයක සිටින බව ආඩම්බරයෙන් පැවසීමට හැකි බව ඔවුහු ප්‍රකාශ කළහ. දරුවන්ට තම යහළුවන් නිවසට කැඳවාගෙන පැමිණිය හැකිය. එක් තරුණ විවාහක කාන්තාවක් පැවසුවේ ඇයගේ ස්වාමි පුරුෂයා ත්‍රි රෝද රථයක් පදවන බවත් දිනක් විදේශිකයින් දෙදෙනෙකු (ඇගේ භාෂාවෙන් සුද්දො) ගෙන යන විටෙක ඔවුන්ට තම නිවසේ වැසිකිලිය භාවිතා කිරීම සඳහා මෙහි කැඳවාගෙන ආ බවයි. සෝදා හරින කොමොඩයකින් සහ වැසිකිලි කරාමයකින් (bidet showers) යුක්තව ටයිල් කර ඇති තම වැසිකිලිය භාවිතා කිරීමට ඉඩ දීම සම්බන්ධව ඇය සිටියේ සතුටිනි. තමන් පෙර පදිංචිව සිටි නිවසට ඇගේ සැමියා ඔවුන් ගෙන ආවේ නම් ඇය කෙතරම් අපහසුතාවකට පත්වනු ඇතිදැයි ඇය විස්තර කළාය. කෙසේ වුවත් යම් යම් ගැටළු ඔවුන්ට තිබිණි. අවට පරිසරයට පුරුදු වන තෙක්, තරුණ ගැහැණු දරුවන්ට කිසිවෙකුත් නොමැතිව විදුලි සෝපානය භාවිතා කිරීමට ඉඩ දීමට ඔවුහු මැළි වූහ. සමහර පිරිමින් බුලත් කෙළ ගසා අවට අපිරිසිදු කිරීමද දැකිය හැකිව තිබිණි. කාන්තාවන්, තම කාන්තා සංවිධානය හරහා අවට පිරිසිදුව තබාගැනීමට පිරිමින් දැනුවත් කිරීමට උත්සහ දරමින් සිටී. මෙම ප්‍රතිපෝෂණය හරහා, සහාධිපත්‍ය වෙත ජනතාව රැගෙන යාමට පෙර බලපෑම් ලැබූ අය සඳහා පැවැත්විය යුතු අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධව නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/නාගරික සංවර්ධන අධිකාරියට දැනුමක් ලැබිණි.

**වගුව 3.2: සැලසුම් කළ අදහස් විමසීම**

| ක්‍රියාකාරීත්වය | අරමුණ | වේලාව | වගකීම |
|---|---|---|---|
| I. බලපෑම් ලත් පුද්ගලයන්ගේ නිවෙස් වෙත යාම | i. නව නිවාස ඒකකයක් වෙත ගෙන යාම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් ගත් ක්‍රියාමාර්ගයන් පිළිබඳව ඔවුන්ට පුද්ගලිකව දැනුම් දීම.<br><br>ii. ඔවුන්ට රු. 5,000 ක් වන ප්‍රවාහන දීමනාව ලැබුණේද යන්න පරීක්ෂා කිරීම. | ඉවත්ව යාමට සති දෙකකට පෙර | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| | | ඉවත්ව යාමට සතියකට පෙර | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | iii. නව නිවසට යාමේදී තම පැරණි නිවසේ තිබූ අබලි ද්‍රව්‍ය ගෙන යාමෙන් වලකින ලෙස බලපෑම් ලත් ජනතාවට උපදෙස් දීම. | ඉවත්ව යාමට සතියකට පෙර | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| | | | |
| 2. වෙනත් ස්ථානයකට ගෙන යාමෙන් පසුව ඔවුන් වෙත සංචාරය කිරීම | i. නව බද්ධ නිවාසය තුළ ඔවුන් කිසියම් අපහසුතාවක්/අඩුපාඩුවක් අත්දකින්නේද යන්න විමසීම. | එහි රැගෙන ගොස් සති දෙකකට පසුව | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| | ii. එහි පදිංචි වූ පසු, බලපෑම් ලත් පුද්ගලයන් තම් දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේදී අපහසුතාවලට මුහුණ දෙන්නේදැයි විමසීම.<br><br>iii. වෙනත් ස්ථානයක පදිංචි වීමෙන් පසු ව්‍යාපාර අහිමි වීම හේතුවෙන් ආදායම අහිමි වූ දෙදෙනාගෙන් වෙනත් පුහුණුවක් ලැබීමට කැමතිදැයි විමසීම. | | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| | iii. ඔවුන් කිසියම් ගැටළුවකට මුහුණ දෙන්නේ නම්, දුක්ගැනවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය භාවිතා කළේද යන්න විමසීම. | | |
| | | | |
| 3. ආදායම් සහ ජීවනෝපාය ප්‍රතිසාධන සැලසුම | බලපෑම් ලත් පුද්ගලයන් සක්‍රියව ක්‍රියාවලියට සහභාගි කරගැනීම සහ ඔවුන්ගේ කැමැත්ත විමසීම. | ආදායම් ප්‍රතිසාධන සැලසුම් සකස් කළ විට | ආදායම් ප්‍රතිසාධන උපදේශක/ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| 4. බලපෑම් ලත් | | නව ස්ථානයට | ආදායම් |

| | | | |
|---|---|---|---|
| පුද්ගලයන් හමුවී පහත කමිටු පිහිටුවීම<br><br>(අ) සකසුරුවම් සහ සමුපකාර කමිටුව<br><br>(ආ) කාන්තා සංවර්ධන කමිටුව<br><br>(ඇ) පරිසර කමිටුවක්<br><br>(ඈ) ප්‍රජා සුබසාධන කමිටුව | ඉතිරි කිරීම් සඳහා හා නේවාසිකයින් සමග බැඳීමක් ඇති කරගැනීමට දිරිදීම.<br><br>ස්වයං රැකියාවල යෙදීමට, දරුවන්ගේ කටයුතු පිළිබඳව විමසිලිමත් වීම සහ පොදු ස්ථාන නිසි ලෙස නඩත්තු කිරීමට ඔවුන්ට දිරි දීම. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව ක්‍රියාකාරී සැලසුමක් සංවර්ධනය කිරීම<br><br>පරිසරය සංරක්ෂණය කිරීමට, පොදු ස්ථාන පිරිසිදුව තබාගැනීමට සහ නිවෙස් සනීපාරක්ෂාකාරීව තබාගැනීමට ඔවුන්ට දිරි දීම<br><br>ස්වශක්තිය ඇති කරගැනීමට සහ නේවාසික ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන ක්‍රියාකාරකම්, සුබසාධන වැඩසටහන් යනාදිය සඳහා දිරිදීම. | ගොස් මාස දෙකකට පසුව | ප්‍රතිසාධන උපදේශක/ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරීන් |
| 5. අධීක්ෂණය | බලපෑම් ලැබූ ජනතාව, පළමුවන තීරුවේ 3-4 කරුණු සමග සක්‍රියව සම්බන්ධව සිටින්නේද යන්න අධීක්ෂණය කිරීම | මාස 12 ක කාලයක් මාස තුනකට වරක් | නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක ඒකකයේ ප්‍රජා සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අලෙවිකරණ සහ සමාජ නිලධාරී |

**3.3: නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනාවරණය කිරීම**

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමෙන් පසුව එය නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ වෙබ් අඩවිවල පල කරනු ඇත.

# හතරවන පරිච්ඡේදය

# නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුව

### 4.1: ඉඩම් අත්පත් කරගැනීමේ පනත (LAA)

ඉඩම් අත්පත් කරගැනීම සිදු කරනු ලබන්නේ 1950 ඉඩම් අත්පත් කරගැනීමේ සංශෝධිත පනතේ විධි විධාන යටතේය (විස්තර සහ ක්‍රියාවලීන් සඳහා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව බලන්න)

### 4.2: රාජ්‍ය දේපල

1979 අංක 7 දරන රජයේ ඉඩම්. (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතේ විධිවිධාන අනුව රාජ්‍ය දේපළ අයත් කරගැනීම සිදු කෙරේ. (විස්තර සඳහා කරුණාකර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව බලන්න)

### 4.3: වන්දි ලබාදීමේ ප්‍රතිපත්තිය

i. ඉඩම් සඳහා වෙළෙඳපොළ වටිනාකම

ii. ඉඩමක කොටසක් අත්පත් කරගන්නේ නම්, එසේ අත්පත් කරගත් කොටසේ වන්දි අනුපාතය තීරණය කළ යුත්තේ එම ඉඩම සම්පූර්ණයෙන්ම වෙළෙඳපොළ වටිනාකමට අලෙවි කිරීමේ පදනමිනි.

iii. ගොඩනැගිලි ප්‍රතිස්ථාපන පිරිවැය ගෙවිය යුත්තේ ක්ෂය වීම සහ අබලි ද්‍රව්‍යවල (ත්‍රාණනය කළ හැකි ද්‍රව්‍ය) වටිනාකම පිළිබඳව සැලකීමෙන් තොරවය

iv. බාධා වීම් සහ වෙනත් අහිමිවීම් සඳහා වන්දි ලබාගත හැකි අතර වැඩි විස්තර සඳහා කරුණාකර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව තුළ ඇති හිමිකම් අනුකෘතිය බලන්න. බාධාකිරීම් සඳහා දෙනු ලබන වන්දි, ප්‍රවාහන දීමනා, ආදායම් අහිමි වීම සඳහ ගෙවීම් යනාදිය 2008 රෙගුලාසි මත පදනම් වේ.

### 4.4: ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය *(NIRP)*

ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ වන්දි ගෙවීමේදී සිදුවන විෂමතා නිවැරදි කිරීමයි. (විස්තර සඳහා කරුණාකර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව බලන්න)

### 4.5: අවසන් දිනය

ඔප්පු නොමැති අය/අනවසර පදිංචිකරුවන් සඳහා යෝග්‍යතා සීමා දිනයන් වන්නේ නැවත පදිංචි කිරීමේ/සංගණන සමීක්ෂණය ආරම්භ කළ දිනයයි (2018 ඔක්තෝබර් 13) මෑත වසරවලදී අදාළ ඉඩමට පැමිණි නිවැසියන් පිළිබඳව සැලකීමේදී 2009 වසරේ ඡන්ද හිමි නාම ලේඛනය යොදා ගැනීමේ වර්තමාන භාවිතාව අසාධාරණ බව පෙනී යයි. සීමා දිනයට පසුව ප්‍රදේශය වෙතට අනවසරයෙන් ඇතුළු වන්නන් වන්දි හෝ වෙනත් ආකාරයේ නැවත පදිංචි කිරීමේ සහයක් ලැබීමට හිමිකම් නොලබයි. මෙම දිනයට පසුව කළ ඉදිකිරීම් හෝ වගා කළ ගස්වැල් වැනි ස්ථාවර වත්කම් සඳහා වන්දි ලබාදෙනු නොලැබේ.

# පස්වන පරිච්ඡේදය

## යෝග්‍යතාව, හිමිකම් හා සහාය

ඔබේසේකරපුර ප්‍රදේශයෙන් වෙනස්  ස්ථානයක පදිංචි කිරීමට නියමිත සියළු ම පවුල් රජයේ ඉඩම්වල පදිංචි වී සිටින ඉඩම් හිමිකම නොමැති පවුල්ය. ඔවුන්ට ඉඩම් අහිමි වීම හේතුවෙන් වන්දි ලැබීමට හිමිකමක් නොමැත. කෙසේ වුවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කෙරෙන සහාධිපත්‍යයෙහි නිවාස ඒකක භාර ගැනීමට ප්‍රකාශ කරන අවස්ථාවක ගොඩනැගිලි අහිමි වීම සඳහා වන්දි ලෙස ප්‍රතිස්ථාපන පිරිවැය ගෙවනු ලැබේ.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කෙරෙන නිවාස ඒකකයක බිම් ප්‍රමාණය වර්ග අඩි 550ක් වේ. පවුල් විසින් එම නිවාස ඒකකය භාර ගැනීමට තීරණය කළ අවස්ථාවක ඔවුන්ගේ ගොඩනැගිල්ලේ වටිනාකම රුැ.මි. 7ට වැඩි වන්නේ නම් ඔවුන්ට එම ගොඩනැගිල්ලේ වටිනාකම හා බද්ධ නිවාස ඒකකයේ වටිනාකම අතර වෙනස හිමි වේ. තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිස්ථාපන පිරිවැයට සිදු කරනු ලැබේ. නාගරික සංවර්ධන අධිකාරියේ වර්තමාන ප්‍රතිපත්තිය වන්නේ වෙනත් ස්ථානයක පදිංචි කිරීමට නියමිත පවුල් සඳහා වර්ග අඩි 550කින් යුතු නිවාස ඒකකයක් වෙන් කිරීමයි.

නිවාස ඒකක සඳහා සනීපාරක්ෂක පහසුකම්, විදුලිය හා ජලය ආදී මූලික පහසුකම් සැපයේ.

## 5.1: සහාධිපත්‍ය පරිශ්‍රයන්හි ඇති පොදු පහසුකම්

i. ප්‍රජා ශාලාව
ii. පෙර පැසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන
iii. සහාධිපත්‍ය කාර්යාලය
iv. ප්‍රාථමික පාසල් (ප්‍රදේශයේ රජයේ පාසල් වෙත ප්‍රවේශවීමේ පහසුකම් සැපයීම) ළමුන්හට ක්‍රීඩා කිරීම සඳහා විවෘත ප්‍රදේශයක්
v. වාහන නැවැත්වීමේ පොදු පහසුකම්
vi. පළාත් පාලන අධිකාරිය විසින් කසල බැහැර කිරීම

පුනර්ජනනීය නගර ව්‍යාපෘතිය යටතේ සියපත් සෙවනේ ඉදිකර ඇති නිවාසවල, ඔබේසේකර පුර ප්‍රදේශයේ බලපෑමට ලක් වූ ගෘහ ඒකක නැවත පදිංචි කර ඇත. දැනට පවතින මහල් නිවාස සංකීර්ණවල කාන්තාවන්හට පොදු කාමර සහ ප්‍රාථමික පාසැල් නොමැත. එසේ නමුදු බිම් මහලේ පවතින ප්‍රජා ශාලාව බහු කාර්‍ය අවකාශයන් ලෙස භාවිතා කළ හැකි ය. තවද, ව්‍යාපෘති බලපෑමට ලක් වූ පවුල්වල දරුවන් ආසන්නතම අධ්‍යාපන ස්ථාන සඳහා යොමු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය අඛණ්ඩවම පියවර ගනිමින් සිටි.

අවතැන් වූවෝ පහත ගෙවීම් සඳහා ද සුදුසුකම් ලබති:

## 5.1 වගුව: ගෙවීම් හා හිමිකම්

| හානිය | බලපෑමට ලක් වූ පුද්ගලයා | හිමිකම | මුදල (රු) |
|---|---|---|---|
| | | | |
| 1: පුද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් නිත්‍ය වශයෙන් ලෙස අහිමි වීම | රජයේ ඉඩමක අනවසර පදිංචිකරුවන් | නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ සහාය | 1.1. සහාධිපත්‍යය කළමනාකරණ අරමුදල් ගෙවීම කෙරෙහි වන ප්‍රතිලාභී |

| | | | |
|---|---|---|---|
| | | | දායකත්වයට යටත්ව බොහෝ මහල්වලින් සමන්විත නිවාස යෝජනා ක්‍රමයක වර්ග අඩි 550කින් යුතු නව නිවාස ඒකකයක් පිරිණැමීම, මාසික නඩත්තු ගාස්තු හා රු. 3,000ක මාසික බදු කුළිය ගෙවීම.<br><br>**(ඔබේසේකරපුර බලපෑමට ලක් වූ පවුල් 38)**<br><br>1.2: රු. 5,000ක වෙනත් ස්ථානයකට රැගෙන යාමේ (ප්‍රවාහනය) දීමනාව.<br><br>**(**ඔබේසේකරපුර බලපෑමට ලක් වූ පවුල් 38**)**<br><br>1.3: ඇස්බැස්ටෝස් හැර කඩා ඉවත් කෙරෙන ගොඩනැගිලිවල ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති අයිතිය. නමුත් මේවා නව නිවාස සංකීර්ණය වෙත රැගෙන යාමට අවසර නොමැත.<br><br>**(**ඔබේසේකරපුර |

| | | | |
|---|---|---|---|
| 2. බලපෑමට ලක් වූ පුද්ගලයන් සඳහා කුළී දීමනාව | ඔබේසේකරපුර වෙත යළි පැමිණීමට කැමති බලපෑමට ලක් වූ ජනතාව | නව නිවාස ඒකකයෙහි පදිංචි කරන තෙක් කුළී දීමනාව. | බලපෑමට ලක් වූ පවුල් 38)<br><br>2.1.නව නිවාස ඒකකය පිරිණමන තුරු රු. 15,000 මාසික කුළී දීමනාවRental<br><br>(සහාධිපත්‍ය ඉදි කර අවසන් වූ පසු තමන් මුලින් සිටි අරුනෝදය මාවත, ඔබේසේකරපුර වෙත නැවත පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ නිවාස 4ක ජනතාව සඳහා) |
| 3.කුළී නවාතැන අහිමි වීම | අවිවාහක කාන්තාවන්ට සඳහා කුළී නවාතැන අහිමි වීම | මුදලින් ලබා දෙන සහයන් | **3.1.** වෙනත් ස්ථානයක පදිංචි වීම සඳහා මාස තුනකට පෙර දැනුම් දීම.<br><br>3.2. නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණය කෙරෙන සමාන ප්‍රමිතීන්ගෙන් යුතු විකල්ප කුළී නවාතැන් සඳහා දීමනාව හෝ මාසිකව රු. 8,000ක් හෝ ඒ අතරින් ඉහළ අගය ගන්නා විකල්පය මාස හයක උපරිමයක් සඳහා.<br><br>**3.3.** රු. 5,000ක් |

| | | | |
|---|---|---|---|
| 4. වෙන ස්ථානයකට ගෙන යාම හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම | වෙනත් ස්ථානයකට ගෙන යාම හේතුවෙන් ආදායම අහිමි වූ අවදානමට ලක් විය හැකි හා කාන්තාවන් මූලික පවුල්.<br><br>අවදානමට ලක් විය හැකි ස්වයං රැකියාවල නිරත පුද්ගලයන් | පුනරුත්ථාපනය කිරීමේ සහාය | ප්‍රවාහන දීමනාව කුළී නිවැසියා සඳහා කුළී නිවැසියාට විකල්ප නිවාසයකට හිමිකම නොමැත. මෙම මූලධර්මය පදිංචිකරුවන් නොවන ඉඩම් හිමියන්ටද අදාළ වේ.<br><br>4.1. ජීවනෝපාය ශක්තිමත් කිරීම සඳහා කාන්තාවන් ගෘහ මූලිකයන් වන පවුල් ඇතුළුව පුහුණුව, ණය ලබා ගැනීමේ පහසුකම හා නිපුණතා පුහුණුව සඳහා සහාය<br><br>4.2: අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන් දැනට "සමෘද්ධි" ගෙවීම්, වයස්ගත පුද්ගලයන් සඳහා ලබා දෙන දීමනාව, පෝෂණ මල්ල, දරිද්‍රතා සහාය ආදී රජයෙන් ලබා දෙන සුභ සාධන සහාය නොලැබෙන අවදානමට ලක් විය හැකි පවුල් සඳහා එම සහාය ලබා දීමට ව්‍යාපෘති |

| | | | |
|---|---|---|---|
| | | | කළමනාකරණ ඒකකය විසින් පියවර ගනු ලැබේ.<br><br>4.3: නව නිවාස සංකීර්ණයේ ගෘහ පාලන පැවරුම් හා ව්‍යාපෘතිය යටතේ සිවිල් කාර්යයන්ට අදාළ රැකියා.<br><br>ඔබේසේකරපුර අවදානමට ලක් විය හැකි පවුල් 4ක් සඳහා |

මූලාශ්‍රය: නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව - නාගරික සංවර්ධන අධිකාරිය

**5.2: පවුල් කිහිපයක් ජීවත් වන නිවාස සඳහා අමතර ඒකකයක් වෙන් කිරීම**

ඔබේසේකරපුර අවතැන් වූ පවුලක් සඳහා වර්ග අඩි 550ක් බිම් ප්‍රමාණයකින් යුතු නිවාස ඒකකයක් වෙන් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කෙරේ. බලපෑමට ලක් වූ පුද්ගලයා ඉවත් වන නිවසෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි 700ට වැඩි නම් සහ පවුල විශාල නම් බලපෑමට ලක් වූ පුද්ගලයා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එහිදී ව්‍යාපෘති අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ (ඉඩම්) හා අධ්‍යක්ෂ (නීති) යන අයගෙන් සමන්විත කමිටුවක් මගින් නිවාස ඒකකයකට අදාළ වෙනත් ගෙවීම්වලට යටත්ව අමතර ඒකකයක් වෙන් කිරීම පිළිබඳ තීරණය කරනු ලැබේ. පවරා ගත් නිවසේ වටිනාකම රු.මි. 7කට වැඩි නම් බලපෑමට ලක් වූ පුද්ගලයාට වෙන් කළ නිවාස ඒකකයේ වටිනාකම අඩු කිරීමෙන් පසු ඉතිරි වන අමතර මුදල ඔහුට/ඇයට හිමි වේ. තක්සේරුව සිදු කරනු ලබන්නේ ප්‍රතිස්ථාපන වියදමට ප්‍රධාන තක්සේරුකරු විසිනි. මෙම අවස්ථාවේ දී නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව මගින් කිසිදු නම්‍යශීලී බවක් නොදක්වනු ලැබේ. අමතර ඒකකයක්

වෙන් කිරීමට අභියාචනා කමිටුව තීරණය කරන්නේ නම් නිවාසලාභියා විසින් නිවසෙහි පිරිවැය හා අදාළ වෙනත් ගෙවීම් සිදු කිරීම අනිවාර්ය වේ. විස්තර සඳහා දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය බලන්න.

## 5.3: වෙනත් ස්ථානයකට ගෙන යාමට පෙර ලබා දෙන සහාය

වෙනත් ස්ථානයකට ගෙන යාමට පෙර තෝරාගත් සහාධිපත්‍යයන්හි බද්ධ නිවාසවල පදිංචි කිරීම සඳහා හඳුනා ගත් පවුල්වලට සහාය ලබා දීම පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පහත කාර්යයන් සිදු කරනු ලැබේ:

5. 1 වගුව: නැවත පදිංචි කිරීමට පෙර ලබා දෙන සහාය

| ක්‍රියාකාරකම | ක්‍රියා කරනු ලබන්නේ |
| --- | --- |
| බලපෑමට ලක් වූ ජනතාව වෙත තොරතුරු ලබා දීම සඳහා අදහස් විමසීම හා දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම. | සමාජ සේවා නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| බලපෑමට ලක් වූ ජනතාව පදිංචි කෙරෙන නිවාස ඒකක පිළිබඳ තොරතුරු. | සැලසුම් නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| බලපෑමට ලක් වූවන් සඳහා වෙන් කෙරෙන්නේ කුමන ආකාරයේ නිවාස ඒකකද, පරිසරය හා සැපයෙන පහසුකම් පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ලබා ගැනීම පිණිස ඔවුන් සහ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියෙහි නිලධාරීන් සමග නිවාස පිහිටි භූමිය වෙත යාමට කටයුතු සම්පාදනය කිරීම. | සමාජ සේවා නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| සහාධිපත්‍යක නිවාස ඒකක වෙන් කිරීම සඳහා ක්‍රියාපාරිපාටිය මත පදනම්ව නාගරික සංවර්ධන අධිකාරියට හිමි සහාධිපත්‍ය නේවාසික ඒකකයන් වෙන් කිරීම.<br>නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්) - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය |

| | |
|---|---|
| රාමුව බලන්න. | |
| සමාජ සේවා නිලධාරී/ ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය |
| අවතැන් වීමට (වෙනත් ස්ථානයකට යාමට පෙර) දින 14කට පෙර නිවස භාර දීම | නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂගේ මග පෙන්වීම යටතේ **ක්ෂේත්‍ර කළමනාකරු** |
| ප්‍රවාහන වියදම් සඳහා ගෙවීම | අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය |

| | |
|---|---|
| බද්ධ නිවාස වෙන් කිරීමට පෙර බලපෑමට ලක් වූ පවුල් ඉවත් කරන්නේ නම් නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කරන පරිදි එක් එක් අවස්ථාවට අනුව මාස හයක් සඳහා සමාන ප්‍රමිතියෙන් යුතු විකල්ප කුළී නේවාසික පහසුකම් හෝ මසකට රු. 8,000 බැගින් හෝ යන දෙකෙන් වැඩි අගයක් ගන්නා පහසුකම ඔවුන්ට ලබා දෙනු ලැබේ. | අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරිය |
| ආබාධිත හෝ අවදානමට ලක් විය හැකි පුද්ගලයන් සඳහා සමාජීය සුදානම පිණිස වන වැඩසටහනක් සකස් කිරීම. | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රජා සංවර්ධන නිලධාරී, සමාජීය නිලධාරී සහ ඉඩම් නිලධාරී |

මූලාශ්‍රය: නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව-නාගරික සංවර්ධන අධිකාරිය

**5.4** වෙනත් ස්ථානයකට ගෙන යාමෙන් පසු ලබා දෙන සහාය

බලපෑමට ලක් වූ ජනතාව වෙනත් ස්ථානයකට ගෙන යාමෙන් පසු ඔවුන්ගේ සමාජීය හා ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ:

## 5. 2 වගුව: නැවත පදිංචි කිරීමෙන් පසු ලබා දෙන සහාය

| | |
|---|---|
| අවතැන් වූ ජනතාව ඔවුන්ගේ නව නිවාස ඒකක වෙත ගෙන යාමෙන් පසුව ඔවුන් නව පරිසරයට අනුගත වීම හා ඔවුන්ට මුහුණ පෑමට සිදු වන ගැටළු පිළිබඳ මාස කිහිපයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අධීක්ෂණය කරනු ලැබේ. මන්ද යත් ඔවුන්ගෙන් බොහෝමයකට උස් වූ ගොඩනැගිලිවල විදුලි සෝපාන හා ප්‍රජා ශාලාවන් වැනි පොදු සම්පත් බෙදාහදා ගනිමින් ජීවත් වීම හුරු පුරුදු දෙයක් නොවන බැවිණි. | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂගේ මග පෙන්වීම යටතේ සමාජීය නිලධාරී, ප්‍රජා සංවර්ධන නිලධාරී, ක්ෂේත්‍ර කළමනාකරු |
| සහාධිපත්‍යය ජීවත් වීමට හිතකර පරිසරයක් බවට පත් කිරීම සඳහා වෙනත් ස්ථානයකට ගෙන යන ලද ජනතාව අතර සාමූහිකත්වය ඇති කිරීම පිණිස නා.සං.අ. විසින් පහත කමිටු ස්ථාපිත කරනු ලැබේ. කාන්තා සංවර්ධන කමිටුව, පාරිසරික කමිටුව, ප්‍රජා සුභසාධන කමිටුව, සකසුරුවම් හා සමූපකාර කමිටුව, සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව (CMC) | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂගේ මග පෙන්වීම යටතේ සමාජීය නිලධාරී, ප්‍රජා සංවර්ධන නිලධාරී, ක්ෂේත්‍ර කළමනාකරු නීතිමය ගැටළු විසඳුණු පසුව . සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව පිහිටුවනු ලැබේ. |
| වෙනත් ස්ථානයකට ගෙන යාම හේතුවෙන් ආදායම් අහිමි වූ බලපෑමට ලක් වූ ජනතාවගේ ආදායම යථා තත්වයට පත් කිරීම පිණිස මූල්‍ය සහාය, නිපුණතා සංවර්ධනය, උපදේශනය හා රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම | සමාජ සේවා නිලධාරී හා සැලසුම් නිලධාරී නාගරික පුනර්ජනන |

| | |
|---|---|
| හරහා ආදායම යථා තත්වයට පත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ. | ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| තම දරුවන් නව පදිංචි ස්ථානවල පාසල්වලට ඇතුළත් කිරීම සඳහා බලපෑමට ලක් වූ ජනතාවට සහාය වීම | සමාජ සේවා නිලධාරී - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| බලපෑමට ලක් වූ ගෘහ ඒකකයන්ට අවැසි නම් මුල් ළමාවිය රැකවරණ පහසුකම් ලබා දීම | ප්‍රජා සංවර්ධන නිලධාරී/ උපදේශක |

| | |
|---|---|
| තරුණයන් හා කාන්තාවන් සඳහා ස්වයං රැකියා පුහුණුව | |
| නැවත පදිංචි කළ පුද්ගලයන්, විශේෂයෙන් ළමුන් හා තරුණ මව්වරුන්ගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම සඳහා පෝෂණ වැඩසටහන් | |
| මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |
| විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා සෞන්දර්ය විෂයන් සඳහා අමතර පංති පැවැත්වීම | |
| පාසල් යාම නවත්වා ඇති ළමුන් සඳහා සහාය ලබා දීම<br>අධ්‍යාපන උපදේශනය<br>සුභසාධන ක්‍රියාමාර්ග<br>ස්වයං රැකියා පුහුණුව<br>පොදු ගැටළු පිළිබඳ කමිටු ස්ථාපිත කිරීම<br>ක්‍රීඩාව හා සෞන්දර්ය විෂයන්ට අදාළව ළමුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා අවස්ථාවන් සංවිධානය කිරීම. මෙම අවස්ථාවන් සිංහල හා දමිළ අලුත් අවුරුදු, රාමදාන් හා දීපාවලී උත්සව පැවැත්වෙන කාලය තුළ සංවිධානය කෙරේ. සහාධිපත්‍යවල තෝරා ගත් ළමුන් විසින් 2018 ඔක්තෝම්බර් 1 දින එනම් ලෝක ළමා දිනයේදී කොළඹ 3 බිෂොප් විද්‍යාලයේ දී වේදිකා නාට්‍යයක් ඉදිරිපත් කරන ලද අතර එය පුහුණු කරන ලද්දේ නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක ඒකකය විසිනි.<br>ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතික වැනි ලේඛන නොමැති පුද්ගලයන් සඳහා ඒවා ලබා ගැනීම පිණිස අදාළ රාජ්‍ය නියෝජිතායතනවල සහාය ඇතිව ජංගම කාර්යාල පවත්වාගෙන යනු ලැබේ.<br>සෞඛ්‍ය සායන සහ නොමිලේ ඇස් කණ්ණාඩි ලබා දීම සඳහා රජයේ සෞඛ්‍ය සේවා සමඟ සම්බන්ධීකරණ කිරීම අවශ්‍ය | |

| | |
|---|---|
| පුද්ගලයන් සඳහා ඒවා නොමිලේ ලබා දීම පිණිස සෞඛ්‍ය සායන පැවැත්වීම | |

**5.5. සත්කාරක ජනගහනය**

ව්‍යාපෘතියේ සමාජීය කාර්ය මණ්ඩලය විසින් සත්කාරක ජනගහනය සමග සංවාදයක් ගොඩ නගනු ලබන අතර ඔවුන් ද පසුගිය කාලයේ සුහදශීලී පරිසරයක් තුළ නිසියාකාර නිවාස නොමැතිකමින් මීට සමාන අපහසුතාවන්ට මුහුණ දුන් බැවින් අලුතෙන් පදිංචියට පැමිණෙන ජනතාව පිළිගැනීමට දිරිගන්වනු ලැබේ. නැවත පදිංචි කිරීමෙන් පසුව ලබා දෙන සහාය යටතේ සිදු කෙරෙන ක්‍රියාකාරකම් මගින් සත්කාරක ප්‍රජාව සඳහා දැනටමත් ප්‍රතිලාභ සපයනු ලැබේ. වැඩිපුර ජනතාව පැමිණීමත් සමග නව ජනාවාසවල ජනගහනය ඉහළ යනු ඇති අතර එහි ප්‍රතිඵලක් ලෙස ඔවුන්ගේ පොදු අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරවීම සඳහා නිලධාරීන් හා දේශපාලඥයන් සමග කේවල් කිරීමේ බලය වැඩිවේ. පාර්ශව දෙකටම ප්‍රතිලාභ සැලසෙන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔවුන්ට තවත් මිනිස් බලය ලැබෙනු ඇත.

**5.6: නිවාස ඒකක ලාභීන්ගේ බැඳීම් (බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ තොරතුරු සඳහා හා ඔවුන්ගේ සහයෝගය ඉල්ලා සිටීම සඳහා)**

I. නිවාස ඒකක දෙනු ලබන්නේ නාගරික සංවර්ධන අධිකාරිය සමග වන කුළී සින්නක්කර ගිවිසුමක් මත පදනම්වයි.

II. සහාධිපත්‍ය නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා සහාධිපත්‍යය කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කළ යුතුය. සහාධිපත්‍යය කළමනාකරණ කමිටුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් නම් කරන ලද නිලධාරීන් සහ අදාළ පවුල්වල නියෝජිතයන්ගෙන් සමන්විත වනු ඇත.

III. සකසුරුවම් හා සමූපකාර සමාජ ස්ථාපිත කිරීම හා මේවා සමූපකාර දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කිරීම.

IV. කාන්තා සංවර්ධන කමිටුවක් මා පාරිසරික කමිටුවක් ස්ථාපිත කිරීම.

V. ප්‍රජා සුභසාධන කමිටුව (මෙම කමිටුවල අන්තර්ගතය හා අරමුණු සඳහා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව බලන්න).

VI. නඩත්තුව සඳහා රැස් කරන මූලික ගෙවීම්වලට අදාළව රැස් කළ අරමුදල් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන නිදන් අරමුදල් වෙතින් සහාධිපත්‍ය කළමනාකරණ කමිටුවේ බැංකු ගිණුමට මාරු කිරීමෙන් පසු සහාධිපත්‍ය කළමනාකරණ කමිටුව කළමනාකරණය කළ යුතුය.

# හයවන පරිච්ඡේදය

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම

## 6.1: ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පැතිකඩ

බලපෑමට ලක් වූ ජනගහනය තුළ කාන්තාවන් 73 දෙනෙකු සිටින අතර ඒ අතරින් 20 දෙනෙකු ඔවුන්ගේ නිවෙස්වල හිමිකාරියන් වන බැවින් ගෘහ මූලිකයන් වේ. කාන්තාවන් 38 දෙනෙකු විවාහක වන අතර එක් අයෙකු වැන්දඹුවකි. වයස සම්බන්ධයෙන් ගත් කල කාන්තාවන් 20 දෙනෙකු අවුරුදු 18-30 දක්වා වයස් කාණ්ඩයේ ද 7 දෙනෙකු අවුරුදු 41-60 දක්වා වයස් කාණ්ඩයේ ද වන අතර 7 දෙනෙකු අවුරුදු 61 හා ඊට වැඩි වයසේ පසු වෙන අතර ඔවුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස සැලකේ. ගෘහ මූලිකයන් වන කාන්තාවන්ගෙන් 20 දෙනා අතුරින් 7 දෙනෙකු අවුරුදු 31-40 දක්වා වයස් කාණ්ඩයේ වන අතර 5 දෙනෙකු අවුරුදු 61 හා ඊට වැඩි වයසේ පසු වෙති.

කාන්තාවන් 73 දෙනා අතරින් 31 දෙනෙකු (සියයට 43ක්) 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර 12 දෙනෙකු (සියයට 16ක්) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වී ඇත. 6 දෙනෙකු පමණක් උසස් පෙළ විභාගයෙන් සමත් වී ඇති අතර එක් කාන්තාවක් උපාධිධාරිණියක වේ. කාන්තාවන් 21 දෙනෙකු පූර්ණකාලීන රැකියාවල නිරත වන අතර 10 දෙනෙකු මසකට රු. 25,000 – 50,000 ද 11 දෙනෙකු මසකට රු. 25,000ට අඩුවෙන් ද උපයන අතර එක් කාන්තාවක් පමණක් මසකට රු. 75,000 – 100,000 මුදලක් ද උපයයි.

## 6.2: ස්ත්රී පුරුෂ සමාජභාවයට අදාළව සිදු වන බලපෑම්

බලපෑමට ලක් වූ ගෘහ ඒකක 38 ට ඔවුන්ගේ වර්තමාන නිවාසවලට වඩා ඉහළ ප්‍රමිතියෙන් යුතු විකල්ප නිවාස ලබා දෙනු ලැබේ.අවතැන් වූ පවුල් වෙත වෙන් කරනු ලබන නිවාස ඒකකවල හිමිකාරීත්වය කලත්‍රයන් දෙදෙනාගේ ම නමට ලබා දෙනු ලැබේ. තම නිවස කුළියට ලබා දුන් බලපෑමට ලක් වූ පුද්ගලයාහට නොමිළේ නිවාස ඒකකයක් ලැබීමට හිමිකමක් නොමැති නමුත් එම පුද්ගලයා වෙත ප්‍රතිස්ථාපන පිරිවැයට සමාන වන්දියක් සහ හිමිකම් අනුකෘතිය (entitlement matrix ) ප්‍රකාරව වෙනත් දීමනා ගෙවනු ලැබේ. කාන්තාවන් දෙදෙනෙකුගේ ආදායම කෙරෙහි සෘජු බලපෑම් එල්ල වනු ඇත.

කුළී නිවසක වාසය කළ අවිවාහක කාන්තාවක් තම ආදායම් විස්තර පිළිබඳ අනාවරණය කිරීමට අකමැති වූ අතර දැනට ඇය පදිංචි වී සිටි ගොඩනැගිල්ල ඉවත් කිරීමට පෙර විකල්ප නිවසක් කුළී පදනම මත ලබා ගැනීමය ඇයට සිදු වනු ඇත. ප්‍රතිපත්තිය වනුයේ කුළී පදනම මත ලබා දී ඇති නිවසෙහි හිමිකරු වෙත ගොඩනැගිල්ල සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය ගෙවීම හා කුළී නිවැසියාහට මාස 3කට පෙර දැනුම් දීමක් සහිතව මාස 6ක් සඳහා කුළී දීමනාවක් සහ රු.5,000ක ප්‍රවාහන දීමනාවක් ගෙවීමයි. අදාළ කාන්තාව ගණන් දීමේ නිලධාරියා වෙත ඇයගේ ආදායම පිළිබඳ විස්තර ලබා දීමට අකමැති වීමට හේතු අසල්වැසියන්ගෙන් විමසූ විට අනාවරණය වී ඇත්තේ ඒ ආශ්‍රිතව කුළී නිවසක පදිංචි වී සිටි පවුලක් තෙවන පාර්ශවයක් සමග සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වීම හේතුවෙන් එම නිවසේ හිමිකරු විසින් ඔවුන් බලහත්කාරයෙන් නිවසින් එළවා දමා ඇති බවයි. ඔවුහු දැනට තාවකාලිකව අරුණෝදය මාවත, ඔබේසේකරපුර පිහිටි ප්‍රජා ශාලාවේ නවාතැන් ගෙන සිටිති.

කාන්තාවන් හා වැඩිහිටි ළමුන් යම් අලුත් ස්ථානයක පදිංචියට ගිය පසු ආගන්තුක පුද්ගලයන් වෙතින් ඔවුන්ට අනිසි බලපෑම් එල්ල විය හැකිය. ඔවුන්ට තම දරුවන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට සිදු වනු ඇත. නව ප්‍රදේශයෙහි පාසල් තුළට ළමුන් ඇතුළත් කර ගැනීමේ දී, විශේෂයෙන් ඔවුන් තම දරුවන් පාසල්වලට ඇතුළත් කරන්නේ වර්තමාන වසර සඳහා පාසල ආරම්භ වීමෙන් පසුව නම් ගැටළු පැන නැගිය හැකිය. ළමුන් පාසල්වල ලියාපදිංචි කිරීමට අදාළ ගැටළු විසඳීම සඳහා උපකාර කිරීම පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මැදිහත් ලැබේ. අනිසි පුද්ගලයන් සමග කටයුතු කරන්නේ කෙසේද සහ තමන්ගේ දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් ආරක්ෂා කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳ බලපෑමට ලක් වූ ජනතාව දැනුවත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. සහාධිපත්‍යයෙහි ස්ථාපිත කර ඇති පොලිස් මුරපොළ මගින් අනුගත වීමේ කාල සීමාව තුළ අලුතින් පැමිණි ජනතාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. වෙනත් ස්ථානයක පදිංචි කරවූ ජනතාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මැදිහත් වීම අවශ්‍ය ගැටළුවලට මුහුණ

පාන්නේ නම් ඔවුන්ට උපකාර කිරීම සඳහා සහාධිපත්‍ය පරිශ්‍රය තුළ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ ඒකකය අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කරනු ලැබේ.

## 6.3: නෛතික ආරක්ෂාව

ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමිකයන් යොදා ගැනීම තහනම් වන අතර පාර්ලිමේන්තු පනතක් මගින් වසර 13 අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කරන ලදී. ළමුන් සම්බන්ධයෙන් වන ගැටළු පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය හා පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වෙන විශේෂ රාජ්‍ය ආයතන පවතියි. කාන්තාවන් හා ළමුන්ට එරෙහි වැරදි පිළිබඳ කටයුතු කිරීම සඳහා සෑම පොලිස් ස්ථානයක ම අංශයක් ඇත. මෙම අංශය සාමාන්‍යයෙන් කාන්තා පොලිස් නිලධාරිණියකගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. කාන්තාවන්ට එරෙහි ඕනෑම ආකාරයක වෙනස් කොට සැලකීමකට එරෙහි වූ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූල වූ ජාතික කාන්තා ප්‍රඥප්තිය මගින් කාන්තාවන්ට එරෙහි සෑම ආකාරයක ම වෙනස් කොට සැලකීම් වැළැක්වීම සඳහා ජාතික න්‍යාය පත්‍රයක් සකස් කරනු ලැබේ.

## 6.4: ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යභාරය

කාන්තාවන්ගෙ ආදායම ඉහළ නැංවීමට හිමික්ම අනුකෘතියේ විධිවිධාන ප්‍රකාරව ඔවුන්ට උපදෙස් හා මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කාන්තා සංවර්ධන කමිටුව හරහා ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම්වල නිරත වීමට හැකි වන පරිදි කාන්තාවන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලැබේ. පුහුණුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් සේවයේ යොදවන ලද උපදේශන ඒකකය මගින් සපයනු ලැබේ. එය විවිධ ක්ෂේත්‍රයන්ගේ පුහුණුව ලද උපදේශකයන් 50 දෙනෙකුගෙන් යුතු විශේෂිත ශාඛාවකි. මෙම පුහුණු වැඩසටහන් සකස් කර ඇත්තේ කාන්තාවන්ගේ හා වැඩිහිටි ළමුන්ගේ සහජ දක්ෂතාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහාය. මෙම පුහුණු වැඩසටහන් ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම්, සංගීතය හා නර්තනය, තොරතුරු

තාක්ෂණය ආදියෙන් සමන්විතවේ. ගෘහස්ථ ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් (i) ඇඳුම් මැසීම, (ii) රූපලාවන්‍ය, (iii) කෘතිම මල් සැකසීම, (iv) ලියුම් කවර සැකසීම, (v) හඳුන්කූරු තැනීම, (vi) රසකැවිලි සැකසීම ආදියෙන් සමන්විතවේ.

එවැනි පුහුණු පහසුකම් මූලික වශයෙන් ආදායම් මාර්ග යථා තත්වයට පත් කිරීමේ වැඩසටහන යටතේ සැපයෙන අතර ආසියානු යටිතළ පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් ලබා දෙන ණයෙහි 3 වන සංරචකය යටතේ පවතින අරමුදල් මත අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය.

අරුණෝදය මාවත ඔබේසේකරපුර කාන්තාවන් නව බද්ධ නිවාසවල පදිංචි කරවූ පසු දැනට උපදේශක අංශය විසින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් මගින් ඔවුන්ට ප්‍රතිලාභ හිමි වනු ඇත (නැවත පදිංචිය කිරීමෙන් පසු ලබා දෙන සහාය - 5.3 වගුව බලන්න)

නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත සමාජ සේවා නිලධාරී විසින් උක්ත පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා උපදේශක අංශය සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කරනු ලැබේ. තොරතුරු බෙදාහැරීම, අධ්‍යාපනය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිණිස සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් කාන්තා සංවර්ධන කමිටුවක් ස්ථාපිත කරනු ලැබේ (5.3 වගුව).

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රජා සංවර්ධන නිලධාරී ප්‍රධානියා ලෙස කටයුතු කරන උපදේශක අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය/ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත සමාජ සේවා නිලධාරී විසින් උක්ත පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා උපදේශක අංශය සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කරනු ලැබේ.

“එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා” ලෙස නම් කර ඇති නව ණය යෝජනා ක්‍රමය යටතේ සැපයෙන ණය පහසුකම් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් කාන්තාවන් දිරිගන්වනු ලැබේ. බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ පවුලේ ආදායම ඉහළ නැංවීම සඳහා ඉදිකිරීම් කාල සීමාව තුළ යෝග්‍ය රැකියාවන් ලබා දීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් කොන්ත්‍රාත්කරු සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය ක්ෂුද්‍ර ණය වැඩසටහන්, සමූපකාර ණය සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් කාන්තාවන්ට ප්‍රතිලාභ හිමි වනු ලැබේ. ගර්භනී මව්වරුන් සඳහා රජය මගින් ලබා දෙනු ලබන පෝෂණ මල්ල ලබා ගැනීමේ දී ඇති වන ගැටළු, සෞඛ්‍ය ගැටළු පිළිබඳ කාන්තාවන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ඔබේසේකරපුර කාන්තාවන් සම්බන්ධ කර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා නිලධාරී විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කාන්තා සංවර්ධන නිලධාරියාගේ සහාය අපේක්ෂා කරනු ලැබේ.

නැවත පදිංචි කෙරෙන ජනතාව තරමක් විශාල භූවිද්‍යාත්මක ප්‍රදේශයක් තුළ ව්‍යාප්තව පවතින නැවත පදිංචි කිරීමේ වෙනත් ව්‍යාපෘති මෙන් නොව නව නිවාස ඒකකවල පදිංචියට යන මෙම ව්‍යාපෘතියෙහි බලපෑමට ලක් වූ පුද්ගලයන් ඔවුන්ගේ සමාජ සබඳතාවලට බාධා එල්ල නොවන පරිදි එක්ව ජීවත් වීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එබැවින් සාමූහික ක්‍රියාකාරකම් සඳහා පහසුවෙන් කාන්තාවන් රැස් කර ගැනීම සාපේක්ෂව පහසු වනු ඇත. හදිසි අවස්ථාවක දී හෝ පොදු කටයුතුවලදී ඔවුන් එකිනෙකා මත යැපීමේ හැකියාව ලැබේ.

## 6.5 දැනුවත් කිරීමේ වැඩසටහන්

## 6.1 වගුව: දැනුවත් කිරීමේ වැඩසටහන්

| | |
|---|---|
| බලපෑමට ලක් වූ ඇතැම් පුද්ගලයන්ට බද්ධ නිවාස ඒකක සඳහා සැපයෙන පහසුකම් හුරු පුරුදු නොවන බැවින් බද්ධ නිවාසවල දී සැපයෙන පහසුකම් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව | සමාජ සේවා නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| සැවොම එක්ව භාවිතා කරන පරිසරයක් තුළ පොදු පහසුකම් හා පවිත්‍රතාවය පවත්ගෙන යාම පිළිබඳ පාඩම් | සමාජ සේවා නිලධාරී හා ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුවත්භාවය | ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සහාය ඇතිව සැලසුම් නිලධාරී - ක්ෂේත්‍ර කළමනාකරු |
| සත්කාරක ප්‍රජාව සමග සුහදශීලී සබඳතාවන් පවත්වා ගැනීම කෙරෙහි දිරිමත් කිරීම පිළිබඳ පුහුණුව | සමාජ සේවා නිලධාරී හා ක්ෂේත්‍ර කළමනාකරු - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| සහාධිපත්‍ය ආසන්නයේ ගැවසෙන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා අනිසි පුද්ගලයන් පිළිබඳ අවධියෙන් සිටීම සඳහා ආරක්ෂාව | එවැනි කරුණු පිළිබඳ තොරතුර ලද විට පොලිසියේ සහාය ඇතිව ක්ෂේත්‍ර කළමනාකරු |

අධීක්ෂණය හා ඇගයීම සිදු කරන අතරතුර ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදාළ ගැටළු අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීම සිදු කරනු ලැබේ. අනාගත ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට එවැනි තොරතුරු ප්‍රයෝජනවත් වනු ඇත.

# හත්වන පරිච්ඡේදය
# දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය (GRM)

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය හා බලපෑමට ලක් වූ ජනතාව අතර ගැටුමක් ඇති නොවී නැවත පදිංචි කිරීමේ කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ නොහැක. විශේෂයෙන් නැවත පදිංචි කිරීමේ ප්‍රතිලාභ සඳහා වන හිමිකම, වන්දි මුදල් ප්‍රමාණ පිළිබඳ අපේක්ෂාව, සුදුසුකම් ලැබීමේ නිර්ණායක, නැවත පදිංචිය කෙරෙන ස්ථාන, නැවත පදිංචිය කෙරෙන ස්ථානවල සේවාවන්ගේ තත්වය හා වෙනත් ස්ථානයක පදිංචි කෙරෙන පවුල් හා සත්කාරක ප්‍රජාව අතර ඇති විය හැකි ගැටුම් සම්බන්ධයෙන් බලපෑමට ලක් වූ ජනතාව හා ව්‍යාපෘති බලධාරීන් අතර ගැටුම් ඇති වීමේ ඉඩකඩ පවතියි. එබැවින් සාර්ථක ව්‍යාපෘති සංවර්ධනයක් හා ක්‍රියාත්මක කිරීමක් තහවුරු කිරීම සඳහා පීඩාවට පත් පුද්ගලයන්හට සිය පැමිණිලි ගොණු කිරීම සඳහා මාර්ග ඇති කිරීම අවශ්‍ය වේ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිස්ථාපන), නීති අංශය මගින් නම් කරන ලද නීති නිලධාරියෙකු සහ ඉඩම් අංශය මගින් නම් කරන ලද ඉඩම් නිලධාරියෙකු යන අයගෙන් සමන්විත අභියාචනා කමිටුවක් හරහා නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය මගින් දැනට වෙනත් ස්ථානයක පදිංචි කිරීමේ ක්‍රියාවලියට අදාළ සියළු දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. පාරිසරික හා සමාජීය ප්‍රතිපත්තිය (ESP) හා පාරිසරික හා සමාජීය ප්‍රමිතීන්ට (ESSs) අනුව ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජීය බලපෑම් මගින් තමන්ට අහිතකර බලපෑම් එල්ල වී ඇතැයි විශ්වාස කරන පුද්ගලයන්ගේ පැමිණිලි ලබා ගැනීම හා ඒවා විසඳීමට හා එය පවතින බව ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක් වූ ජනතාවට දැනුම් දීමට යෝග්‍ය දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් තම ගණුදෙනුකරුවන් විසින් ස්ථාපිත කරනු ඇතැයි **ආසියානු යටිතළ පහසුකම් ආයෝජන බැංකුව (AIIB) අපේක්ෂා කරයි.**

කෙසේ වුවද, ව්‍යාපෘතිය මගින් ද නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව හොඳම භාවිතාවන්ට අනුව දුක්ගැනවිලි විසඳීමේ ස්වාධීන යාන්ත්‍රණයක් සකස් කරනු ලැබේ. දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපාරිපාටීන් මගින් තම පැමිණිලි හා දුක්ගැනවිලි සඳහා මිත්‍රශීලී අයුරින් විසඳුම් ලබා ගැනීමට බලපෑමට ලක් වූ පුද්ගලයන්ට අවස්ථාව සලසනු ලැබේ. භවිතා කිරීමට නියමිත නව ක්‍රියාපාරිපාටිය සැලසුම් කර ඇත්තේ දීර්ඝ පරිපාලන හා නෛතික ක්‍රියාපාරිපාටීන් මග හැරීමට වන අතර එයට පහත දෑ ඇතුළත් වේ:

- බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ප්‍රජාවන් සඳහා අවධානයට යොමු විය යුතු කරුණු ඉදිරිපත් කිරීම සහ පිළියම් ලබා ගැනීම පිණිස ඵලදායක මාර්ගයක් සැපයීම;
- ව්‍යාපෘතිය හා ප්‍රජාව හෝ බලපෑමට ලක් වූ පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් වැඩදායක සබඳතාවක් ප්‍රවර්ධනය කිරීම;
- ප්‍රජාවගේ ගැටළු වැළැක්වීම හා ඒ සඳහා පිළියම් ලබා දීම.

දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි අදියර වන්නේ:

- ව්යාපෘතිය මගින් පත් කෙරෙන ක්ෂේත්‍ර පාදක ඉඩම් හා/ හෝ සමාජීය අලෙවිකරණ නිලධාරී වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම;
- අමාත්‍යංශ මට්ටමින් ස්ථාපිත කෙරෙන දුක්ගැනවිලි විසඳීමේ කමිටුව වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම;
- දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලයක් මගින් පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම;
- අධිකරණ පද්ධතිය යටතේ නඩුවක් ගොණු කිරීම.

පීඩාවට පත් පුද්ගලයකු (පුද්ගලයන්) හට ඉහත දැක්වූ ඕනෑම ආකාරයකින් පිහිටක් ලබා ගත හැකිය. පහත වගුව මගින් නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය සඳහා යෝජිත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය පිළිබඳ විස්තර දැක්වෙන අතර එමගින් පවතින ක්‍රියාපාරිපාටීන්, සම්බන්ධ කරගත හැකි ප්‍රධාන ස්ථානය,

ව්‍යාපෘතිය මගින් පහසුකම් සැලසීම සහ දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දිය යුතු කාල සීමාව යනාදී කරුණු පිළිබඳ අවධාරණය කෙරේ.

## 7. 1 වගුව: දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපාරිපාටීන්

| **දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණයෙහි අදියරයන්** | **සම්බන්ධ කරගත හැකි ප්‍රධාන පුද්ගලයා** | **සම්බන්ධ කර ගැනීම සඳහා සන්නිවේදනය හා ව්‍යාපෘතිය මගින් සැපයෙන් වෙනත් පහසුකම්** | දුක්ගැනවිලි විසඳිය යුතු කාල සීමාව |
|---|---|---|---|
| පළමු අදියර: ක්ෂේත්‍ර මට්ටමේ ඉඩම් හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරී | ඕනෑම දුක්ගැනවිල්ලක් සඳහා සම්බන්ධ කර ගත යුතු පළමු පුද්ගලයා ඉඩම් හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරීන්ය. | දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණය ව්‍යාපෘති භූමියේ මෙන් ම ක්ෂේත්‍ර මට්ටමේ සහාධිපත්‍ය කාර්යාලයේ මහජනතාවට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතුය. එක් එක් අදියරෙහි දී සම්බන්ධ කර ගත හැකි පුද්ගලයාගේ ඇමතුම් තොරතුරු ඇතුළත් දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය සහ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයට අදාළ වෙබ් අඩවිවල ද දැක්විය යුතුය.<br><br>මෙම නිලධාරීන් දුරකථනය හරහා හෝ පුද්ගලිකව සම්බන්ධ කර ගැනීම මගින් අවිධිමත් අයුරින් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා ගත හැකිය.<br><br>අවිධිමත් අයුරින් දුක්ගැනවිලි විසඳිය නොහැකි නම් පීඩාවට පත් පාර්ශවය විසින් 1 වන | වැඩ කරන දින 15යි |

| | | | |
|---|---|---|---|
| | | අදියරෙහි පැමිණිලි ආකෘතිය අනුව පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතුය. එය ලැබුණු බව සනාථ කිරීම සඳහා ආකෘතියේ පිටපතක් (නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි නිළ මුද්‍රාව සහිත) පීඩාවට පත් පාර්ශවය වෙත ලබා දිය යුතුය.<br><br>පැමිණිලි ආකෘතියේ ඉලෙක්ට්‍රොනික පිටපතක් නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය සහ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයට අදාළ වෙබ් අඩවිවල ඇතුළත් විය යුතුය.<br>එම ආකෘති පත්‍රයේ දෘඪ පිටපත් ක්ෂේත්‍ර මට්ටමේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කාර්යාලයෙන් ලබා ගත හැකි විය යුතුය.<br><br>මෙම ආකෘති පත්‍ර සම්පූරණ කිරීමේ දී කියවීමට හෝ ලිවීමට නොහැකි පුද්ලයන් සඳහා අදාළ ඉඩම් හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරී විසින් සහාය ලබා දෙනු ලැබේ.<br><br>අවිධිමත් හා විධිමත් පැමිණිලි පිළිබඳ වෙන් වෙන් වූ ලේඛන සහ ලැබුණු සියළු පැමිණිලි පිළිබඳ වාර්තා අදාළ ඉඩම් හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරී විසින් පවත්වාගෙන යා යුතුය.<br><br>අවශ්‍ය අවස්ථාවල අදාළ ඉඩම් | |

| | | | |
|---|---|---|---|
| | | හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරී විසින් අදාළ කරුණ කාන්තා සංවර්ධන කමිටුව සහ වෙනත් අදාළ පාර්ශවකරුවන් සාකච්ඡා කොට ඔවුන්ගේ අදහස් ලබා ගනු ලැබේ. එවැනි හමුවීම් පැවැත්වීමට කටයුතු සූදානම් කරන්නේ නම් එම අදහස් විමසීම සිදු කළ දිනය, වේලාව, ස්ථානය, සහභාගී වූවන්ගේ ලැයිස්තුව (ඇමතුම් විස්තර සහිතව) සහ ප්‍රධාන ප්‍රතිඵලයේ සාරාංශය අදාළ ඉඩම් හා/ හෝ සමාජීය අලෙවිකරණ නිලධාරී විසින් නිකුත් කරනු ලබන ලිඛිත තීරණයට අමුණා තිබිය යුතුය.<br><br>වැඩ කරන දින 15ක් තුළ පැමිණිල්ල සඳහා විසඳුම් ලබා දුන්නේ නම් අදාළ ඉඩම් හා/ හෝ සමාජීය අලෙවිකරණ නිලධාරී විසින් පීඩාවට පත් පාර්ශවය වෙත තීරණය ලිඛිතව දන්වනු ලැබේ.<br><br>පීඩාවට පත් පාර්ශවය විසින් තීරණය ලද බව දැන්විය යුතු අතර වැඩ කරන දින 10ක් තුළ ඔහුගේ/ ඇයගේ එකඟතාව හෝ එකඟ නොවීම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ යුතුය. මෙම කාල සීමාව තුළ කිසිදු ප්‍රතිචාරයක් ඉදිරිපත් නොකළේ නම් තීරණය පිළිගත් බවට සලකනු ලැබේ.<br><br>යම් පැමිණිල්ලක් සඳහා විසඳුම් ලබා දීමට වැඩිපුර කාලයක් | |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් පීඩාවට පත් පාර්ශවය දැනුවත් කළ යුතු අතර පීඩාවට පත් පාර්ශවය ඊට එකඟ වී දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීමට අත්සන් තැබිය යුතුය. මෙලෙස කාලය දීර්ඝ කිරීම අමතර වැඩ කරන දින 15ක් සඳහා සිදු කළ හැකිය. | |
| දෙවන අදියර: මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ දුක්ගැනවිලි විසඳීමේ කමිටුව | සමාජ විද්‍යාඥ (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය) | 1 වන අදියර තුළින් පීඩාවට පත් පාර්ශවය තෘප්තිමත් වන අයුරින් දුක්ගැනවිල්ල සඳහා පිළියම් ලබා ගැනීමට නොහැකි වුවහොත් හෝ අදාළ ගැටළුව ඉඩම් හා/ හෝ සමාජ අලෙවිකරණ නිලධාරීගේ අධිකාරයෙන් පිටත පවතියි නම් පීඩාවට පත් පාර්ශවයක් විසින් 2වන අදියරෙහි වන පැමිණිලි ආකෘති පත්‍රයට අනුව දුක්ගැනවිලි විසඳීමේ කමිටුව වෙත පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය. එය ලැබුණු බව සනාථ කිරීම සඳහා ආකෘතියේ පිටපතක් (නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි නිළ මුද්‍රාව සහිත) පීඩාවට පත් පාර්ශවය වෙත ලබා දිය යුතුය. පැමිණිලි ආකෘතියේ ඉලෙක්ට්‍රොනික පිටපතක් නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය සහ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයට අදාළ වෙබ් අඩවිවල ඇතුළත් විය යුතුය.<br>එම ආකෘති පත්‍රයේ දෘඩ පිටපත් ක්ෂේත්‍රයේ සහ නාගරික සංවර්ධන | වැඩ කරන දින 15යි |

| | | | |
|---|---|---|---|
| | | අධිකාරියේ ව්‍යාපෘති කාර්යාලයෙන් ලබා ගත හැකි විය යුතුය.<br><br>දුක්ගැනවිලි විසඳීමේ කමිටුවෙහි යෝජිත සංයුතිය පහත සඳහන් පරිදි වේ:<br>සභාපති ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)<br>සාමාජිකයෙකු ලෙස නීති අධ්‍යක්ෂ හෝ නම් කරන ලද පුද්ගලයෙකු<br>සාමාජිකයෙකු ලෙස ඉඩම් අධ්‍යක්ෂ හෝ නම් කරන ලද පුද්ගලයෙකු<br>සාමාජිකයෙකු ලෙස අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ සැලසුම් (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය)<br>ලේකම් ලෙස සමාජ විද්‍යාඥ( ව්‍යාපෘති කළමනාකරණ ඒකකය)<br><br>2 අදියරෙහි පැමිණිලි ආකෘති පත්‍රය සමග 1 අදියරෙහි පැමිණිලි ආකෘති පත්‍රයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.<br><br>මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය මගින් සියළු දුක්ගැනවිලි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත යොමු කරනු ලැබේ.<br><br>ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් දුක්ගැනවිල්ල පරීක්ෂා කර එය නාගරික පුනර්ජනන ව්‍යාපෘතියට අදාළ ද යන්න තීරණය කරනු ලැබේ. එය ඊට අදාළ නොවේ නම් ඒ | |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් පීඩාවට පත් පාර්ශවය ලිඛිතව දැනුවත් කළ යුතු අතර පසු විපරම් කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ආයතන ද ඇතුළුව ඉදිරි කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් කෙටියෙන් සඳහන් කළ යුතුය.<br><br>දෙවන අදියර මගින් දුක්ගැනවිල්ලක් සඳහා පිළියම් සෙවීමේ දී සම්බන්ධ කරගත හැකි පුද්ගලයා වන්නේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ විද්‍යාඥයාය.<br><br>අවශ්‍ය නම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අදාළ කරුණ අදාළ ආයතව සමග සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ලබා ගනු ලැබේ. තවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ක්‍ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම සහ අවශ්‍ය නම් ක්ෂේත්‍රය තුළ සාකච්ඡා හා රැස්වීම පැවැත්වීම ද සිදු කෙරේ.<br><br>දෙවන අදියරෙහි දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණය හේතුවෙන් පීඩාවට පත් පුද්ගලයා මත කිසිදු පිරිවැයක් නොපැටවීමට වග බලා ගැනීමේ වගකීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සතු වන අතර<br><br>වැඩ කරන දින 15ක් තුළ පැමිණිල්ල ඉදිරිපත් විසඳුමක් ලැබිණි නම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් | |

| | | | |
|---|---|---|---|
| | | පීඩාවට පත් පාර්ශවය වෙත අදාළ තීරණය ලිඛිතව දැන්විය යුතුය.<br><br>පීඩාවට පත් පාර්ශවය විසින් තීරණය ලද බව දැන්විය යුතු අතර වැඩ කරන දින 10ක් තුළ ඔවුන්ගේ එකඟතාව හෝ එකඟ නොවීම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ යුතුය. මෙම කාල සීමාව තුළ කිසිදු ප්‍රතිචාරයක් ඉදිරිපත් නොකළේ නම් තීරණය පිළිගත් බවට සලකනු ලැබේ.<br><br>යම් පැමිණිල්ලක් සඳහා විසඳුම් ලබා දීමට වැඩිපුර කාලයක් අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් පීඩාවට පත් පාර්ශවය දැනුවත් කළ යුතු අතර පීඩාවට පත් පාර්ශවය ඊට එකඟ වී දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීමට අත්සන් තැබිය යුතුය. මෙලෙස කාලය දීර්ඝ කිරීම අමතර වැඩ කරන දින 15ක් සඳහා සිදු කළ හැකිය.<br><br>දුක්ගැනවිල්ල 2 වන අදියර වෙත ඉදිරිපත් කර වැඩ කරන දින 15ක් තුළ පීඩාවට පත් පාර්ශවය තෘප්තිමත් වන අයුරින් දුක්ගැනවිල්ල සඳහා පිළියම් ලබා ගැනීමට නොහැකි වුවහොත් 3 වන අදියර වෙත යාමේ අපේක්ෂාව පිළිබඳ පීඩාවට පත් පාර්ශවය විසින් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. | |

| | | | |
|---|---|---|---|
| තෙවන අදියර: දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය | අතිරේක ලේකම් (නාගරික සංවර්ධන), මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය සභාපති හා ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලැබේ | 2 වන අදියර මගින් පීඩාවට පත් පාර්ශවය තෘප්තිමත් වන අයුරින් දුක්ගැනවිල්ල සඳහා පිළියම් ලබා ගත නොහැකි වූයේ නම් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට පීඩාවට පත් පාර්ශවයට හැකිය.<br><br>දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශය, කාන්තා කටයුතු අමාත්‍යංශය, තක්සේරු දෙපාර්තමේන්තුව, නීතීඥයෙකු, විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකු සහ පිළිගත් සිවිල් සමාජ සංවිධානයක නියෝජිතයෙකුගෙන් සමන්විත වේ.<br><br>1වන අදියරෙහි හා 2වන අදියරෙහි පැමිණිලි ආකෘති පත්‍ර ඇතුළුව සියළු ලේඛනවල පිටපත් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) මණ්ඩලයේ සභාපති/ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබන අතර නඩුවක් ඇසීමට ඇති අවස්ථාවක ඔහු විසින් මණ්ඩලයේ සාමාජිකයන් රැස් | වැඩ කරන දින 15යි |

| | | | |
|---|---|---|---|
| | | කරනු ලැබේ.<br><br>දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය මගින් අදාළ කරුණ පිළිබඳ සම්බන්ධිත ආයතන සමග සාකච්ඡා කරනු ලැබේ; එසේම අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවක ක්ෂේත්‍රය තුළ සාකච්ඡා සහ රැස්වීම් පවත්වනු ලැබේ.<br><br>වැඩ කරන දින 15ක් තුළ පැමිණිල්ල සඳහා විසඳුමක් ලැබිණි නම් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලය මගින් ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දෙනු ලබන අතර එමගින් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ ස්වාධීන මණ්ඩලයේ තීරණය පීඩාවට පත් පාර්ශවය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.<br><br>පීඩාවට පත් පාර්ශවය විසින් තීරණය ලද බව දැන්විය යුතු අතර වැඩ කරන දින 10ක් තුළ ඔවුන්ගේ එකඟතාව හෝ එකඟ නොවීම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ යුතුය. පීඩාවට පත් පාර්ශවය විසින් කිසිඳු ප්‍රතිචාරයක් ඉදිරිපත් නොකළේ නම් තීරණය පිළිගත් බවට සලකනු ලැබේ.<br><br>යම් පැමිණිල්ලක් සඳහා විසඳුම් ලබා දීමට වැඩිපුර කාලයක් | |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් පීඩාවට පත් පාර්ශවය දැනුවත් කළ යුතු අතර පීඩාවට පත් පාර්ශවය ඊට එකඟ වී දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීමට අත්සන් තැබිය යුතුය. මෙලෙස කාලය දීර්ඝ කිරීම අමතර වැඩ කරන දින 15ක් සඳහා සිදු කළ හැකිය.<br><br>දුක්ගැනවිල්ල 3 වන අදියර වෙත ඉදිරිපත් කර වැඩ කරන දින 15ක් තුළ පීඩාවට පත් පාර්ශවය තෘප්තිමත් වන අයුරින් දුක්ගැනවිල්ල සඳහා පිළියම් ලබා ගැනීමට නොහැකි වුවහොත් 4 වන අදියර වෙත යාමේ අපේක්ෂාව පිළිබඳ පීඩාවට පත් පාර්ශවය විසින් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. | |
| සිව්වන අදියර: ව්‍යාපෘතියේ දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණයෙන් ඔබ්බට ගොස් අවදානමට ලක් විය හැකි පුද්ගලයන් සඳහා අධිකරණ බලය/ සහාය | අධිකරණ පද්ධතිය යනු අනෙකුත් අදියරයන් ඵලදායී නොවූ අවස්ථාවක පීඩාවට පත් පුද්ගලයෙකු හා/ හෝ ප්‍රජාවක් සඳහා විකල්පයකි. | සියළු පීඩාවට පත් පාර්ශවයන්ට නීති පද්ධතිය වෙත ප්‍රවේශය සහිතය.<br><br>මෙම දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ යාන්ත්‍රණය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහාය ලබා ගත හැක්කේ අවදානමට ලක් විය හැකි පුද්ගලයෙකු (පුද්ගලයන්) සඳහා පමණි.<br><br>පීඩාවට පත් පුද්ගලයා අවදානමට ලක් විය හැකි කණ්ඩායම්වලට අයත් වන්නේ | ස්ථාපිත අධිකරණ ක්‍රියාපාරිපාටිය ප්‍රකාරව |

| | | | |
|---|---|---|---|
| | | නම් ඔහු මත කිසිදු පිරිවැයක් නොපැටවීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වග බලා ගත යුතුය. අවදානමට ලක් විය හැකි කණ්ඩායම් ලැයිස්තුව පාද සටහනේ දක්වා ඇති පරිදි වන නමුත් එය මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය විසින් තවදුරටත් අර්ථ දැක්විය හැකිය.<br><br>අධිකරණවල තීන්දුව අවසන් තීරණය වන්නේය. | |

* අවදානමට ලක් විය හැකි පුද්ගලයා (පුද්ගලයන්): මෙම ව්‍යාපෘතිය සඳහා අවදානමට ලක් විය හැකි පුද්ගලයා යනු ශාරීරිකව හෝ මානසිකව ආබාධිත තත්වයට පත් වූවකු, අසරණයකු, අනාථයෙකු, වැන්දඹුවක්, වයස අවුරුදු  හැටට වැඩි පුද්ගලයෙකු හෝ ගෘහ මූලිකයා වන කාන්තාවකි.

මීට අමතරව, පීඩාවට පත් පාර්ශවය විසින් සමථ මණ්ඩලය, අධිකරණ අමාත්‍යංශය මගින් දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීම පිණිස පත් කරන ලද ගැටුම් නිරාකරණය කිරීමේ කමිටුව ප්‍රයෝජනයට ගත හැකිය. අධිකරණ පද්ධතිය තෝරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදු වන වියදම් හැරුණු කොට විසඳුම් ලබා ගැනීමට අදාළ කිසිදු ගාස්තුවක් පීඩාවට පත් පාර්ශවයකට දැරීමට සිදු නොවේ.

# අටවන පරිච්ඡේදය

# ආදායම් යළි යථා තත්වයට පත් කිරීමේ උපායමාර්ග

මෙම ව්‍යාපෘතිය බලපෑමට ලක් වූ ජනතාව සඳහා සංවර්ධනය වීම පිණිස වන අවස්ථාවක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සලකනු ලැබේ. ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ප්‍රමාණවත් හා නිසි කලට ලබා දෙන වන්දි, ආදායම් යථා තත්වයට පත් කිරීමේ වැඩසටහන්, අවදානමට ලක් විය හැකි කණ්ඩායම් පුනරුත්ථාපනය සහ ඉදි කෙරෙමින් පවතින සහාධිපත්‍ය වැඩ බිම් තුළ ඉදිකිරීම්වලට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වූ රැකියා ආකාරයට ආයතනික මැදිහත්වීම් හරහා බලපෑමට ලක් වූ පුද්ගලයන් වෙත ලැබෙනු ඇත.

### 8.1 අපේක්ෂිත හානි

නැවත පදිංචි කිරීම හේතුවෙන් ගෘහ ඒකක හතක් ආදායම් මාර්ග අහිමි වීමට ඉඩ ඇති පවුල් ලෙස සලකන (නැවත පදිංචි කිරීමේ සැලැස්මේ වන්දි න්‍යාසයේ හඳුනාගෙන ඇති [ඇමුණුම 1] පරිදි) අතර, ඇස්තමේන්තු ගත ආදායම් අහිමි වීම මත පදනම්ව ඔවුන්ට වන්දි ලබාදෙනු ඇත. මින් ගෘහ ඒකක හයක් තම ආදායම් ප්‍රතිෂ්ඨාපනය සඳහා රු. 50,000 ක මුදල් ප්‍රදානයකට හෝ නාගරික සංවර්ධන අධිකාරි විසින් තීරණය කරන ලෙස ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා සුදුසු ඉඩ අවකාශයක් ලබා දීමට හිමිකම ඇත.

## 8.2 අවදානමට ලක් විය හැකි පවුල්

අවදානමට ලක් විය හැකි පවුල් අඛණ්ඩව රජයෙන් සැපයෙන සහනාධාර ලබනු ඇති අතර ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා අදායම යථා තත්වයට පත් කිරීමේ වැඩසටහනේ සහාය ද ලැබෙනු ඇත. ආබාධිත පුද්ගලයන්ට සමාජ සේවා

දෙපාර්තමේන්තුව හරහා සහාය ලබා දෙනු ලැබේ.ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේව නිලධාරියා බලපෑමට ලක් වූ පවුල් හා සමාජ සේවා දෙපාර්තමේන්තුව අතර සංවාදකයා ලෙස කටයුතු කරයි.

## 8.3 ආදායම යථා තත්වයට පත් කිරීමේ වැඩසටහන් සඳහා වන උපායමාර්ග

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මේ සමීක්ෂණ, පුනර්ජනනීය සමීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරියේ සමාජ කණ්ඩායම් විසින් එක්රැස් කළ ප්‍රමාණාත්මක තොරතුරු පදනම් ව තම ව්‍යාපාරයන් බලපෑමට ලක්වූ පුද්ගලයින් හට ගෙවීමක් ප්‍රදානය කරනු ඇත.

සුදුසුකම් ලබන ගෘහ ඒකකවල ආදායම යථා තත්වයට පත් කිරීම/ වැඩි දියුණු කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

- ප්‍රතිලාභීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම
- විකල්ප රැකියාවන් සඳහා නිපුණතා සංවර්ධනය
- විකල්ප ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට හෝ පවතින ව්‍යාපාර වැඩි දියුණු කිරීමට සහාය ලබා දීම
- අවශ්‍ය නම් මූල්‍ය ආයතන වෙතින් ණය ලබා ගැනීමට ඔවුන්ට උපකාර කිරීම
- තොරතුරු ලබා ගැනීමේ පද්ධතියක් සකස් කිරීම

## 8.4: ආදායම් ප්‍රතිසාධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම

නිපුණතා වැඩිදියුණු කිරීම හා ආදායම ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් උපයෝගි කරගන්නා ක්‍රමවේදය 5.3 වගුවෙහි දක්වා ඇත. ආදායම් ප්‍රතිස්ථාපන ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ සමාජ කණ්ඩායම සම්පත්වල සහ බාහිර උපදේශකවරුන්ගේ සහාය අවැසි පරිදි ලබාගනු ඇත.

## 8.5 ආදායම ප්‍රතිසාධන වැඩසටහනට සම්බන්ධ විය හැකි ආයතන

- ණය ලබා දෙව ආයතන
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
- අදාළ රාජ්‍ය නොවන සංවිධාන

# නව වන පරිච්ඡේදය

# ආයතනික රාමුව

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සමබන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්) වෙත පැවරේ. නාගරික සංවර්ධන අධිකාරියෙහි සමාජ හා පරිසර අංශය ක්‍රියාත්මක කෙරෙන්නේ ඔහු යටතේය. සහාය කාර්ය මණ්ඩලය ද සමග සමාජ විද්‍යාඥ හා සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉඩම් විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්) වෙත සහාය ලබා දෙනු ලැබේ. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (කාර්මික) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්මික කරුණු භාරව කටයුතු කරයි.

කාර්මික කාර්ය මණ්ඩලයක සහාය ඇතිව නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික) විසින් ඉදිකිරීම් වැඩසටහන් සම්බන්ධීකරණය කරනු ලැබේ. නාගරික සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ බලතල හිමි වන අතර ඔහු නාගරික සංවර්ධන අධිකාරියෙහි සභාපති හරහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් වෙත වාර්තා කරනු ලබන ප්‍රධාන විධායක නිලධාරියා ද වේ.

කාර්මික, සමාජීය, ඉඩම් පරිපාලන හා මූල්‍ය යන විෂයන්ට අදාළ විශේෂඥයින්ගේ සහාය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබෙනු ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා නිලධාරීන් හා ඉඩම් හා සමාජ අලෙවිකරණ නිලධාරීන් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ඇත.

## 9.1: නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනික කටයුතු

**9. 1 වගුව:** ක්‍රියාකාරකම් හා වගකීම්

| ක්‍රියාකාරකම | ක්‍රියාව |
|---|---|
| නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියෙහි දක්වා ඇති නිර්ණායක මත පදනම්ව වෙනත් ස්ථානයකට ගෙන යා යුතු පවුල් හඳුනා ගැනීම | සමාජ සේවා නිලධාරී - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| තොරතුරු බෙදාහැරීම හා යාවත්කාලීන කිරීම සහ පාර්ශවකරුවන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම. | සමාජ සේවා නිලධාරී, ඉඩම් නිලධාරී හා උපදේශකන් **නැවත පදිංචි කිරීම – ව්‍යාපෘති කළමනාකරණ ඒකකය**- නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - **නාගරික සංවර්ධන අධිකාරිය** |
| මහජන තොරතුරු මධ්‍යස්ථානය (PIC) ස්ථාපිත කිරීම හා තොරතුරු සපයන ලේඛන ඇතුළු දේ සකස් කිරීම. | **අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්)** - නාගරික නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන |

| | |
|---|---|
| | අධිකාරිය |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අංශ ස්ථාපිත කිරීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| හිමිකම් නොමැති බලපෑමට ලක් වූ අවතැන් වූ ජනතාව වෙත විකල්ප වාසස්ථාන වෙන් කර දීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| බලපෑමට ලක් වූ ජනතාවහට බලපෑමට ලක් වූ පරිශ්‍රයන්ගෙන් සම්පූර්ණයෙන් ඉවත් වීම සඳහා ප්‍රමාණවත් කාලයක් (අවම වශයෙන් සති 2ක්) ලබා දීම. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| නව නිවාස වෙත යාම සඳහා බලපෑමට ලක් වූ ජනතාවහට උපකාර කිරීම. | පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය- ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සමාජ සේවා කාර්ය මණ්ඩලයෙහි සහාය ඇතිව ව්‍යාපෘති අධ්‍යක්ෂ |

| | |
|---|---|
| සත්කාරක ප්‍රජාව සමග අනුකලනය වීම සඳහා බලපෑමට ලක් වූ ජනතාවහට සහාය ලබා දීම. හුරු කරවීමේ ක්‍රියාකාරකමක් ලෙස සංවාද සඳහා නැවත පදිංචි කිරීමට නියමිත පවුල්වල නියෝජිතයන් සත්කාරක ප්‍රජාව සමග මුණ ගැසීමට සැලැස්වීම. | සමාජ සේවා කාර්ය මණ්ඩලය – ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| ආදායම් ප්‍රතිසාධනය පිළිබඳ කටයුතු කිරීම | සැලසුම් නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික **පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය** |
| **නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි විස්තර කර ඇති පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ගැටළු පිළිබඳ කටයුතු කිරීම.** | සැලසුම් නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| බලපෑමට ලක් වූ ජනතාවහට ඔවුන්ගේ දරුවන් ඔවුන් රැගෙන යාමට නියමිත ස්ථානවල පිහිටි පාසල්වලට ඇතුළත් කිරීමේ දී ගැටළුවලට මුහුණ පෑමට සිදු වුවහොත් ඒ සඳහා උපකාර කිරීම. | සමාජ සේවා නිලධාරී- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| **දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ** | ව්‍යාපෘති අධ්‍යක්ෂ - |

| | |
|---|---|
| **කමිටු ස්ථාපිත කිරීම හා කටයුතු අධීක්ෂණය කිරීම** | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| **කාන්තාවන් හා දිළඳු පුද්ගලයන ඇතුළු අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සඳහා සහාය ලබා දීම** | සමාජ සේවා නිලධාරී- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| ප්‍රවාහන දීමනා දහ වෙනත් අදාළ ගෙවීම් සිදු කිරීමට කටයුතු කිරීම. උදා: තම ව්‍යාපාරවලට බලපෑම් සිදු වන බලපෑමට ලක් වූ පුද්ගලයන් දෙදෙනා සඳහා අහිමි වූ ආදායම ගෙවීම.<br><br>බලපෑමට ලක් වූ එක් එක් පුද්ගලයා සඳහා ගොණුවක් පවත්වාගෙන යාම. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය<br><br>සමාජ සේවා නිලධාරී- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික සංවර්ධන අධිකාරිය |
| කලින් සම්පූර්ණ මුදල ගෙවා ඇත්නම් නව බද්ධ නිවාස සඳහා ඔප්පු නිකුත් කිරීම. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන |

| | |
|---|---|
| | අධිකාරිය |
| අදාළ නියෝජිතායතන සමග ජාලකරණය මගින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) පවත්වාගෙන යාම. | තොරතුරු තාක්ෂණ නිලධාරී - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අභ්‍යන්තර වශයෙන් සහ බාහිර අධීක්ෂකයන් මගින් අධීක්ෂණය කිරීම හා පාර්ශවකරුවන්ගෙන්, විශේෂයෙන් බලපෑමට ලක් වූ ජනතාවගෙන් ප්‍රතිචාර ලබා ගැනීම.<br><br>අනාගත නැවත පදිංචි කිරීමේ වැඩසටහන් සඳහා පාඩම් ඉගෙන ගැනීම. එසේම **තවදුරටත් වැඩි දියුණු කළ හැකි කරුණු හා දෝෂ නැවත සිදු වීම වැළැක්වීම සඳහා අවධානය යොමු කළ යුතු අවභාවිතාවන්.** | අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| මනා මුදල් ප්‍රවාහ පවත්වා ගෙන යාම සඳහා අරමුදල් ගලා ඒම තහවුරු කිරීම. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - **නාගරික** පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |
| කලින් කලට අවශ්‍ය වන වාර්තා සකස් කිරීම හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන | ව්‍යාපෘති අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ |

| | |
|---|---|
| බැංකුව ඇතුළුව අදාළ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කිරීම. | ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය |

සටහන: වගකීම් බෙදා හැරීම පිළිබඳ නාගරික **පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ** අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්) ගේ කැමැත්ත සහිතව එකඟ විය.

ක්‍රියාත්මක කිරීමේ සැලසුම මගින් එක් එක් ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීම සඳහා වන කාල රාමුව දැක්වේ. සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සඳහා කාර්ය මණ්ඩලය වෙන් කිරීම සමග නැවත පදිංචි කිරීමේ කාර්යයන් ආරම්භ වනු ඇත. (කරුණාකර 9 වන පරිච්ඡේදය, ක්‍රියාත්මක කිරීමේ සැලසුම බලන්න)

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිඵල ළඟා කර ගැනීමේදී අදාළ නියෝජිතායතන කිහිපයක් සමග සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

නැවත පදිංචි කිරීමේ මැදිහත් වීම්වලට සෘජුව සම්බන්ධ වන ප්‍රධාන රාජ්‍ය ආයතන පහත දැක්වේ:

9. 2 වගුව: **නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය ආයතනවල කාර්යයන්**

| | |
|---|---|
| මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය | ප්‍රතිපත්ති සැලසුම් කිරීම, අරමුදල් රැස් කිරීම, ඒ යටතේ ඇති සංවිධාන වෙත ප්‍රතිපත්ති නියමයන් නිකුත් කිරීම, අධීක්ෂණය හා පරිපාලනය. |
| නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - නාගරික සංවර්ධන අධිකාරිය | මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශයෙහි ප්‍රතිපත්ති නියමයන් ක්‍රියාත්මක කිරීම. මහ නගර හා බස්නාහිර |

| | |
|---|---|
| | සංවර්ධන අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක වන රජයේ අරමුණු ළගා කර ගැනීම සඳහා එහි කළමනාකාරීත්වය යටතේ වන අංශ වෙත මග පෙන්වීම. |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | ව්‍යාපෘතිය සඳහා සැලසුම් සකස් කිරීම |
| තක්සේරු දෙපාර්තමේන්තුව | වන්දි ගෙවීම සඳහා නිවාස තක්සේරු කිරීම. |
| මධ්‍යම පරිසර අධිකාරිය | ව්‍යාපෘතිය නියම කළ ව්‍යාපෘතියක කාණ්ඩය යටතට ගැනේ නම් මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කළ යුතු අතර පාරිසරික බලපෑම් ඇගයුම් වාර්තාව සකස් කිරීම සඳහා මාර්ගෝපදේශයන් නිකුත් කළ යුතුය. |
| ලංකා විදුලිබල මණ්ඩලය | ව්‍යාපෘති කාර්යයන් තවදුරටත් සිදු කිරීම සඳහා ව්‍යාපෘති සීමාවන් හරහා ගමන් කරන විදුලි රැහැන් වෙනත් දිශාවකට යොමු කිරීම. බලපෑමට ලක් වූ ජනතාවගේ බද්ධ නිවාස සඳහා විදුලි බලය සැපයීම. |
| ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ව්‍යාපෘති සීමාවන් හරහා ගමන් කරන ජල නළ වෙනත් දිශාවකට ගෙන යෑම. සහාධිපත්‍ය ඉදිකිරීම් අඛණ්ඩව සිදු කරගෙන යාම හා බද්ධ නිවාස ඒකකවල පදිංචි වීමට පෙර බලපෑමට ලක් වූ ජනතාව වෙත ජලය සැපයීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් |

| | |
|---|---|
| | ව්‍යාපෘතිය සඳහා සහාය ලබා දෙනු ලැබේ. |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | විදුලි සංදේශ පහසුකම් සැපයීම. මෙම සේවාව පුද්ගලික විදුලි සංදේශ සේවා සපයන්නන්ගෙන් ද ලබා ගත හැකිය. |

# දස වන පරිච්ඡේදය
# ක්‍රියාත්මක කිරීමේ සැලසුම

එක් එක් ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීම සඳහා වන කාල රාමුව ක්‍රියාත්මක කිරීමේ සැලසුමෙහි දැක්වේ. සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සඳහා කාර්ය මණ්ඩලය වෙන් කිරීමත් සමග නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ.

10. 1 වගුව: නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි සංරචකයන් ක්‍රියාත්මක කිරීමේ කාලානුක්‍රමික අනුපිළිවෙල, වගකිව යුතු පුද්ගලයා/ සංවිධානය හා කාල රාමුව

| අංකය | ක්‍රියාව | වගකීම | කාලය |
|---|---|---|---|
| පොදු ක්‍රියාවන් සඳහා වන අනුපිළිවෙල | | | |
| 1 | වෙනත් ස්ථානයකට ගෙන යාමට නියමිත පවුල් ලැයිස්තුවක් සකස් කිරීම | සමාජ සේවා නිලධාරී- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික සංවර්ධන අධිකාරිය | 2018 අගෝස්තු මස සම්පූර්ණ කෙරිණි |
| 2 | වෙනත් ස්ථානයකට ගෙන යාම පිළිබඳ තාර්කිකත්වය පැහැදිලි කිරීම හා බලපෑමට ලක් වූ පවුල් සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන | සමාජ සේවා නිලධාරී, ඉඩම් නිලධාරී හා උපදේශක - නැවත පදිංචි කිරීම- ව්‍යාපෘති කළමනාකරණ | 2018.10.10 |

| | | | |
|---|---|---|---|
| | | ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික සංවර්ධන අධිකාරිය | |
| 3 | වෙනත් ස්ථානයකට ගෙන යාම පිළිබඳ නිවසින් නිවසට ගොස් අදහස් විමසීම | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය | 2018.10.12 දින සිට ඉදිරියට |
| 4 | බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ වත්කම් අහිමි වීම හා සමාජ ආර්ථික පැතිකඩ පිළිබඳ දත්ත රැස් කිරීම | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය හා උපදේශකයන් - නැවත පදිංචි කිරීම | 2018.10.16 – 2018.10.19 |
| 5 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජිතයන් සමග නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදි කරන ලද දැනට පවතින සහාධිපත්‍යයක් වෙත හුරුකරවීම සඳහා රැගෙන යාම. | සමාජ සේවා කාර්ය මණ්ඩලය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- නාගරික සංවර්ධන අධිකාරිය | 2018.10.24 |
| 6 | සත්කාරක ප්‍රජාවගේ අදහස් විමසීම (හඳුනා ගත් සහාධිපත්‍යයෙහි දැනටමත් පදිංචි වී සිටින්නන්) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා නිලධාරීන් | 2018.10.24 |

| | | | |
|---|---|---|---|
| 7. | ක්ෂේත්‍ර කාර්යාලය ස්ථාපිත කිරීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.10.24 |
| 8. | සිරස් ගොඩනැගිල්ලක ජීවත් වීම හා නව පහසුකම් භාවිතා කිරීම පිළිබඳ බලපෑමට ලක් වූ ජනතාව දැනුවත් කිරීම සඳහා උපදේශක රැස්වීම් | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා නිලධාරීන් | 2018.11.15 සිට |
| 9 | කලින් සිදු කරන ගෙවීම් පිළිබඳ බලපෑමට ලක් වූ ජනතාව වෙත දැනුම් දීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.11.20 |
| 10 | කලින් සිදු කරන ගෙවීම් පිළිගැනීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.11.20 සිට 2018.11.30 දක්වා |
| 11 | වෙනත් ස්ථානයක පදිංචි කිරීමට කැමැත්ත පළ කරන බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ නිවාස තක්සේරු කිරීම. | තක්සේරු දෙපාර්තමේන්තුව - නාගරික පුනර්ජනන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.11.20 සිට 2018.11.30 දක්වා |
| 12 | නිවාසලාභීන් (බද්ධ නිවාස ඒකක) සමග | ව්‍යාපෘති අධ්‍යක්ෂ - | දෙසැම්බර් |

| | | | |
|---|---|---|---|
| | කුළී සින්නක්කර ගිවිසුමකට එළඹීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය-ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 1 දින සිට ඉදිරියට |
| 13 | නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති සූත්‍රය අනුව නිවාස ඒකක වෙන් කිරීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ හා සමාජ සේවා කාර්ය මණ්ඩලය-නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය-ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.12.01 සිට |
| 14 | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද තක්සේරුව පිළිබඳ නිවාසලාභීන්හට දැනුම් දීම | අධ්‍යක්ෂ - නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.12.15 |
| 15 | නිවාසලාභීන් වෙත සහාධිපත්‍යයන්හි නිවාස ඒකක ලබා දීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ, සමාජ සේවා කාර්ය මණ්ඩලය හා ක්ෂේත්‍ර කළමනාකරු | 2018.12.20 |
| 16 | බලපෑමට ලක් වූ පුද්ගලයන් වෙත වන්දි ගෙවීම (ප්‍රවාහන, ජීවනෝපාය ආදිය) | ව්‍යාපෘති අධ්‍යක්ෂ - නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.12.25 |

| | | | |
|---|---|---|---|
| 17 | නිවාස ඒකකලාභීන් නව බද්ධ නිවාස වෙත ගෙන යෑම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය-නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සමාජ සේවා කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ව්‍යාපෘති අධ්‍යක්ෂ | 2018.12.25 සිට 2018.12.31 දක්වා |
| 18 | පදිංචිකරුවන් එළිපෙහළි කළ ප්‍රදේශයෙන් ඉවත් කර නව බද්ධ නිවාස වෙත රැගෙන යාමෙන් පසු අදාළ භූමිය අත්පත් කර ගැනීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ හා සමාජ සේවා කාර්ය මණ්ඩලය නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2018.12.25 සිට 2018.12.31 දක්වා |
| 19. | තමන් කලින් පදිංචි වී සිටි ස්ථානවලින් ඉවත් වූ වහාම බද්ධ නිවාසවල පදිංචි වීමට නොහැකි බලපෑමට ලක් වූ පවුල් සඳහා කුළී දීමනාවක් ගෙවීම | ව්‍යාපෘති අධ්‍යක්ෂ හා සමාජ සේවා කාර්ය මණ්ඩලය-නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2019.01.01 |
| 20. | සහාධිපත්‍ය කළමනාකරණ කමිටුව | නාගරික | 2019.01.15 |

| | | | |
|---|---|---|---|
| | ස්ථාපිත කිරීම | පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය සහ නෛතික ගැටළු විසඳා ගැනීමෙන් පසු බලපෑමට ලක් වූ පුද්ගලයන් | |
| 21 | තමන් විසින් ම වෙනත් ස්ථානයකට යාමට එකඟ වූ බලපෑමට ලක් වූ පුද්ගලයන්හට නිවෙස්වල වටිනාකම ගෙවීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ සමාජ සේවා කාර්ය මණ්ඩලය | 2019.01.20 |
| 22 | අභියාචනා මණ්ඩලය ස්ථාපිත කිරීම | **නාගරික සංවර්ධන අධිකාරියෙහි** අධ්‍යක්ෂ ජනරාල් | 2016.02.01 |
| 23 | අභියාචනා භාර ගැනීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ | 2019.02.15 සිට |
| 24. | වෙන් කළ සහාධිපත්‍යයන්හි විකල්ප | නාගරික | 2019 |

| | | | |
|---|---|---|---|
| | නිවාස ඒකකවල වහාම පදිංචි වීමට කැමැත්ත පළ කළ පවුල් සඳහා දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීමේ කමිටු ස්ථාපිත කිරීම | පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ හා **නාගරික සංවර්ධන අධිකාරියෙහි** අධ්‍යක්ෂ ජනරාල් | පෙබරවාරි |
| 25 | නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලය පුරාවට දුක්ගැනවිලි සඳහා පිළියම් ලබා දීම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ සමාජ සේවා කාර්ය මණ්ඩලය | 2019 පෙබරවාරි මස සිට ඉදිරියට |
| 26 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම | සැලසුම් නිලධාරී - නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2019 පෙබරවාරි මස සිට ඉදිරියට |
| 27 | කාන්තා සංවර්ධන කමිටු ස්ථාපිත කිරීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය | 2019 පෙබරවාරි මස සිට ඉදිරියට |

| | | | |
|---|---|---|---|
| | | මණ්ඩලය | |
| 28 | සකසුරුවම් හා සමූපාකාර සමිති ස්ථාපිත කිරීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය හා බලපෑමට ලක් වූ ජනතාව | 2019 මාර්තු |
| 29 | බලපෑමට ලක් වූ ජනතාව සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ජීවනෝපාය පුහුණු, අත්වැලක් සැපයීම ආදිය) | උපදේශක ඒකකයේ ප්‍රධාන දත්ත නිලධාරී (CDO), නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය සහ බලපෑමට ලක් වූවන් | 2019 මාර්තු |
| 30 | නැවත පදිංචි කරන බලපෑමට ලක් වූ ජනතාවගේ ජීවනෝපාය හා යහ පැවැත්ම අධීක්ෂණය කිරීම | නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ සේවා කාර්ය මණ්ඩලය | 2019 අප්‍රේල් සිට |

| | | | |
|---|---|---|---|
| 31 | ස්වාධීන අධීක්ෂණ ක්‍රියාවලියක් හරහි නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම | ස්වාධීන අධීක්ෂක | 2018 අප්‍රේල් සිට 2019 මාර්තු දක්වා<br>--------------<br>2022 අප්‍රේල් සිට 2022 මාර්තු දක්වා<br><br>(තාවකාලික නවාතැන් වල පදිංචි වී සිටීමෙන් අනතුරුව ඔවුන් පදිංචි වූ ස්ථානයේ ඉදි කළ බද්ධ නිවාසවල නැවත පදිංචි කළ පුද්ගලයන් සඳහා) (ව්‍යාපෘති කළමනාක |

| | | | |
|---|---|---|---|
| | | | රණ ඒකකය මගින් සපයනු ලබන කුළී දීමනාවෙන් කුළියට ගත් නිවාස) |
| 32. | අභියාචනා පිළිබඳ තීරණය කිරීම | දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය හරහා | 2019 මැයි - ජූනි දක්වා |

| අයිතමය | ඒකකය/ සංඛ්‍යාව | ප්‍රමාණය/ බලපෑමට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව | ඒකකයක පිරිවැය/ අනුපාතය (රු) | මුදල රු. | මුදල ඩොලර් |
|---|---|---|---|---|---|
| | | | | | |
| ප්‍රවාහන දීමනාව | පවුල් | 38 | 5,000 | 190,000 | 1,056 |
| ආදායම අහිමි වීම | පවුල් | 2 | 18,000 | 36,000 | 200 |
| කුළී දීමනාව i | පවුල් | 10 | 8,000*36 | 2,880,000 | 16,000 |
| ආදායම ප්‍රතිසාධනය ii | පවුල් | 6 | එකවර දෙන මුදල | 500,000 | 2,778 |
| | | | | | |
| දුක්ගැනවිලි විසඳීමේ කමිටුව iii | රැස්වීම් වාර ගණන | 24 | 10,000 | 240,000 | 1,333 |
| බාහිර අධීක්ෂණය iii | මිනිස් මාස | 24 | 300,000 | 7,200,000 | 40,000 |
| මුළු එකතුව | | | | 11,046,000 | 61,367 |
| අවිනිශ්චිතතා | සියයට 20 | | | 2,209,200 | 325,936 |
| එකතුව | | | | 13,255,200 | 73,640 |

මූලාශ්‍රය: නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ

නැවත පදිංචි කිරීමේ ප්‍රධාන කාර්යයන් සඳහා වන කාල රාමුව 10.1 වගුවෙහි දැක්වේ. බලපෑමට ලක් වූවන් වෙත තොරතුරු බෙදා හැරීම සඳහා දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීමත් සමග නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ.

ඉදි කිරීම් කඩා ඉවත් කිරීමට පෙර බලපෑමට ලක් වූවන්ගේ අදහස් විමසීම, සම්පූර්ණ වන්දිය ගෙවීම හා තමන් විසින් ම නිවාස නැවත ඉදි කිරීමට අවශ්‍ය පුද්ගලයන් සඳහා කාලය තීරණය කර එකඟතාවකට එළඹීම සිදු කරනු ලැබේ. අනෙක් අය සඳහා ඉවත් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙනු ලැබේ. (අවම වශයෙන් දින 14ක්)

# එකොළොස් වන පරිච්ඡේදය
# නැවත පදිංචි කිරීමේ අයවැය

| අයිතමය | ඒකකය / අංකය | ප්‍රමාණය / ඒකක ගණන | ඒකකයක පිරිවැය / අනුපාතය | ප්‍රමාණය | ප්‍රමාය ඩොලර්වලින් |
|---|---|---|---|---|---|
| ප්‍රවාහන දීමනා | ගෘහ ඒකක | 38 | 5,000 | 185,000 | $ 1,022 |
| ආදායම් අහිමිවීම | ගෘහ ඒකක | 7 | වෙනස්විය හැක | 660,000 | $ 3,646 |
| කුලී දීමනාව | ගෘහ ඒකක | බලපෑමට ලක්වූ නිවාස ඒකක 10, මසෙ 36 | 15,000 | 5,400,000 | $ 29,834 |
| ආදායම් ප්‍රතිෂ්ඨාපනය | ගෘහ ඒකක | 6 | 50,000 | 300,000 | $ 1,657 |
| දුක්ගැනවිලි විසඳීමේ කමිටුව | රැස්වීම් වාර ගණන | 24 | 10,000 | 240,000 | $ 1,326 |
| බාහිර අධීක්ෂණය | මිනිස් මාස | 24 | 300,000 | 7,200,000 | $ 39,779 |
| අනු එකතුව | | | | 13,985,000 | $ 77,265 |
| අවිනිශ්චිතතාවයන් | සියයට 20 | | | 2,797,000 | $ 15,453 |
| එකතුව | | | | 16,782,000 | 92,718 |

* මෙය තාවකාලික වන අතර එය අදාළ වන්නේ නිදහස් කරගත් ඉඩමෙහි බද්ධ නිවාස ඒකක ඉදි කරන ලෙස බලපෑමට ලක් වූවන් ඉල්ලීමක් කළහොත්ය. තමන්ගේ කුළී නිවස අහිමි වනු ඇති අවිවාහක කාන්තාව සඳහා වන කුළී දීමනාව අවිනිශ්චිතතා මගින් ලබා දිය හැකිය.

i. ඇස්තමේන්තුව

ii. අවදානමට ලක් විය හැකි පවුල් 4ක් ඇතුළත්වේ

iii. ඇස්තමේන්තුව

1 වන සටහන: අභ්‍යන්තර අධීක්ෂණය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදු කෙරේ. නැවත පදිංචිය කිරීමේ අයවැය මගින් ප්‍රතිපාදන කිසිවක් වෙන් නොකෙරේ. ඔවුන්ගේ වැටුප් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පුනරාවර්තන වියදම්වල ඇතුළත්වේ.

2 වන සටහන: ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කාන්තාවන්ගේ ආදායම ඉහළ නැංවීමට අරමුදල් අවශ්‍ය වේ නම් අවිනිශ්චිතතා යටතේ සැපයෙන ප්‍රතිපාදන යොදා ගත හැකිය.

ඇ.ඩො. 1 = රු.181.00

# දොළොස්වන පරිච්ඡේදය

# අධීක්ෂණය, ඇගයීම හා වාර්තාකරණය

අධීක්ෂණ වැඩසටහන ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමට ඉවහල් වනු ඇති අතර එමගින් ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු හඳුනා ගනු ලැබේ. නැවත පදිංචි කිරීම අධීක්ෂණය නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව නැවත පදිංචි කිරීමේ ප්‍රගතිය සඳහා තොරතුරු රැස් කිරීම, සැකසීම, විශ්ලේෂණය, වාර්තාකරණය හා භාවිතය යනාදියෙන් සමන්විත වේ. එමගින් භෞතික හා මූල්‍ය ඉලක්ක සහ අවතැන් වූවන් සඳහා හිමිකම් ලබා දීම ආවරණය කෙරේ.

## 12.1 අභ්‍යන්තර අධීක්ෂණය

අභ්‍යන්තර අධීක්ෂණය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදු කරනු ලැබේ. නාගරික සංවර්ධන අධිකාරිය විසින් පත්කළ සමාජ විශේෂඥයා විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ක්‍රියාත්මක කිරීම, සිවිල් වැඩ සැලසුම් කිරීම, කොන්ත්‍රාත්කරුවන්ගේ භූමිකාව  අධීක්ෂණය කිරීම, උපදේශකවරුන්ගෙන් අපේක්ෂිත සුරක්ෂිතතා හා ඔවුන්ගේ නිපැයුම් අධීක්ෂණය හා කළමනාකරණ කිරීම, යෝග්‍යතා ලැයිස්තුව සකස් කිරීමට අදාළ ප්‍රගතිය වාර්තාගත කිරීම, තොරතුරු අනාවරණය හා අදහස් විමසීම, දුක්ගැනවිලි ලියාපදිංචි කිරීම හා විසඳීම, හිමිකම් ලබා දීම, පුද්ගලයන් වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා එදිනෙදා සහාය ලබා දීම ආදිය ඇතුළුව නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව නිසි කලට සුරක්ෂිතතා කටයුතු සිදු කිරීම පිළිබඳ අභ්‍යන්තර අධීක්ෂණය මගින් අවධානය යොමු කරනු ලැබේ.

එක් සමාජ සේවා නිලධාරියෙකු විසින් බලපෑමට ලක් වූ එක් එක් පවුල් සඳහා ගොණුවක් සහිතව ව්‍යාපෘති දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. අදාළ නියෝජිතායතන වෙතින් තොරතුරු රැස් කරනු ලබන බැවින් බලපෑමට ලක් වූ පවුල්

හා පවුල්වල සාමාජිකයන් පිළිබඳ දත්ත යාවත්කාලීන කරනු ලැබේ. බලපෑමට ලක් වූ පවුල සඳහා ලබා දෙන සහාය දත්ත පද්ධතිය තුළ වාර්තා විය යුතුය. පුද්ගලයන් හා තනි පවුල්වල තොරතුරු රහස්‍ය වන අතර එම තොරතුරු සඳහා ප්‍රවේශය අවශ්‍ය වන ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලයට පමණක් ලබා ගත හැකි වනු ඇත. එම තොරතුරු නාගරික සංවර්ධන අධිකාරිය, මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය හෝ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ වෙබ් අඩවිවල පළ කරනු නොලැබේ.

වෙනත් ස්ථානයකට ගෙන යනු ලබන පවුල් සහාධිපත්‍ය අරමුදල, නඩත්තු වියදම් ආදිය ගෙවීම පිළිබඳ විස්තර දැක්වෙන ඒකාබද්ධ මාසික ප්‍රකාශයක් සහාධිපත්‍යයේ ක්ෂේත්‍ර කළමනාකරු විසින් දත්ත කළමනාකරු වෙත ඉදිරිපත් කරනු ලැබේ. නැවත පදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඒකාබද්ධ වාර්තා (පවුල් නිශ්චිතව හඳුනාගත හැකි නම් හෝ වෙනත් තොරතුරු මෙහි ඇතුළත් නොවේ) මහජනතාවට ලබා ගත හැකි පරිදි තැබිය හැකිය.

දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපාරිපාටි සඳහා විශේෂ දත්ත පද්ධතියක් සකස් කරනු ලැබේ. දුක්ගැනවිලි විසඳීමේ කමිටුවෙහි ලේකම් විසින් පැවැත්වූ දුක්ගැනවිලි විසඳීමේ කමිටු රැස්වීම් ගණන, විවිධ මට්ටම්වලදී විසඳන ලද දුක්ගැනවිලි ගණන හා විසඳීම සඳහා ඉතිරිව ඇති පැමිණිලි ගණන පිළිබඳ විස්තර සහිතව එම කමිටුවේ කටයුතු පිළිබඳ මාසික වාර්තාවක් දත්ත කළමනාකරු වෙත යවනු ලැබේ. පුද්ගලික දුක්ගැනවිලි පිළිබඳ මහජනතාවට දැන ගැනීමට අවස්ථාවක් ලබා නොදේ. කෙසේ වුවද, පැමිණිලිකරුවන් හඳුනා ගැනීමට හැකියාවක් නොමැති දුක්ගැනවිලි පිළිබඳ සංක්ෂිප්ත වගුවක් මහජනතාවගේ දැන ගැනීම පිණිස ලබා දෙනු ලැබේ.

අභ්‍යන්තර අධීක්ෂණය මගින් පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ:

- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම කාර්යක්ෂම හා ඵලදායී ලෙස එදිනෙදා සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- වන්දි හා වෙනත් දීමනා සහ ප්‍රතිලාභ ලබා දීමේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය

- දත්ත රැස් කිරීම, ප්‍රතිචාර පිළිබඳ තොරතුරු, අවහිරතා හඳුනා ගැනීම හා දෝෂ සෙවීම
- දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම සඳහා වාර්තාගත කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු සඳහා කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීම
- බලපෑමට ලක් වූ එක් එක් පවුලේ පුද්ගලික හා හිමිකම් ගොණුව පවත්වාගෙන යාම
- සමාජ-ආර්ථික තත්වයන් වැඩිදියුණු වී ඇතිද සහ ජීවන තත්වය වැඩිදියුණු/ ප්‍රතිසාධනය වී ඇතිද යන්න ඇගයීම සඳහා සමාජ-ආර්ථික තත්වයන් පිළිබඳ පාදම් රේඛා තොරතුරු කළමනාකරණය
- ප්‍රගති වාර්තා සැකසීම; සහ ක්‍රියාත්මක කිරීමේ සංවිධාන තුළ මෙන්ම නියෝජිතායතනවලින් පිටත සම්බන්ධීකරණය කිරීම

## 12.2: අභ්‍යන්තර අධීක්ෂණය සඳහා අවශ්‍ය මෙවලම් පහත පරිදි වේ:

- ලේඛන සමාලෝචනය
- බලපෑමට ලක් වූවන් පිළිබඳ සමීක්ෂණ
- තොරතුරු දැන ගැනීම සඳහා වන මූලික සම්මුඛ සාකච්ඡා
- ගැඹුරින් සිදු කරන සිද්ධි අධ්‍යයනය
- ඉලක්ක කණ්ඩායම්වල රැස්වීම්
- මහජන, ප්‍රජා රැස්වීම හා
- නිරීක්ෂණ

## 12.3: බාහිර අධීක්ෂණය

අපේක්ෂිත අරමුණු ළඟා කර ගනු ලැබේද යන්න හා එසේ නොමැති නම් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර මොනවාද යන්න තීරණය කිරීම සඳහා වන ආරක්ෂිත පියවර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් බාහිර අධීක්ෂණ හා සමාලෝචන නියෝජිතායතනයක් යොදවනු ලැබේ. බාහිර අධීක්ෂණයේ අරමුණු දෙකක් වේ.

- ආරක්ෂාව පිළිබඳ වැඩසටහන අනුමත රාමුවට අනුව ක්‍රියාත්මක වන්නේ ද යන්න සත්‍යාපනය
- බලපෑමට ලක් වූවන්, පවුල් හා ප්‍රජාවන්ට සෘණාත්මක බලපෑම් සඳහා පිළියම් ලබා දීම සහ ඔවුන්ගේ ජීවනෝපායන් සහ ජීවන තත්වය වැඩි දියුණු වී ඇතිද හෝ අවම වශයෙන් ඒවා ප්‍රතිසාධනය කර ඇති දැයි තහවුරු කර ගැනීම

බාහිර අධීක්ෂණකයෙකු තෝරා ගැනීම සඳහා ලේඛන සකස් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ප්‍රසම්පාදන විශේෂඥයෙකුගේ සහාය ලබා ගනු ලැබේ. බාහිර අධීක්ෂණකයෙකු තෝරා ගැනීම සඳහා වන මිළ ගණන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් කැඳවනු ලබන අතර අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

## 12.4: බාහිර අධීක්ෂණය මගින් පහත දේ අපේක්ෂා කෙරේ:

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත සැලසුම් හා ක්‍රියාපාරිපාටිවලට අනුකූලව ක්‍රියාත්මක වන ලදැයි තහවුරු කර ගැනීම:

- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු ළඟා කරගෙන ඇති බව සැලකීම
- බලපෑමට ලක් වූවන්ගේ ජීවනෝපායන් හා ජීවන තත්වය ප්‍රතිසාධනය හෝ වැඩිදියුණු වී ඇතිද යන්න තීරණය කිරීම හා එසේ නොමැති නම් කාර්යසාධනය ඉහළ නැංවිය හැකි ආකාර යෝජනා කිරීම.
- තමන් වනත් ස්ථානයකට ගෙන යාම, හිමිකම් හා දුක්ගැනවිලි විසඳීමේ කමිටුවෙහි කාර්යසාධනය පිළිබඳ බලපෑමට ලක් වූවන්ගේ අදහස් ලබා ගැනීම

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ වෙනත් රාජ්‍ය ආයතන ඇතුළු සියළු ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායනවල කාර්යසාධනය ඇගයීම
- සියළු සමාජ සංවර්ධන ඉලක්ක ළඟා කරගෙන ඇත;
- අභ්‍යන්තර අධීක්ෂණ නියෝජිතායතන මගින් සියළු වාර්තා සමාලෝචනය කිරීම

බාහිර අධීක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කිරීමට පෙර පාදම් රේඛා සමීක්ෂණයක් පවත්වනු ලබන අතර එමගින් එකඟ වූ පරිදි කලින් කලට යාවත්කාලීන කිරීම් සිදු කෙරේ. බාහිර අධීක්ෂණයේ දී සිදු කෙරෙන සොයා ගැනීම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කරනු ලබන අතර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ දී සලකා බලනු ලැබේ. එවැනි උපදේශකයකුගේ සේවය ලබා ගැනීම සඳහා කාර්ය නිර්දේශයක් සැපයිය යුතුය.

අධීක්ෂණ පද්ධතියක් සැලසුම් කිරීමේ දී අධීක්ෂණ කාර්යභාරයන් හා වගකීම් සහ අධීක්ෂණය සම්බන්ධීකරණය සඳහා වන යාන්ත්‍රණයන් නිරූපණය කිරීම ද සිදු කෙරේ. අධීක්ෂණ පද්ධතිය මගින් අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණය සහ වාර්තාකරණය සඳහා විධිවිධාන සලසනු ලැබේ. ආරක්ෂාව පිළිබඳ වැඩසටහනෙහි ප්‍රගතිය පිළිබඳ සමාජ විගණනයන් බාහිර අධීක්ෂණයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සිදු කරනු ලැබේ.

**12.3:** අධීක්ෂණ දර්ශක

ව්‍යාපෘතිය සඳහා වන ප්‍රධාන අධීක්ෂණ දර්ශක පහත 12.1 වගුවෙන් දැක්වේ.

**12. 5 වගුව:** අධීක්ෂණ දර්ශක

| වර්ගය | දර්ශකය | විචල්‍යයන් සඳහා උදාහරණ |
|---|---|---|
| ක්‍රියාවලි ප්‍රගති | කාර්ය මණ්ඩල සම්පාදනය | නැවත පදිංචි කිරීමේ කාර්ය මණ්ඩලයේ සියල්ලන් සැලසුම් කළ ක්ෂේත්‍ර හා කාර්යාල වැඩ සඳහා පත් කිරීම හා රැස් කර තිබේද? ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු |

| | | |
|---|---|---|
| | | ලබන පුහුණු වැඩසටහන් සඳහා සිටින මිනින්දෝරු හා තක්සේරු නිලධාරීන්, නැවත පදිංචි කිරීමේ නිලධාරීන් සංඛ්‍යාව.<br>ස්ථාපිත කරන ලද ඒකක/ ක්ෂේත්‍ර කාර්යාල සංඛ්‍යාව |
| | අදහස් විමසීම | සැලසුම් කරන ලද පරිදි රැස්වීම්, කණ්ඩායම් හා ප්‍රජා ක්‍රියාකාරකම් ඇතුළු අදහස් විමසීම් සිදු කර තිබේද?<br>පාර්ශවකරුවන් සමග පැවති දැනුවත් කිරීමේ රැස්වීම් හා සහභාගී වූවන් සංඛ්‍යාව<br>බෙදාහරින ලද අත් පත්‍රිකා සංඛ්‍යාව<br>තමන්ගේ හිමිකම් පිළිබඳ බලපෑමට ලක් වූ පවුල් කොපමණ සංඛ්‍යාවක් දැනුවත් ද? |
| | සහභාගීත්වය | නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br>බෙදාහරින ලද නිවේදන පත්‍රිකා සංඛ්‍යාව<br>පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද?<br>නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වෙන කමිටු ස්ථාපිත කර තිබේද? |
| | දුක්ගැනවිලි විසඳීම | ස්ථාපිත කර ඇති දුක්ගැනවිලි විසඳීමේ කමිටු සංඛ්‍යාව<br>දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපාරිපාටි හා ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රියාපාරිපාටි පිළිබඳ බලපෑමට ලක් වූවන් කෙතරම් දැනුවත්ද?<br>යම් බලපෑමට ලක් වූවකු විසින් දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපාරිපාටි භාවිතා කර තිබේද? ලද ප්‍රතිඵල මොනවාද?<br>ගැටුම් නිරාකරණය කර තිබේද? ලැබුණු පැමිණිලි ගණන හා විසඳන ලද ගණන |
| තිරසාර දර්ශක | ඉඩම් අයිතිය | අයිතිය ලබා ගත රජයේ ඉඩම් වර්ගය හා ප්‍රමාණය<br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි කලට සියළු රජයේ ඉඩම් අයිතිය ලබා |

| | | |
|---|---|---|
| | | ගත්තේද? |
| | ඉදිකිරීම් | අත්පත් කරගත් පුද්ගලික ඉදිකිරීම් සංඛ්‍යාව, වර්ගය හා ප්‍රමාණය<br>අත්පත් කරගත් රජයේ ගොඩනැගිලි සංඛ්‍යාව, වර්ගය හා ප්‍රමාණය<br>අත්පත් කරගත් ප්‍රජා ගොඩනැගිලි සංඛ්‍යාව, වර්ගය හා ප්‍රමාණය |
| | | |
| | වන්දි හා පුනරුත්ථාපනය | නැවත පදිංචි කිරීමේ ක්‍රියාපාරිපාටි හා හිමිකම් පිළිබඳ බලපෑමට ලක් වූවන් කෙතරම් දැනුවත්ද?<br>බලපෑමට ලක් වූවන් සිය හිමිකම් පිළිබඳ දන්නේද?<br>හිමිකම් අනුකෘතියෙහි දක්වා ඇති හානි ප්‍රමාණයන් හා කාණ්ඩවලට අනුව බලපෑමට ලක් වූ සියල්ලන්ට හිමිකම් ලැබී තිබේද?<br>බලපෑමට ලක් වූවන්හට නිසි කලට වන්දි ලැබී තිබේද? (සැලසුමට අනුව)<br>නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි දැක්වෙන ප්‍රතිස්ථාපන විකල්පයන් ප්‍රකාරව බලපෑමට ලක් වූවන්හට නිවාස හිමි වී තිබේද?<br>ගෙවන ලද දීමනා වර්ගය, සංඛ්‍යාව හා මුළු ප්‍රමාණය<br>බලපෑමට ලක් වූ ව්‍යාපාර ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රමාණවත් සහායක් ලැබුණිද?<br>අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සඳහා ආදායම් ඉපයීමේ අවස්ථා සපයා තිබේද?<br>නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රජාව වෙත පහසුකම් සලසා තිබේද? උදා: ළමුන් සඳහා ක්‍රීඩා කිරීමට ස්ථානයක්, කාන්තාවන් සඳහා ප්‍රජා ශාලාවක් |
| මූලාශ්‍ර | පවුලේ ආදායම් ඉලයීමේ හැකියාව | බැංකු හා වෙනත් මූලාශ්‍ර වෙතින් ණය ලබා ගත් සංඛ්‍යාව<br>ආදායම් ප්‍රතිස්ථාපන වැඩසටහන මගින් සහාය |

| | | |
|---|---|---|
| | | ලබා දෙන ලද සංඛ්‍යාව<br>ව්‍යාපෘතිය මගින් රැකියා ලබා දෙන ලද සංඛ්‍යාව<br>පූර්ව ව්‍යාපෘති තත්වයට සාපේක්ෂව රැකියාව, නිෂ්පාදන හා සම්පත් භාවිතයේ රටාවෙහි ඇති වී තිබෙන වෙනස්කම් මොනවාද?<br>පූර්ව ව්‍යාපෘති තත්වයට සාපේක්ෂව ආදායම් හා වියදම් රටාවන්හි ඇති වී තිබෙන වෙනස්කම් මොනවාද?<br>බලපෑමට ලක් වූවන්ගේ ආදායම මෙම වෙනස්කම්වලට අනුකූලව පැවතියේද?<br>ජීවන තත්වයන්ට අදාළව ප්‍රධාන සමාජීය හා සංස්කෘතික පරාමිතීන්ගේ ඇති වී තිබෙන වෙනස්කම් මොනවාද?<br>අවදානමට ලක් විය හැකි පුද්ගලයන්ට අදාළව ඇති වී තිබෙන වෙනස්කම් මොනවාද? |
| | කාන්තාවන්ගේ තත්වයෙහි වෙනස්කම් | ප්‍රජා පාදක ක්‍රියාකාරකම් වලට සහභාගී වීම<br>රැකියාව අහිමි වීම<br>ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ගැටළුවලට අදාළව පහසුකම් සැලසීම/ සවිබල ගැන්වීම<br>ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට සහභාගී වීම |
| | ළමුන්ගේ තත්වයෙහි වෙනස්කම් | ගැහැණු හා පිරිමි ළමුන්ගේ පාසල් පැමිණීමේ වෙනස්කම්<br>පාසල් පැමිණෙන ගැහැණු හා පිරිමි ළමුන්ගේ සංඛ්‍යාව<br>අධ්‍යාපන මට්ටම්වල වර්ධනය |
| | නව වාසස්ථාන හා ජනගහනය | සත්කාරක ජනතාව සමග ගැටීමක් ඇති වීද?<br>සහාධිපත්‍ය කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර තිබේද?<br>නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වන අනෙකුත් කමිටු ස්ථාපිත කර තිබේද?<br>නව පදිංචිකරුවන් විසින් ක්‍රමානුකූලව සහාධිපත්‍ය කළමනාකරණ ගාස්තු ගෙවා |

| | | |
|---|---|---|
| | | තිබේද?<br>පවුල් කොපමණ සංඛ්‍යාවක් පොදු පහසුකම් සැපයීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත මාසික ගාස්තු ක්‍රමානුකූලව පියවා නැතිද?<br>බෝවන රෝගවල වර්ධනයක් ඇති වී තිබේද?<br>වෙනත් ස්ථානයකට ගෙන යාමෙන් පසු පාසල් යාම නැවැත්වූවන් සිටියිද ? |

## 12.6 ඇගයුම් සැලැස්ම

ඔබේසේකරපුර අවතැන් වූ පවුල් සඳහා අපේක්ෂිත නැවත පදිංචි කිරීමේ අරමුණු යෝග්‍ය වූයේද සහ ඒවා ළඟා කරගෙන තිබේද යන්න පිළිබඳ ඇගයීම සඳහා ක්‍රියාත්මක කිරීමේ දී හා ඉන් පසුව ඇගයීම සිදු කරනු ලැබේ. ඔබේසේකරපුර බලපෑමට ලක් වූ පවුල්වල ආදායම ප්‍රතිසාධනය සහ ඉහළ නංවා තිබේ ද යන්න පිළිබඳව ද මෙහි දී සලකා බැලේ. මෙම ඇගයීම මගින් කාර්යක්ෂමතාව, ඵලදායී බව, බලපෑම හා යෝග්‍යතාව මැන බැලෙන අතර එමගින් අනාගත නැවත පදිංචි කිරීමේ සැලසුම් කෙරෙහි ආභාසයක් ලබා ගනු ලැබේ.

ඇගයීමෙහි පුළුල් විෂය පථය, ඒ සඳහා ගත වන කාලය අඩු වීම සහ ස්වාධීන විශේෂඥයන් සම්බන්ධ වීම යන කරුණු හේතුවෙන් ඇගයීම අධීක්ෂණයෙන් වෙනස් වේ.

ඇගයීම පහත අරමුණු මත පදනම් වේ:

- කාර්යක්ෂමතාව; නිමැවුම් සඳහා සම්පත් සකසුරුවම් අයුරින් යොදා ගැනීම.
- ඵලදායීතාව; අරමුණු කෙතරම් දුරට ළඟා කරගෙන ඇති ද යන වග.
- බලපෑම; ධනාත්මක/ සෘණාත්මක, ව්‍යාපෘතියට අදාළ සැලසුම් කරන ලද හෝ සැලසුම් නොකරන ලද ප්‍රතිඵල; දේශීය හා ජාතික සංවර්ධන ප්‍රමුඛතාවලට අදාළව කෙතරම් දුරට ව්‍යාපෘතිය සාධාරණීකරණය කළ හැකිද යන වග.
- ඇගයීමේ දී අදාළත්වය පිළිබඳ සලකා බලනු ලැබේ;

ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසුව (බාහිර අරමුදල් සැපයීම) එහි ධනාත්මක බලපෑම් මගින් බලපෑමට ලක් වූවන් වෙත අඛණ්ඩව ප්‍රතිලාභ ලැබෙන්නේ ද යන්න පිළිබඳ සලකා බැලේ.

ඇගයීම සිදු කරනු ලබන්නේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් තෝරා ගත් බාහිර නියෝජිතායතනයක් මගින් විවෘත තරඟකාරී ක්‍රියාවලියක් හරහාය වන අතර එමගින් ව්‍යාපෘතියේ සියළු අංග ආවරණය කරනු ලැබේ. බාහිර ඇගයීම සහභාගීත්ව ඇගයීමක් වනු ඇත. එනම් සියළු පාර්ශවකරුවන්ගෙන්, විශේෂයෙන් බලපෑමට ලක් වූවන්ගෙන් ලබා ගන්නා අදහස් හා සොයාගැනීම් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සඳහා යොදා ගනු ලැබෙන බැවින් අධීක්ෂණය හා ඇගයීම සඳහා බලපෑමට ලක් වූවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිගන්වනු ලැබේ.

## 12.7 වාර්තාකරණයේ අවශ්‍යතා

අධීක්ෂණයේ ප්‍රධාන ප්‍රතිපලය පහත දේ ඇතුළත් වාර්තාවලින් සමන්විත වේ:

- කලින් කලට ලබා දෙන වාර්තා (මාසික; අභ්‍යන්තර, හා වාර්ෂික);
- තත්කාර්ය වාර්තා, විශේෂයෙන් කළමනාකාරීත්වයේ ඉල්ලීම මත නිශ්චිත විෂයක් පිළිබඳ; හා
- අවිධිමත් කළමනාකරණ සමාලෝචන සැසිවාර සඳහා අභ්‍යන්තර සටහන් හෝ වාචික ඉදිරිපත් කිරීම්.

ලැබුණු තොරතුරු කලින් වාර්තා සමග පහසුවෙන් සැසඳීමට හැකි වන පරිදි වාර්තා ප්‍රමිත කිරීම සිදු කෙරේ. මෙම වාර්තාවල ව්‍යතිරේඛයන් හා සැලසුම්වලින් බැහැර වීම් අවධාරණය කෙරේ.

## 12.8 වාර්තාකරණයේ වගකීම්

බලපෑමට ලක් වූවන් වෙත වාර්තා කිරීම වගවීමේ කටයුතුවල ප්‍රධාන අංගයක් වේ. මෙම මට්ටමේ දී වාර්තාකරණ යාන්ත්‍රණ සරළ හා සියළු දෙනාට ප්‍රවේශය සහිත වේ. සාරාංශගත කිරීමේ ලේඛන හා වෙනත් දෑ ආරක්ෂිත ක්‍රියාමාර්ගවලට අදාළ දැන්වීම් හා පුද්ගලයන් හා පවුල් අතර බෙදා හැරීමට හැකි අත් පත්‍රිකාවලින් වාර්තාකරණය සමන්විත වේ. ව්‍යාපෘතියේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් ද වාර්තාකරණ යාන්ත්‍රණයෙන් සමන්විත වේ.

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, මෙහෙයුම් කමිටුව හා පාර්ශවකරුවන්ගේ සංසදය වෙත වාර්තා කිරීම
- අධීක්ෂණ හා ඇගයුම් අංශය විසින් ව්‍යාපාති අධ්‍යක්ෂ වෙත වාර්තා කරනු ලබන අතර ඔහු විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත මාසිකව වාර්තා කරනු ලැබේ.

## 12.9 වාර්තා කරනු ලබන කරුණු:

වාර්තාකරණයේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ:

- නිශ්චිත කාණ්ඩ අනුව බලපෑමට ලක් වූවන් සංඛ්‍යාව
- කඩා ඉවත් කෙරෙන ගොඩනැගිලි/ ඉදිකිරීම් සංඛ්‍යාව
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සහාය ලබා දෙනු ලබන අවදානමට ලක් විය හැකි කණ්ඩායම් සංඛ්‍යාව (කාණ්ඩ අනුව)
- බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ වාර්තා වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ගැටළු/ ප්‍රායෝගික ගැටළු සංඛ්‍යාව
- බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ විසඳන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ගැටළු/ ප්‍රායෝගික ගැටළු සංඛ්‍යාව
- සෞඛ්‍ය බලධාරීන් වෙත වාර්තා වූ ලිංගිකව බෝවන රෝග සංඛ්‍යාව
- පොලිසිය වෙත වාර්තා වූ අපරාධ සංඛ්‍යාව
- ආදායම් හා ජීවනෝපාය ප්‍රතිසාධන සහාය අවශ්‍ය පවුල් සංඛ්‍යාව
- ආදායම් ප්‍රතිස්ථාපන වැඩසටහන යටතේ සහාය ලබා දෙන පවුල් සංඛ්‍යාව - පුහුණුව, ස්වයං රැකියා, ව්‍යාපෘතියට සම්බන්ධ වීම ආදිය
- පවත්වන ලද දුක්ගැනවිලි විසඳීමේ කමිටු රැස්වීම් සංඛ්‍යාව
- දුක්ගැනවිලි විසඳීමේ කමිටුව වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව
- දුක්ගැනවිලි විසඳීමේ කමිටුව විසින් විසඳන ලද දුක්ගැනවිලි සංඛ්‍යා හා දින

| අංකය | ගොනු අංකය | ආදායම් ප්‍රභවය | මාසික ආදායම | බලපෑමට ලක්වූ මාසික ආදායම | ආදායම් අහිමිවීම **(90000.00)** | ආදායම් ප්‍රතිසාධනය **(50000.00)** සහ / හෝ අවකාශය | අනාරක්ෂිත **(50000.00)** | අදහස් |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 10 | ග්‍රෝසරිය | 35000.00 | 20000.00 | 120000.00 | 50000.00 | නැත | Replacement shop has been provided. |
| 02 | 24 | වෙල්ඩින් ෂොප් | 50000.00 | 15000.00 | 90000.00 | 50000.00 | නැත | වෙල්ඩින් වැඩමුළුව සඳහා අවකාශ ලබා දී ඇත. |
| 03 | 15 | කම්කරුවා | 25000.00 | කිසිවෙක් නැත | නැත | නැත | ඔව්, 50000.00 | මානසික පීඩනයෙන් පීඩා විඳින ඔහුගේ දියණියට විශේෂ සත්කාර අවශය |
| 04 | 23 | රැකියා විරහිත | 25000.00 | කිසිවෙක් නැත | නැත | නැත | ඔව් , 50000.00 | ආබාධිත පුද්ගලයකි. විශේෂ ආදායම් ප්‍රභවයක් අවශ්‍යය. |
| 05 | 36 | - | N/A | කිසිවෙක් නැත | නැත | නැත | ඔව් , 50000.00 | මසකට රු. 5000.00 ට අඩු ආදායම් ලබන |
| 06 | 12 | ස්වයං රැකියා - බුලත් විට විකිණීම | 15000.00 | 15000.00 | 90000.00 | නැත | ඔව් , 50000.00 | සැමියාගෙන් වෙන්ව ජීවත්වන සහ පුතුන්ගේ සමඟ ජීවත්වන පියා |
| 07 | 14 | ස්වයං රැකියා – තැඹිලි විකිණීම | N/A | 10000.00 | 90000.00 | 50000.00 හෝ අවකාශය | නැත | නා.සං.අධිකාරිය වෙතින් රු. 50000 හෝ තැඹිලි ගබඩා කිරීමට අවකාශයක් ලබාදීම |
| 08 | 18 | ස්වයං රැකියා – අතරු කෑම විකිණීම | 25000.00 | 15000.00 | 90000.00 | 50000.00 හෝ අවකාශය | නැත | නා.සං.අධිකාරිය වෙතින් රු. 50000 හෝ ආහාර කරත්තය නවතා තැබිමට ස්ථානයක් ලබාදීම |
| 09 | 33 | ස්වයං රැකියා – අයිස්ක්‍රීම් විකිණීම | 25000.00 | 10000.00 | 90000.00 | 50000.00 | නැත | ව්‍යාපෘතියෙන් පලපෑමට ලක් වූ නිවාස ඒකක දිරිමත් කිරීම පිණිස ජංගම කරත්තයක් මිලදී ගැනීම සහ අයිස් ක්‍රීම් සෑදීමට පුහුණුවක් ලබාදීම |
| 10 | 09 | ස්වයං රැකියා – ආප්ප විකිණීම | 30000.00 | 5000.00 | 90000.00 | 50000.00 or space | නැත | නා.සං.අධිකාරිය වෙතින් රු. 50000 හෝ ආප්ප විකිණීම සඳහා ස්ථානයක් ලබාදීම |
| 11 | 04 | විදේශ ගෘහ සහායක | N/A | N/A | නැත | නැත | ඔව් , 50000.00 | වෙන්වූ සහ ආච්චි සමඟ ජීවත්වන දරුවන් |
| 12 | 06 | රැකියා විරහිත | N/A | N/A | නැත | නැත | ඔව් , 50000.00 | කාන්තා ගෘහ මූලික පවුල් |
| 13 | 01 | විදේශ ගෘහ සහායක | N/A | N/A | නැත | නැත | ඔව් , 50000.00 | ආච්චි සමඟ ජීවත්වන දරුවන් සහ පියා වෙන් වූ |
| 14 | 02 | විදේශ | N/A | N/A | නැත | නැත | ඔව් , | පියා සමඟ ජීවත්වන දරුවන්, |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ගෘහ සහායක | | | | | 50000.00 | පෙදරේරුවෙක්. පියා සහ එක් පුතෙක් නුගත්. පුතෙකු අසනීප තත්ත්වයෙන් පෙළෙනවා. විශේෂ අධ්‍යාපනයක් අවශ්‍යයි. |